නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ



# ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට සීමාවක් නැත

## එක්ව ගමන යමු



**ප්‍රිය මිතුරනි,**

ආයුබෝවන්!

ඔබ සැමට පණිවුඩයක් එවීමට මා මෙම අවස්ථාව භාවිතා කරනවා. එය ඔබ, ඔබේ පවුල, ඔබට සමීප හා ආදරණීය සැම වෙත පණිවුඩයක්. ඔබ මෙරට ජීවත් වෙමින් සේවය කරන අයෙකු වුණාත්, විදේශයක සේවය කරන අයෙකු වුණාත්, විදේශයක පදිංචි, යළි මව්රට එන්නට කැමති අයෙකු වුණාත්, මේ පණිවුඩය ඔබ සැමටයි.

ඔබට බොහෝ ප්‍රශ්න සහ බලාපොරොත්තු ඇති බවත්, ඒවායින් බොහොමයකට තවමත් පිළිතුරු ලබා දී නැති බවත්, ලබා දුන් ඇතැම් පිළිතුරු සම්පූර්ණ නැති බවත් මා දන්නවා. ඔබට තිබෙන සෑම ගැටලුවක් ම, බලාපොරොත්තුවක් ම සම්බන්ධයෙන් සේවය කරන්නට මා කැප වී සිටිනවා. ඒ වෙනුවෙන් මා විවිධ දැක්මවල් ඇති, විවිධ වෘත්තීන්හි නියැලි, රටේ විවිධ ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයන් හමු වී තිබෙනවා. මා විසින් ඒකරාශී කරන ලද විශේෂඥ කණ්ඩායම් සමග මා මාස ගණනක් සංවාදයේ යෙදුණා. ඔවුන් දිගට ම මට මග පෙන්වීම කරනවා. ඒ අනුව යමින් මා දැක්මක්, දූත මෙහෙවරක්, අරමුණක් සහ මූලෝපායික මුලපිරුම් සහ කාලය සමග බැඳුණු ක්‍රියාකාරී සැලසුම් ගොඩනගාගෙන තිබෙනවා. මගේ හදවත හා මනස යොදවා, මා සමග එක්ව, මේ රට ඉහළට, ඉදිරියට, අනාගතයට ධාවනය කළ හැකි දක්ෂ පුද්ගලයන් මා හඳුනාගෙන තිබෙනවා.

කාල රාමුවක් තුළ ප්‍රතිඵල අත්කරගැනීමේ අනුරාගය සහ ශක්තියත්, කැපවීම හා අධිෂ්ඨානයත් මා සතුව ඇති බව මා විශ්වාස කරනවා. මා මිනිසුන් සමග යමින් ඔවුන් සමග වැඩ කර තිබෙනවා. මට ඔවුන්ගේ නාඩි වැටෙන හැටි දැනුණා. ගැමි ඡන්දදායකයන්ට මා සේවය කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස, දශක දෙකක කාලයක් තිස්සේ මා පාර්ලිමේන්තු පටිපාටි අනුගමනය කරමින් ඒවා ආරක්ෂා ද කළා. මගේ ඡන්දදායකයන්ට ගරු කළා. රජයේ පරිපාලන හා මූල්‍ය පටිපාටියට අනුගත වුණා. ඒ අතර ම, හැම විට ම, ඉහළ ම මට්ටමේ සුපිළිපන්බවක් රැකගත්තා.

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, නියෝජ්‍ය ඇමතිවරයකු හා ඇමතිවරයකු ලෙස සේවය කළ මනා කාර්යසාධන වාර්තාවක් මට ඇති බව ඔබට කියන්නට මා කැමතියි. මා රජයේ මෙන් ම විපක්ෂයේ ද සිටියා. මා හැමදාමත් මහජනයා නියෝජනය කළා. මගේ රටට පක්ෂපාතීව කැප වුණා. මගේ පක්ෂය වෙනුවෙන් ඇපකැප වුණා. ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ රජයේ නිලධාරීන් සමග වැඩ කළා. පෞද්ගලික අංශය සමග සම්බන්ධ වුණා. ජාත්‍යන්තර ප්‍රජාව සමග සාකච්ඡා කළා. ඒ හැම විට ම, අපේ දේශයේ ඒකීයභාවය ආරක්ෂා කළා. අන්තර් ආගමික සහ අන්තර් වාර්ගික සමගියට පැහැදිලිව ම කැප වුණා.

එක්ව ඉදිරියට

මා ද ත්‍රස්තවාදයේ වින්දිතයෙක්. ත්‍රස්තවාදය හා අන්තවාදය කිසි සේත් ම නොඉවසන ප්‍රතිපත්තියක් මවිසින් අනුගමනය කරනු ඇති බව මා මේ රටේ සෑම පුරවැසියකුට ම සපථ කරනවා. පරිපූර්ණ ක්‍රියාකාරී සැලැස්මක් සහිතව ජාතික ආරක්ෂාව හැසිරවීමට මා හොඳම පුද්ගලයන් පත් කරනවා. දේශපාලන බාධකවලින් තොරව නීති ක්‍රියාත්මක කිරීමෙන් රටේ සියලු පුරවැසියන් ආරක්ෂා කිරීමට ඔවුන්ට බලය පැවරෙනවා.

මා දූෂණයට එරෙහි අරගලයට නායකත්වය සපයන්නේ ආදර්ශයෙනුයි. දූෂණ චෝදනා ඇති, අයහපත් අතීතයක් ඇති පුද්ගලයන්ට මගේ නායකත්වය යටතේ ඇති රජයක ඉඩ ලැබෙන්නේ නැහැ. රාජ්‍ය පාලන ව්‍යුහයේ සෑම සාමාජිකයෙකු ම මේ රටේ බදුගෙවන ජනතාවට වගකිව යුතුයි. දූෂණය සහ ඥාති සංග්‍රහය මුලිනුපුටා දැමීමට මා කැපවෙනවා. ඒ ප්‍රයත්නය වෙනුවෙන් ඔබේ සහයෝගය මා ඔබෙන් අයැද සිටිනවා.

ආර්ථික වශයෙන් ශක්තිමත්, වර්ධනය දෙසට යොමු වූ, තාක්ෂණික වශයෙන් උසස් ශ්‍රී ලංකාවක් වෙනුවෙන් මා පෙනී සිටිනවා. එය සමාජමය වශයෙන් සවිඥානක, දේශපාලනික වශයෙන් ස්ථාවර දේශයක්. සමාජ සාධාරණත්වය සහ සැමදෙනාට ම අයත් සංවර්ධනයක් ඔස්සේ මා මගේ රට සෞභාග්‍යය වෙත මෙහෙයවනවා.

කිසිවෙකු අත්නොහරින සැබැවින් ම ප්‍රගතිශීලී රටක් ගොඩනැගීම සඳහා මා සමග අත්වැල් බැඳගන්නට මා ඔබට ආරාධනා කරනවා.

ඔබ සැමට ජය වේවා!

**සජිත් ප්‍රේමදාස**



# ශක්තිමත් දේශයක්, සාධාරණ සමාජයක්

# විශේෂ කරුණු

1. **දරාගත හැකි මිල ගණන් සහ ඉහළ ගුණාත්මක ජීවිතයක්:** නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යාරක්ෂාව, ප්‍රවාහනය සහ විදුලි සංදේශනය කාටත් දරාගත හැකි අන්දමින්. ඉහළ ගුණාත්මක පෞද්ගලික අංශයේ රැකියා ඔස්සේ ඉහළ වැටුප්.

2. **සැමට සෙවණ:** 2025 වසර වන විට නිවාස හිමි සමාජයක්. ඉඩම් බලපත්‍රලාභීන්ට ඉඩම් හිමිකම.

3. **සැමට විශ්වීය පෙර පාසල් අධ්‍යාපනයක්:** නිදහස් අධ්‍යාපනය පෙර පාසල දක්වා පුළුල් කෙරේ.

4. **විශ්වීය විශ්වවිද්‍යාල අධ්‍යාපනයක්:** පාසලින් පිට වන සෑම පුද්ගලයෙකුට ම විශ්වවිද්‍යාල උපාධියකට, වෘත්තිය සුදුසුකමකට හෝ වෘත්තීය පුහුණුවකට අවස්ථා

5. **විශ්වීය සෞඛ්‍යාරක්ෂාවක්:** නොමිලේ බෙහෙත්, නිදහස් වෛද්‍ය පරීක්ෂණ සහ සත්කාර, සැඟවුණු ගාස්තු රහිතව. වයස අවුරුදු 35ට වැඩි සැමට නොමිලේ වෛද්‍ය පරීක්ෂාවක්. ගර්භණී මව්වරුන්ට තවත් සහන.

6. **වගකියන නායකත්වයක්:** දූෂණයෙන් හා බැඳියා පිළිබඳ ගැටුම් නැති ඇමති මණ්ඩලයක්. ඥාති සංග්‍රහයට තිත. නෑදෑයින්ට රජයේ පත්වීම් නැහැ.

7. **මත්ද්‍රව්‍ය සහ දූෂණ නොඉවසන ප්‍රතිපත්තියක්:** ඉක්මණින් නීතිමය ක්‍රියාමාර්ග. දණ්ඩනයට ලක් කළ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට සමාවක් හෝ දඬුවම් අඩුකිරීමක් නැහැ.

8. **ආගමික අන්තවාදය සහ ප්‍රචණ්ඩත්වය නොඉවසන ප්‍රතිපත්තියක්:** නිවසේදීත්, ආගමික ස්ථානයේදීත් සැමට ම බියෙන් තොර ජීවිතයක්.

9. **ශක්තිමත් සහ සුහුරු ජාතික ආරක්ෂක මූලෝපායක්:** ජාතික ආරක්ෂාව නීතියෙන් තහවුරු කර, නිසි පුද්ගලයන් නිසි වගකීම්වලට.

10. **රාජ්‍ය අංශයට ගරුත්වය:** ජාත්‍යන්තර අත්දැකීම් ලැබීම සඳහා රජයේ සේවයට ශිෂ්‍යත්ව. රාජකාරී වගකීම තුළ ගත් ක්‍රියාමාර්ගවල ගැටලුවලදී නීති සහාය.

11. **ජනතාවගේ රජයක්:** ලේඛන, අවසරපත්‍ර හා බලපත්‍ර අන්තර්ජාලයෙන්.

12. **මූල්‍ය වෙළඳපොළ:** නව ජාතික සංවර්ධන බැංකුවක්. වරාය නගරයට ආයෝජකයන් ආකර්ශනය කරගැනීම සඳහා තරගකාරී බදු ව්‍යුහයක්.

13. **කාන්තාවන් දිරිගැන්වීම:** කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවේ. පළාත් සභාවලට, පාර්ලිමේන්තුවට සහ ජාතික ලැයිස්තුවටත් කාන්තාවන් වෙනුවෙන් සියයට 25ක කෝටාවක්. කාන්තාවන්ට සුරක්ෂිත පොදු ප්‍රවාහනයක්.

14. **කුඩා ව්‍යවසාය බලසතු කිරීම:** මාසික වෙළඳාම රු. මිලියන හතරට අඩු සියලු ව්‍යාපාර **VAT** බද්දෙන් නිදහස්.

15. **ගොවීන් බලසතු කිරීම:** ගොවි සමුපකාර හරහා ගොවීන්ට නොමිලේ බිත්තර වී සහ පොහොර.

16. **පරිසරය සහ බලශක්තිය:** අලි-මිනිස් ගැටුමට සහ කසල කළමනාකරණයට පාරිසරික වශයෙන් පිළිගත හැකි ප්‍රජා කේන්ද්‍රීය විසඳුම්. 2040 වසර වන විට සියයට සියයක් ම පුනර්ජනනීය බලශක්ති වෙත නැඹුරුවීමට සැලසුම්.

17. **ව්‍යවසායකත්වය සහ නවෝත්පාදනය දිරිගැන්වීම:** රු. බිලියන 10ක ජාතික අවදානම් ව්‍යවසාය ප්‍රාග්ධන අරමුදලක්. රු. බිලියන 10ක ජාතික නවෝත්පාදන අරමුදලක්.

18. **වෙළඳපොළට සූදානම් තරුණ ජනගහනයක්:** තරුණයන්ගේ සන්නිවේදනය, භාෂාව, තාක්ෂණය සහ මෘදු කුසලතා වර්ධනය කිරීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ම 'විශිෂ්ටතා මධ්‍යස්ථාන'.

19. **සංක්‍රමණික ශ්‍රමිකයන් ඇගයීම:** තානාපති කාර්යාලවලින් සහන නිවාස ණය, වැඩි කළ තීරු බදු දීමනා සහ නීති ආධාර ලබාගැනීමේ පහසුව.

20. **පොදු ප්‍රවාහනය:** බස් නවීකරණය, දුම්රිය විද්‍යුත්කරණය, සැහැල්ලු දුම්රිය පද්ධතියක් සහ සුහුරු වාහන කළමනාකරණ පද්ධතියක් සමග බහුවිධ පොදු ප්‍රවාහන ප්‍රතිපත්තියක්.

**ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට සීමාවක් නැත**
එක්ව ගමන යමු.

# මත්ද්‍රව්‍ය, දූෂණය සහ ආගමික අන්තවාදයට එරෙහි දැඩි ප්‍රතිපත්තියක්

**ත්‍රස්ත බලමුළු පැරදවීමෙන් පසු ශ්‍රී ලංකාව හමුවේ දැන් මහා උවදුරු තුනක් තිබේ. ඒවා නම්, මත්ද්‍රව්‍ය, දූෂණය සහ ආගමික අන්තවාදයයි. මේ ප්‍රශ්න තුනට ම එක් විසඳුමක් තිබේ. එනම්, වේගවත් සහ නියත යුක්තියයි. භීතියෙන් හෝ පක්ෂපාතිත්වයෙන් තොරව නීතියේ පාලනය ක්‍රියාත්මක විය යුතු ය.**

අපි මත්ද්‍රව්‍ය, දූෂණය සහ ආගමික අන්තවාදය සම්බන්ධ නඩු කඩිනමින් අවසන් කරන්නට ක්‍රියා කරන්නෙමු.
විමර්ශකයන්ට, නඩු පවරන්නන්ට හා විනිසුරුවරුන්ට සම්පූර්ණයෙන් ම ස්වාධීනව තම කාර්යයන් ඉටුකිරීමට තිබිය යුතු නිදහස අපි තහවුරු කරන්නෙමු.
වැරදිකරුවන් අධිකරණය හමුවට ගෙන ඒමට අවශ්‍ය සියලු පහසුකම් සපයන්නෙමු.

# මත්ද්‍රව්‍යවලට එරෙහි යුද්ධය

- අපි විශේෂ මත්ද්‍රව්‍ය විරෝධී අධිකරණයක් සහ විශේෂ මත්ද්‍රව්‍ය විරෝධී අභිචෝදක ව්‍යුහයක් පිහිටුවන්නෙමු. එසේම, පොලිස් මත්ද්‍රව්‍ය විරෝධී අංශය ශක්තිමත් කරන්නෙමු. ජාත්‍යන්තර ප්‍රමිති අනුව පොලිස් විමර්ශන නිලධාරීන් පුහුණු කරනු ලැබේ. අපි ඔවුන්ට යෝග්‍ය මෙවලම් ලබා දෙන්නෙමු. මත්ද්‍රව්‍ය උවදුරු මුලිනුපුටා දැමීමට අපි ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රිකයන් සමග සහයෝගයෙන් කටයුතු කරන්නෙමු.

- මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට දඬුවම් දැඩි වනු ඇත. මත්ද්‍රව්‍ය වෙළඳාමේ නියැලෙන අයට එරෙහිව ජීවිතාන්තය දක්වා සමා විරහිත දණ්ඩනයන් පැනවෙනු ඇත. මහා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හුදකලා සිරගත කිරීමට ලක් වනු ඇත. ඇබ්බැහි වීම වරදක් නොව, රෝගී තත්වයක් ලෙස සලකා, මතට ඇබ්බැහි වූවන් සහ ජාවාරම්කරුවන් වෙන්කොට හඳුනාගැනීමට හැකි වන පරිදි නීති සංශෝධනය කරනු ලැබේ. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් වෙනුවෙන් දැනට තිබෙන පුනරුත්ථාපන මධ්‍යස්ථාන ගණන 4 සිට 12 දක්වා තුන්ගුණයකින් වැඩි කරනු ලැබේ. එමගින් ඔවුන්ට ප්‍රතිකාර කිරීම, ජීවන කුසලතා ඉගැන්වීම සහ පවුල් වෙත ආපසු යාමේ හැකියාව ලබාදීම සිදු වේ. ඇබ්බැහි වූවන්, ජාවාරම්කරුවන් සමග සිරගත කිරීම නතර කරනු ලැබේ. ඇබ්බැහි වූවන් දරුණු අපරාධකරුවන් බවට පත් වන්නේ එමගිනි.

- නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය වැළැක්වීම පිණිස සියලු එතනෝල් ආනයන බලපත්‍ර ස්වාධීන කොමිසමක් විසින් නැවත විවරණය කරනු ලැබේ.

- ජාත්‍යන්තර බුද්ධි හා මත්ද්‍රව්‍ය විරෝධී නියෝජිතායතන සමග සමීපව සම්බන්ධීකරණය වෙමින් ශ්‍රී ලංකාවට මත්ද්‍රව්‍ය ගලා ඒම නතර කරනු ලැබේ.

# දූෂණයට එරෙහි යුද්ධය

- දූෂණයට එරෙහි යුද්ධය ආරම්භ වන්නේ තම පාර්ශවයෙනි. අපි අපගේ ආණ්ඩුවේ හෝ පක්ෂයේ කිසිදු දූෂිත සාමාජිකයකු ආරක්ෂා කරන්නේ නැත. දූෂණයට සම්බන්ධ ඕනෑම අයෙකුට එරෙහිව විමර්ශනය කිරීමට හා නඩු පැවරීමට පොලිසිය හා අධිකරණයට නිදහස සැපයේ. මහජන විශ්වාසය හා සම්බන්ධ තනතුරුවල සිටින අය සම්බන්ධයෙන් අපි විශේෂයෙන් අවදියෙන් සිටින්නෙමු කිසිවෙකු නීතියට ඉහළින් යන්නේ නැත. ඉහළ ම තනතුරු හොබවන අය පවා වගවන බව තහවුරු කරන නව දේශපාලන සංස්කෘතියක් අපි නිර්මාණය කරන්නෙමු. මෙරට නායකයන් වනු ඇත්තේ ඉහළ ආචාරධාර්මික ප්‍රමිතියක් ඇති සුපිළිපන් පුද්ගලයෝ ය.

- ඇතැම් අවස්ථාවලදී වරදක් ලෙස සැලකෙන්නේ අල්ලස් ගැනීම පමණි. පුද්ගලයන්ට, සමාගම්වලට සහ වෙනත් ව්‍යුහයන්ට අල්ලස් පිරිනැමීම බරපතල අපරාධයක් ලෙස සැලකෙන නීති අප විසින් හඳුන්වා දෙනු ලැබේ. මුදල් විශුද්ධිකරණය අල්ලස් පනත යටතේ වරදක් බවට පත් කරනු ඇත.

- අල්ලස් කොමිසම යටතේ වත්කම් ප්‍රකාශ කිරීමේ මධ්‍යම දත්ත පද්ධතියක් පිහිටුවනු ලැබේ. එමගින් මනා තහවුරු කිරීමේ ක්‍රමවේදයක් සකසනු ලැබේ. අල්ලස් කොමිසම ස්වාධීන, ඉහළ පුහුණුවක් සහිත විමර්ශන නිලධාරීන්ගෙන් ශක්තිමත් කරනු ලැබේ. රාජ්‍ය සේවා සහ ගෙවීම් ඩිජිටල්කරණය කර දූෂණය සඳහා අවස්ථා අවම කරනු ලැබේ.

- පොදු ව්‍යාපාර කාරක සභාව (COPE) සහ රාජ්‍ය ගිනුම් කාරක සභාව (COPA) තුළ ප්‍රසම්පාදන අනු කමිටු පිහිටුවනු ලැබේ. මෙම අනුකමිටු සහ ප්‍රසම්පාදන කොමිසම ඉහළ පුහුණුවක් සහිත විගණන නිලධාරීන්ගෙන්, ව්‍යවහාරික ගණකාධිකාරිවරුන්ගෙන් සහ වෙනත් අවශ්‍ය වෘත්තිකයන්ගෙන් සමන්විත වේ. එමගින් සියලු රාජ්‍ය ප්‍රසම්පාදන අඛණ්ඩව අධීක්ෂණය සහ විවරණය කරනු ලැබේ.

# ආගමික අන්තවාදයට එරෙහි යුද්ධය

- අපි ප්‍රජාතාන්ත්‍රික සහ බහුත්වවාදී සමාජයක් ගොඩනගන්නෙමු. එහි සියලු ජනතාවන්ට ආරක්ෂාව සැපයේ. සියලු ආගමික විශ්වාසයන්ට ගරු කරනු ලැබේ. ආගමික අන්තවාදයට එරෙහි යුද්ධය ක්‍රියාත්මක වන පදනම මෙයයි.

- ආගමික අන්තවාදය නිරීක්ෂණය කරන, විමර්ශනය කරන සහ අවශ්‍ය තැනදී එයට එරෙහිව නඩු පවරනු ලබන නව නීති හා රෙගුලාසි අප විසින් හඳුන්වා දෙනු ලැබේ. මෙම නීති විසින් වෛරී ප්‍රකාශ සහ දුස්තොරතුරුවලට එරෙහිව දැඩි දඬුවම් පමුණුවනු ලැබේ. මානව හිමිකම් කොමිසමේ මාර්ගෝපදේශවලට යටත්ව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනත පූර්ණ හා සාධාරණ අන්දමින් ක්‍රියාත්මක කරනු ඇත. ආගමික සහ වාර්ගික සමගිය පිළිබඳ 'දියවන්නා ප්‍රකාශය' සංහිඳියා පනත යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. එමගින්, පිළිගත් ආගමික නායකයන්ගෙන් සමන්විත සංහිඳියා සභාවක් ද පිහිටුවනු ලැබේ.

- ගරුතර මහා සංඝ රත්නයේ, හින්දු, ඉස්ලාම්, කතෝලික සහ ක්‍රිස්තියානි ආගමික නායකයන්ගේ, ප්‍රජාවන්ගේ සහ සිවිල් සමාජයේ උපදෙස් මත සමාජ ඒකාබද්ධතාව සඳහා ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කරනු ලැබේ. එම ප්‍රතිපත්තිය මහජනතාව දැනුවත් කිරීමට හා පාසල් විෂය මාලාව සංශෝධනයට යොදා ගනු ලැබේ.



# ශක්තිමත් දේශයක් තහවුරු කිරීම

ශක්තිමත් සහ මැනෙවින් ආරක්ෂිත දේශයක් සඳහා නිසි නායකත්වයක් අවශ්‍ය ය. අපගේ ආරක්ෂක ප්‍රතිපත්තිය බුද්ධිමත්, නම්‍යශීලී සහ දූරදර්ශී එකකි. ජාතියට ඇති වන තර්ජන කල් තබා හඳුනාගෙන, යෝග්‍ය ප්‍රගාමී මූලෝපායයන් සංවර්ධනය කරනු ලැබේ. ඒවා අවශ්‍ය විටදී ක්‍රියාවට නංවනු ඇත. අපි නිසි පුද්ගලයා නිසි තැන පිහිටුවන්නෙමු. ඔවුන් දේශපාලන ඇඟිලිගැසීම්වලින් නිදහස්ව තම කාර්යය කිරීමට සමත් වනු ඇත. ආරක්ෂක හමුදා, පොලිසිය සහ බුද්ධි සේවා නවීකරණය කිරීමට හා ආරක්ෂක පද්ධති ශක්තිමත් කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු. අපගේ දේශයට යුදමය ආරක්ෂාව පමණක් නොව, ආර්ථික, දේශපාලනික, සමාජ සහ පාරිසරික සුරක්ෂිතභාවය ද අවශ්‍ය ය.

ජාතියේ ශක්තිය මනිනු ලබන්නේ සතුරන්ගෙන් ආරක්ෂා වීමේ හැකියාවෙන් පමණක් නොවේ. ශක්තිමත් ජාතියක් විසින් සිය පුරවැසියන්ගේ අයිතීන් හා නිදහස ද ආරක්ෂා කළ යුතු ය. ඒ සඳහා ශක්තිමත් ප්‍රජාතාන්ත්‍රික ආයතන තිබිය යුතු ය. ඒවායේ නීති විසින් ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ගැබ් කරගෙන ආරක්ෂා කළ යුතු ය. එහි අධිකරණ පද්ධතිය සාධාරණ, ඉක්මන් සහ කාටත් ප්‍රවේශය ඇති එකක් විය යුතු ය. එමගින් රටේ නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සැම කල්හි ම ආරක්ෂා විය යුතු ය. අපි ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට නව ජීවනයක් දෙන්නෙමු. අපගේ ජනතාවගේ හදවත්වලින් ඒ පිළිබඳ ගිලිහීගොස් තිබෙන විශ්වාසය යළි දිනාගැනීමේ හැකියාව ගොඩනගන්නෙමු.

ස්ථාවර රටකට ඒ රටට ගැලපෙන ව්‍යවස්ථාවක් අවශ්‍ය ය. එමගින් ඒකාධිපති තර්ජනවලට අවස්ථාවක් දෙන්නේ නැත. ප්‍රතිසංස්කරණ මගින් එය ශක්තිමත් කළ යුතු විට, එම ප්‍රතිසංස්කරණ බුද්ධිමත් ලෙස හා ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතු ය. සංවර්ධිත රටක් ලෙස ලෝකයේ නිසි ස්ථානය අත්පත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය බව හා එයට අවස්ථාව උදා වී ඇති බව අපට විශ්වාස ය. අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් දේශයේ බහු වාර්ගිකත්වය, බහු සංස්කෘතිකභාවය, බහු භාෂිකත්වය හා බහුත්වවාදී ස්වභාවය නිරූපණය කළ යුතු ය. එමගින් අප එක්සත් කළ යුත්තේ නීතියෙන් පමණක් නොවේ. අප සැම හදවතින්ද එක්සත් කළ යුතු ය.

**ශක්තිමත් ජාතියක් සඳහා ජනතා කේන්ද්‍රීය පරිපාලනයක් සහ තම ජනතාවට ඵලදායී, තත්කාර්යවාදී සහ සාධාරණ අන්දමින් සැලකීමට ඇපකැප වුණු රාජ්‍ය සේවයක් අවශ්‍ය ය. මෙම වටිනාකම් නිරූපණය වන පරිදි අපි රාජ්‍ය සේවය ප්‍රතිසංස්කරණය කර නවීකරණය කරන්නෙමු. රාජ්‍ය සේවය සමන්විත වනු ඇත්තේ දක්ෂතාව මත තේරුණු නිලධාරීන්ගෙනි. හිතවත්කම හා දූෂණය මත පත් වුණ අයගෙන් නොවේ. 21වන සියවසේ ජාතියක අවශ්‍යතාවන් ඉටුකිරීමට අවශ්‍ය නවීන මෙවලම් හා පද්ධතිවලින් රාජ්‍ය සේවය සමන්විත වනු ඇත.**

රටකට එහි ශක්තියෙන් වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ එය ගෝලීයව පිහිටා ඇති ස්ථානයෙනි. එය හුදෙක් භූගෝලීයව පමණක් ඇති වන්නක් නොවේ. එයට අසල්වැසියන් ලොව පුරා හවුල්කරුවන් සමග තිබෙන සම්බන්ධය ද අදාළ ය. ශක්තිමත් ජාතියක් ජාත්‍යන්තර ගිවිසුම්වලට ගරු කළ යුතු ය. ඒ හා සම්බන්ධ ව්‍යුහයන් තුළ ක්‍රියාකාරී විය යුතු ය. විශ්වීය ප්‍රජාවක සාමාජිකයකු ලෙස අවංකව සිය භූමිකාව ඉටු කළ යුතු ය. ඒ සඳහා අපි 'පළමුව ශ්‍රී ලංකාව' විදේශ ප්‍රතිපත්තිය දියත් කරන්නෙමු. එය නීතිය පාදක කරගත් ලෝක  රටාවක් තුළ අපගේ ජාතික අභිලාෂයන් තිරසර ලෙස හඹා යනු ඇත.

අපගේ ජාතිය ශක්තිමත් සහ ඔරොත්තු දෙන තත්වයට පත්කිරීමටත්, ජනතාවට විනිවිද පෙනෙනසුළු වීමට හා එහි ප්‍රජාතාන්ත්‍රික වටිනාකම්වලට වගවීමටත්, රටේ පුරවැසියන් දැනුවත් හා තොරතුරු සහිත මුරභටයන් පිරිසක් බවට පත්වීම අවශ්‍ය ය. එය තහවුරු කිරීම පිණිස, ආචාරධාර්මිකව සහ වගකීමකින් යුතුව ක්‍රියාත්මක වන නිදහස් හා සාධාරණ මාධ්‍ය පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා අපි එඩිතර පියවර ගන්නෙමු.

ජාතියක් අභ්‍යන්තර සහ බාහිර සතුරන්ගෙන් ආරක්ෂා කරන්නේ ආරක්ෂක හමුදා විසිනි. එයට අමතරව, ශක්තිමත් සහ ස්ථාවර ජාතියක් නම් එය ස්වාභාවික තර්ජනවලින් හා ආපදාවලින් ද ආරක්ෂිත විය යුතු ය. ශ්‍රී ලංකාව අතීතයේදී දැඩි ලෙස ආපදා පීඩාවන්ට ලක් වී තිබේ. අප ඉදිරියේ තිබෙන අනාගතය ද දේශගුණික විපර්යාසවල තර්ජනයට ලක් වූ එකකි. අපි ආපදා කළමනාකරණය වඩා ඵලදායී සහ කාර්යක්ෂම කරන්නෙමු. ආපදා අවදානම් අවම කිරීම සඳහා අරමුදල් නිර්මාණය කරන්නෙමු.

සංරක්ෂණය ශක්තිමත් ජාතියක යතුරයි. විශේෂයෙන් ම ලෝක පරිමාණ දේශගුණික අර්බුද සංදර්භයක එහි විශේෂ වැදගත්කමක් තිබේ. අලුතින් සම්පාදනය කරන ලද පාරිසරික ප්‍රඥප්තිය අනුව අපි පාරිසරික ප්‍රතිපත්තියක් නිර්මාණය කරන්නෙමු. එමගින් අපගේ ස්වාභාවික සම්පත් සංරක්ෂණය සඳහා උද්දේශනය සිදු කරනු ඇති අතර, අප ජාත්‍යන්තර බැඳීම්වලට සහ අපගේ අනාගත පරම්පරා උදෙසා වන බැඳීම්වලට ඇපකැප වී සිටින බව තහවුරු කරන්නෙමු.

# අපගේ දේශය ආරක්ෂා කරගැනීම

## සුහුරු ආරක්ෂාව සහ නවීන ආරක්ෂක අංශ

- අපගේ දැනට පවතින ජාතික ආරක්ෂක රාමුව සහ ප්‍රතිපත්ති විවරණය කිරීමෙන් අනතුරුව ජාතික ආරක්ෂක මූලෝපායක් සංවර්ධනය කරනු ලැබේ. මෙම විවරණය විගණනයක ස්වරූපය ගනු ඇත. එය ක්‍රියාත්මක කරනු ලබන්නේ සයිබර් ආරක්ෂක විශේෂඥයන්ගෙන් ද සමන්විත බහු විෂයික විශේෂඥයන් කණ්ඩායමක් විසිනි. එම නිර්දේශානුකූලව, අප විසින් සාකල්‍ය සහ දිගු කාලීන ජාතික ආරක්ෂක මූලෝපායක් සංවර්ධනය කරනු ඇත. එහිදී ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කිරීම සහ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමට දැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

- ජාතික ආරක්ෂක මූලෝපාය නිර්මාණය කරනු ලබන්නේ ක්ෂේත්‍රයේ සිටින ආරක්ෂාව සම්බන්ධ හොඳම විශේෂඥයන් විසිනි. එම බුද්ධි මණ්ඩපය ඒකරාශී කිරීමට හා ආරක්ෂක ප්‍රතිපත්ති නිර්මාණය කිරීමට සහ ජාතික ආරක්ෂාව පිළිබඳ තීරණ ගැනීම සඳහා ජාතික ආරක්ෂක කවුන්සිලයක් පිහිටුවනු ලැබේ. ජාතික ආරක්ෂක උපදේශක තනතුරක් ද අලුතෙන් නීත්‍යානුකූලව පිහිටුවනු ලැබේ. නව අන්තර් සංවිධාන ප්‍රති ත්‍රස්ත මධ්‍යස්ථානයක් නිර්මාණය කරනු ඇත. එමගින් සතිපතා රැස්වීම් පවත්වනු ලැබේ. අපි ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලය ද ශක්තිමත් කරන්නෙමු.



# අපගේ ආරක්ෂක හමුදා නවීකරණය කිරීම

බුද්ධි නියෝජිතායතන, පොලිසිය සහ ආරක්ෂක හමුදා සහ සිවිල් ආරක්ෂක බලකාය ජාතික ආරක්ෂක මූලෝපායට අනුකූලව නවීකරණයට ප්‍රමුඛතාව දෙමින් ආරක්ෂක අයවැය ශක්තිමත් කරනු ඇත. පොලිස් බලකාය නවීකරණය කිරීම සමග අලුත් උසස්වීම් ක්‍රමයක් ද ක්‍රියාත්මක වනු ඇත. එහිදී කුසලතා පදනම ක්‍රියාත්මක වේ. තම රාජකාරිය වෙත කැපවෙමින් අභියෝගාත්මක, භයානක සහ වැදගත් අපරාධ නඩු වෙනුවෙන් කටයුතු කළ, එය නිර්භයව සහ පක්ෂපාතිත්වයන්ගෙන් තොරව ඉටු කළ නිලධාරීන්ගේ වටිනාකම අගය කරනු ලැබේ. විවිධත්වයන් සහිත ජාතියක් ලෙස, අපගේ ශක්තිය විවිධත්වය බව හඳුනාගනු ලැබේ. ආරක්ෂක, පොලිසිය සහ සිවිල් ආරක්ෂක බලකාය ගොඩනැගෙන්නේ එම විවිධත්වය නිරූපණය වන පරිදි ය.

අමතරව වශයෙන්, නාවික හමුදාව සහ වෙරළාරක්ෂක හමුදාව ද ශක්තිමත් කරනු ලැබේ. එහි අරමුණ වන්නේ සාමුද්‍රික ජාතියක් ලෙස අපගේ ස්ථාවරය නිරූපණය කිරීම, වෙරළ කලාපය ආරක්ෂා කිරීම, මුහුදු මාර්ග මුරකිරීම සහ අපගේ සම්පූර්ණ ආර්ථික කලාපයේ සම්පත් ආරක්ෂා කරගැනීමයි. ජාතික ආරක්ෂක මූලෝපායේ අභ්‍යන්තර කොටසක් වන්නේ ජාතික ආරක්ෂක අවශ්‍යතාවකදී ක්ෂණිකව යෙදවීම සඳහා ජාතික ආරක්ෂක හමුදා සූදානමින් තැබීමයි. එක්සත් ජාතීන්ගේ සාමසාධක දූත මෙහෙයන්හි සේවයේ යෙදෙන හමුදා සාමාජිකත්වය ප්‍රමාණවත් ලෙස වැඩි කිරීමෙන් ද අපි සූදානම පවත්වාගෙන යන්නෙමු.

**දිවයිනේ ඕනෑම තැනකදී හදිසි ඇමතුමකට විනාඩි 20කින් ප්‍රතිචාර දැක්වීමට හැකි වන පරිදි පොලිස් දෙපාර්තමේන්තුව නවීකරණය කර උපකරණවලින් ශක්තිමත් කරනු ලැබේ. පොලිසියට කරනු ලබන සියලු පැමිණිලි සහ ප්‍රකාශ ඩිජිටල්කරණය කරනු ලැබේ. ඒවා කරනු ලබන පුද්ගලයාට ද ලේඛනයේ පිටපතක් ලබාදෙනු ඇත.**

ඒ වෙනුවෙන් අප විසින් වඩා හොඳ පුහුණුවක් ආරම්භ කරනු ඇත. එමගින් සේවාවේ ඉහළ වෘත්තිකභාවයක් සහ දේශපාලනික ස්වාධීනත්වයක් ඇති කරනු ලැබේ. ආරක්ෂක හමුදා, පොලිසිය සහ සිවිල් ආරක්ෂක බලකාය සම්පූර්ණයෙන් ම තම ජාතික ආරක්ෂාව සහතික කිරීමේ රාජකාරි වෙත අවධානය යොමු කර කටයුතු කරන බව අපි තහවුරු කරන්නෙමු. ඒවා වෙනත් අදාළ නැති හා විශේෂයෙන් ම ඔවුන්ගේ ගරුත්වයට හානිකර කාර්යයන් වෙත යොදවාගැනීම කරන්නේ නැත.

# අන්තර් සම්බන්ධිත සාමග්‍රිත බුද්ධිය

## Cohesive Intellgence

ජාතික ආරක්ෂාවේ පැවැත්ම සඳහා සහ අපගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා අන්තර් සම්බන්ධිත (cohesive intelligence), ඒකාබද්ධ බුද්ධි ජාලයක් රට තුළ මෙන් ම විදේශයන්හි ද ස්ථාපනය කිරීම අවශ්‍ය ය.

**ජාතික බුද්ධි පනත මගින් බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ කාර්යක්ෂමතාව වර්ධනය කරනු ඇත. බුද්ධි සේවා නියෝජිතායතන අතර සම්බන්ධීකරණය ඇති කරනු ලැබේ.**

එමගින් පුළුල් බුද්ධි තොරතුරු බෙදාගැනීමේ පද්ධතියකට සහයෝගය ලැබේ. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් හවුල්කරුවන් සමග ශක්තිමත් හා ස්ථාවර සම්බන්ධතා ඇති කරගැනීමට එය ඉවහල් වේ. නියාමනයෙන් තොර මුල්‍ය ගනුදෙනු සිදුකරන අන්තවාදී කණ්ඩායම් හඳුනාගැනීම සඳහා අපි මුල්‍ය බුද්ධි ඒකකය ශක්තිමත් කරන්නෙමු.

ජාතික බුද්ධි පනත මගින් ජාතික තර්ජන මට්ටම් පද්ධතිය ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් ශ්‍රී ලාංකික පුරවැසියන්ට යෝග්‍ය සහ කාලීන පදනමින් අනතුරු ඇඟවීම් සන්නිවේදනය කරනු ලැබේ.

අප විසින් සයිබර් ආරක්ෂක පනතක් හඳුන්වා දෙනු ලැබේ. එමගින් ජාතික සයිබර් ආරක්ෂණ නියෝජිතායතනයක් පත් කරනු ලබන අතර එහි කාර්යය වන්නේ ශ්‍රී ලංකාවේ ඩිජිටල් තර්ජන විශ්ලේෂණය කර අපේ රට සයිබර් තර්ජනවලට ලක් වීමේ අවදානම අවම කිරීමයි.

# ජනතාවගේ ව්‍යවස්ථාව

## ශක්තිමත්භාවය ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකාව ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයයි. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය යනු පරිණාමීය ක්‍රියාවලියක් වන අතර අපගේ ගමන තවමත් අවසන් වී නැත. අපගේ ප්‍රජාතන්ත්‍රවාදය කෙතරම් ශක්තිමත් ද යත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත, ඇති විය හැකිව තිබූ ආඥාදායකත්වයේ තර්ජනයෙන් අපව බේරා ගත්තේ ය. අපේ ජාතිය ආරක්ෂා කර එහි ඉදිරි ගමනේදී එය ශක්තිමත්ව තබා ගැනීමට අපට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය වේ. මෙම ජනතාවගේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අපගේ ව්‍යුහයේ හා පාලන ක්‍රමයේ ප්‍රජාතන්ත්‍රීයකරණය සම්පූර්ණ කරනු ඇත. නිදහස් හා සමාන පුරවැසියන් ලෙස, ජනවාර්ගික, කුල, ආගම්, ස්ත්‍රී පුරුෂභාවය හෝ වෙනත් ඕනෑම වෙනසක් නොතකා, ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් එකිනෙකා සමග සාමයෙන් හා සමගියෙන් ජීවත්වී□මත්, සමාන අවස්ථා භුක්ති විඳීමත්, අපගේ රට පාලනය කිරීමට අර්ථවත් ලෙස සහභාගී වීමත් එමගින් සහතික කෙරෙනු ඇත.

**මෙම පාර්ලිමේන්තුව විසින් ආරම්භ කරන ලද අග්‍රාමාත්‍යවරයාගේ එකඟතාවය මත විධායක ජනාධිපතිවරයාගේ ක්‍රියාකාරීත්වය, බලය බෙදාහැරීම සහ මැතිවරණ ක්‍රම පිළිබඳ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සියලු පාර්ශවකරුවන් සමඟ ප්‍රමාදයකින් තොරව අවසන් කෙරෙනු ඇත. පරිණාමීය ප්‍රජාතන්ත්‍රවාදයේ මාවත ඔස්සේ අපගේ නොසැලෙන ගමන දිගටම යමින් ජනමත විචාරණයකින් නව ව්‍යවස්ථාව ජනතාව විසින් අනුමත කෙරෙනු ඇත.**

දූෂණයට හා නාස්තියට තුඩු දී ඇති මනාප මැතිවරණ ක්‍රමය වෙනුවට සමානුපාතික නියෝජනයේ වැදගත්ම ප්‍රතිලාභ ආරක්ෂා කරන ක්‍රමවේදයක් ඇතිකරමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාම මගින් මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කෙරෙනු ඇත. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පාලන ව්‍යුහය ද ප්‍රතිසංස්කරණය කරනු ඇත. පාර්ලිමේන්තුවේ පක්ෂ මාරුකිරීම අවසන් කිරීම, රජයේ ස්ථාවරභාවය වැඩි කිරීම, ජනතාවගේ මැතිවරණ මනාපය ආරක්ෂා කිරීම යනාදිය සිදුවනු ඇත. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 19 වන ව්‍යවස්ථා සංශෝධනය මත ගොඩනැගෙන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ වැඩි සිවිල් සමාජ සහභාගීත්වයක් ප්‍රවර්ධනය කිරීම මගින් පත් කරන ලද කොමිෂන් සභාවල ඵලදායිතාවය සහ ස්වාධීනත්වය වැඩි කරනු ඇත. සියලුම ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන් වෘත්තිකයන් හෝ වෙනත් කීර්තිමත් පුද්ගලයන් වනු ඇත. ජාතික ලැයිස්තුවෙන් පත්වන නියෝජිතයින්ගෙන් අවම වශයෙන් 25%ක්ම කාන්තාවන් බව නියම කිරීමෙන් පාර්ලිමේන්තුවේ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම නීතිගත කෙරේ.

**ජාතියක ආයතන ශක්තිමත්ව පැවතීමට නම් රජයේ නාස්තිය අවම කළ යුතු අතර දූෂණයද තුරන් කළ යුතු බැවින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අවසර දී ඇති අමාත්‍යාංශ ගණන නියම කර නීතියෙන් අමාත්‍යාංශ ලැයිස්තුව නියම කෙරෙනු ඇත.**

ශක්තිමත් ජාතියක අධිකරණය රජයෙන් ස්වාධීන විය යුතු අතර එය සහතික කිරීම සඳහා නව ව්‍යවස්ථාව මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කරන ලද ස්වාධීන රජයේ අභිචෝදකයෙකු බිහි කරනු ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අධිකරණ අර්ථ නිරූපණය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉවතට ගෙන නව ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථා අධිකරණයකට යොමු කෙරෙන අතර එමඟින් රජයේ විවිධ මට්ටම්, පළාත් සහ කේන්ද්‍රය අතර, පළාත් අතර, සහ පළාත් තුළ ආරවුල් විනිශ්චය කරනු ඇත.

තම පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ශක්තිමත් ජාතියකට ඉතාම වැදගත් වන අතර ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන විට ඔවුන්ට යුක්තිය ඉටු කිරීම ද අත්‍යවශ්‍ය වේ. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කොළඹ ශ්‍රේෂ්ඨාධිකරණයේ පමණක් නොව, පදිංචියට ආසන්නතම මහාධිකරණවල ද අභියාචනා ගොනු කිරීමට පුරවැසියන්ට ඉඩ ලබා දෙනු ඇත.

## ජනතාවට බලය

අපගේ මව්බිමේ ඒකීයත්වය, භෞමික අඛණ්ඩතාව, ස්වෛරීභාවය සහ දේශපාලන ස්වාධීනත්වය අප විසින් ආරක්ෂා කරන්නෙමු. රජයේ තීරණ ගැනීම අපි ජනතාවට සමීප කරවන්නෙමු. නොබෙදුණු හා වෙන් කළ නොහැකි ශ්‍රී ලංකාවක් තුළ උපරිම බලය බෙදා හැරීමක් ක්‍රියාත්මක කෙරේ. එහිදී බලය බෙදා හැරීම අර්ථවත් වනු ඇති අතර, කාර්යක්ෂමතාව වැඩි වී නාස්තිය ද අඩු වේ. බලය බෙදා හැරීම නිසා නීතියෙන් හා ප්‍රායෝගිකව පමණක් නොව හදවතින්ම ද සියලු ශ්‍රී ලාංකිකයන් අතර සැබෑ සමගිය ඇති කිරීම අප විසින් සහතික කෙරෙනු ඇත.

එනිසා රණසිංහ ප්‍රේමදාස, චන්ද්‍රිකා කුමාරතුංග සහ මහින්ද රාජපක්ෂ යන ජනාධිපතිවරුන් යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා සැලකිල්ලට ගනිමින් පළාත් වල බලතල, කාර්යයන් සහ වගවීම තීරණය කරනු ලැබේ. කේන්ද්‍රයේ බලය බෙදා හැරීම සහතික කිරීම සහ පළාත් සභා සහ පළාත් වලට ඔවුන්ගේ හැකියාවන් මත පදනම්ව ඔවුන්ගේ බලතල ක්‍රියාත්මක කිරීමට හැකිවීම සහතික කිරීම වෙනුවෙන් පළාත් සභා නියෝජිතයින්ගෙන් සමන්විත දෙවන සභාවක්, එනම් සෙනෙට් සභාවක් ද පැවැත්වෙනු ඇත.


**නීතිය මගින් සෙනෙට් සභාවේ කාන්තාවන් සඳහා 25% ක කෝටාවක් සහතික කරනු ඇති අතර යෝග්‍ය අධ්‍යාපන සුදුසුකම් ද නියම කරනු ඇත.**

පළාත්වලට අවශ්‍ය මුදල් රැස් කිරීමට සහ බෙදාහරින ලද බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය ද ලැබෙනු ඇත. දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් මධ්‍යම බලතල ක්‍රියාත්මක කිරීමේදී කේන්ද්‍රයේ නියෝජිතයන් ලෙස කටයුතු කරන අතර පළාත් බලතල ක්‍රියාත්මක කිරීමේදී පළාතේ නියෝජිතයන් ලෙස ද කටයුතු කරනු ඇත. බලය බෙදා හැරීමේ ඒකක සම්බන්ධයෙන්, එකඟ විය හැකි පරිදි අවශ්‍ය වෙනස්කම් කිරීමෙන් අපි බලය බෙදාගැනීම වඩාත් අර්ථවත් හා පිරිවැය-කාර්යක්ෂම කරන්නෙමු.



# වගවීමෙන් යුතු නායකත්වය

## ජන ජීවිතයේ සුපිළිපන්භාවය



- රජයේ ඇමතිවරුන් විසින් අන්තර්ජාලය ඔස්සේ වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වන අතර එමගින් මහජනයාට ඔවුන් වගවීම කෙරෙහි යොමු කර තබාගත හැකිය.

- මෙම ප්‍රකාශ අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව විසින් තහවුරු කරනු ලැබේ. ප්‍රමිති සහ ආචාර ධර්ම පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයකු අපි පත් කරන්නෙමු,

- ඔවුන් විසින් සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ බැඳියාවන් පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන යනු ඇති අතර එහිදී මන්ත්‍රීවරු පාර්ලිමේන්තු චර්යාධර්ම පද්ධතිය කෙරෙහි අනුකූල වීම ද සහතික කරනු ඇත. බැඳියාවන් සම්බන්ධයෙන් ගැටුමක් පවතින අවස්ථාවලදී ඇමතිවරුන්ට එබඳු තනතුරු දැරීමට ඉඩ නොදේ.

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා සඳහා සුඛෝපභෝගී තීරුබදු රහිත වාහන බලපත්‍ර අප විසින් ඉවත් කරන අතර මහජනතාවගේ සේවය සඳහා ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය පහසුකම් පවතින බව අප විසින් සහතික කරන්නෙමු.

- සර්ව පාක්ෂික කමිටුවක් විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ තේරී පත් වූ අනෙකුත් නිලධාරීන්ගේ සියලු වාසි සහ වරප්‍රසාද සමාලෝචනය කරනු ඇත.

- තේරී පත් වූ නිලධාරීන්ගේ සහ රජයේ සේවකයින්ගේ වැටුප් අතර ඇති විෂමතා පිළිබඳව ද කමිටුව විසින් අධ්‍යයනය කරනු ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී ගැලපීම් නිර්දේශ කරනු ඇත. තේරී පත් වූ නිලධාරීන්ට වෙන් කර ඇති ආරක්ෂක නිලධාරීන් සහ වාහන සංඛ්‍යාව තනිකරම තීරණය කරනු ලබන්නේ බුද්ධි අංශ විසින් කෙරෙන තර්ජන තක්සේරු කිරීම් මගිනි.

# පළමුව ශ්‍රී ලංකාව

## ශක්තිමත් විදේශ ප්‍රතිපත්තියක්

ඉන්දියානු සාගරයේ කේන්ද්‍රයේ පිහිටි ශ්‍රී ලංකාවේ භූගෝලීය වශයෙන් තීරණාත්මක පිහිටීම මගින් අපව ඓතිහාසිකව වෙළඳ හා ජාත්‍යන්තර සංචාරවල සන්ධිස්ථානයක තබා තිබේ. සියලු ජාතීන් සමඟ මිත්‍රත්වයේ විදේශ ප්‍රතිපත්තියක් සඳහා අපි කැපවී සිටින්නෙමු. ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම සඳහා අපගේ භූගෝලීය පිහිටීම සහ ජාතීන් සහ, කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන සමඟ හවුල්කරුවන් ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් අපට ඇති ඓතිහාසික සම්බන්ධතාවලින් අපි ප්‍රයෝජන ගන්නෙමු.

මෙම කාර්යභාරය භාරගෙන එය ශක්තිමත් කිරීම වෙනුවෙන්, විවෘත වෙළඳාම, යාත්‍රා කිරීමේ නිදහස සහ ජාත්‍යන්තර නීතියේ මූලධර්මවලට අපි බැඳී සිටිමු. ජාත්‍යන්තර ගිවිසුම් හා යෝජනා සඳහා අපගේ ස්වේච්ඡා කැපවීම් ක්‍රියාත්මක කිරීම සහතික කිරීමෙන් අපි අපගේ ජාත්‍යන්තර විශ්වසනීයත්වය නැවත ගොඩනඟන්නෙමු. අනෙකුත් සියලුම කලාපීය පාර්ශවකරුවන් සමඟ ඉන්දියන් සාගරයේ සැරිසැරීමේ නිදහස අපි සහතික කරන්නෙමු.

**අපගේ ජාත්‍යන්තර සබඳතා පදනම් වන්නේ _සියල්ලන් සමඟ මිත්‍රත්වය, කිසිවෙකු සමඟ සතුරු නොවීමඟද යන පදනම මත ය.**

ඉන්දියන් සාගරයේ කේන්ද්‍රස්ථානය ලෙස අපගේ භූමිකාව ප්‍රක්ෂේපණය කිරීම සඳහා අපගේ අසල්වැසියන් සමඟ ශක්තිමත් සබඳතා ගොඩනඟා ගැනීම සහ ශක්තිමත් කිරීම කෙරෙහි අපි විශේෂ අවධානයක් යොමු කරන්නෙමු. එසේම දකුණු හා අග්නිදිග ආසියාව, මැද පෙරදිග සහ නැගෙනහිර අප්‍රිකාව වැනි ඉන්දියන් සාගරය වටා වූ කලාපවල ජාතීන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමු.

අපගේ විදේශ ප්‍රතිපත්ති උපාය මාර්ගයන්ට අනුව අපගේ විදේශ දූත මෙහෙවර තාර්කිකකරණය කරවන අතර ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සඳහා අපගේ විදේශ සේවය නැවත සකස් කරනු ලැබේ. අපනයන ප්‍රවර්ධනය කිරීම, ආයෝජන වැඩි කිරීම සහ තාක්ෂණික හුවමාරුව කෙරෙහි පහසුකම් සැපයීම සඳහා ආයෝජන මණ්ඩලය, ආර්ථික සංවර්ධන මණ්ඩලය සහ වාණිජ දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් සහ කණ්ඩායම් සුදුසු දූත මණ්ඩලවල අප විසින් ස්ථානගත කරන්නෙමු.

**වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය සඳහා අපගේ ජාතික අවශ්‍යතා සඳහා ඔවුන් දක්වන දායකත්වය මත සියලූ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල නිරන්තරයෙන් ඇගයීමට ලක් කෙරේ.**

හැකිතාක් දුරට, අපගේ සියලු තානාපතිවරුන් විදේශ සේවා නිලධාරීන් බව සහතික කර, සුදුසු විදේශ සේවා නිලධාරීන් නොමැති විට, විනිවිද පෙනෙන නිර්ණායකයන්ට අනුකූලව අදාළ සුදුසුකම් සහිත විකල්පයන් පත් කරන්නෙමු.

# නිසිකලට යුක්තිය පසිඳලීම

## නවීන, අපක්ෂපාතී අධිකරණ පද්ධතියක්

**ඉදිරි වසර පහ තුළදී, අපි මෙතෙක් සිරවී ඇති 725,000කට අධික නඩු අසා අවසන් කර නීති පද්ධතියේ වේගවත්භාවය දෙගුණයක් කරන්නෙමු. එයින් ප්‍රමාදයන් නිසා සිදුවන අවිනිශ්චිතතාව, වේදනාව සහ අයුක්තිය ඉතා ඉක්මණින් අවසන් වනු ඇත.**

පරිපාලනමය බාධක ඉවත් කිරීම, ආයතන ශක්තිමත් කිරීම හා එහි ලිපිගොනු සහ වාර්තා ඩිජිටල්කරණය කිරීම සඳහා වන අධිකරණ පද්ධතිය තුළ ප්‍රතිසංස්කරණ හා නවීකරණ කිරීම් සඳහා පුළුල් වැඩපිළිවෙලක් මගින් මෙය සිදු කෙරේ.

මේ සඳහා අපි අධිකරණ ක්‍රියා පටිපාටි නවීකරණය කිරීමේදී ජාත්‍යන්තර යහපත් භාවිතයන් පිළිබඳ අධ්‍යයනයන් දියත් කර අපගේ අධිකරණ පද්ධතියේ ප්‍රමාදයන් අවම කිරීම සඳහා නීති සම්පාදනය කරන්නෙමු. දීර්ඝතම ප්‍රමාදයන් සිදුවන හා වැඩිම ආර්ථික හානියක් සිදු වන දේපළ නඩු සඳහා විශේෂ අවධානය යොමු කෙරේ. සේවයේ යෙදෙන විනිසුරුවන්ගේ සහ අභිචෝදකයින්ගේ සංඛ්‍යාව වැඩි කෙරෙනු ඇත. අවශ්‍ය නඩු කඩිනමින් විමසීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය වැනි විශේෂිත අධිකරණ හඳුන්වා දෙන්නෙමු. නඩු පැවරීමේ අවශ්‍යතාවය අඩු කිරීම සඳහා ස්වාධීන බේරුම්කාර සහ ආරවුල් විසඳීමේ යෝග්‍ය පද්ධතියක් අප විසින් නිර්මාණය කරනු ඇති අතර එමගින් අධිකරණ පද්ධතියට ඇති පීඩනය අඩු කෙරෙනු ඇත. ප්‍රජා සමථ මණ්ඩල වැඩිදියුණු කිරීමෙන් ප්‍රාදේශීය මට්ටමින් ද ඒ හා සමාන පියවර ගනු ලැබේ. උසාවි වාර්තා සහ ක්‍රියා පටිපාටි ඩිජිටල් කිරීම මගින් ක්‍රියාකාරිත්වයන් වේගවත් වන අතර විනිවිදභාවයක් ඇති වේ. සමස්ත ඩිජිටල් පරිවර්තනයක් 2030 වන විට සම්පූර්ණ වනු ඇත.

කාර්යක්ෂමතාවයට අමතරව, ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ, සමාජ-ආර්ථික මට්ටම කුමක් වුවත්, සෑම පුරවැසියෙකු සඳහාම සුදුසු නීති ආධාර ලබාගැනීමට ඉඩකඩ තිබිය යුතු බව අපි විශ්වාස කරන්නෙමු. මෙය ජය ගැනීම සඳහා අපි කලාපීය නීති ආධාර මධ්‍යස්ථාන ජාලයක් වෙනුවෙන් අරමුදල් වැඩි කර පුළුල් කරන්නෙමු. එමගින් නීති උපදෙස් හා උපදේශන ලබාගැනීමට සැමට ප්‍රවේශ විය හැකිය.

# නිදහස් හා සාධාරණ මාධ්‍ය

ශක්තිමත් හා ස්ථාවර ප්‍රජාතන්ත්‍රවාදයකදී ජන-මාධ්‍යයන්ගේ භූමිකාව ඉතා වැදගත් ය. බොහෝ විට හතරවෙනි ආණ්ඩුව ලෙස හැඳින්වෙන එය විධායකයට, ව්‍යවස්ථාදායකයට සහ අධිකරණයට පසුව වැදගත් ම අංශයයි. එහි බලය හා මහජන මතය හැඩගැස්වීමේ බලය එක්සත් කිරීම, ප්‍රාණවත් කිරීම සහ තොරතුරු දැනුම්දීම සඳහා යොදාගත හැකි ය. සෞඛ්‍ය සම්පන්න ප්‍රජාතන්ත්‍රවාදයකදී මාධ්‍ය බොහෝ විට මහජනයාගේ මුරබල්ලකු ලෙස ක්‍රියා කරයි. රජය සම්බන්ධයෙන් මාධ්‍යයේ සමීප නිරීක්ෂණ රජය දේශයේ වටිනාකම්වලට අනුකූලව කටයුතු කිරීම තහවුරු කරයි. මාධ්‍යයන්ට තම කාර්යය ඉටුකිරීම සඳහා නිදහස අවශ්‍ය ය. මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ 'කොළඹ ප්‍රකාශනය' අනුව යමින්, ප්‍රකාශනයේ නිදහස සීමා කරන යල්පැනගිය නීති අහෝසි කරනු ලැබේ.

**පෞද්ගලික මාධ්‍ය ආචාරධාර්මික සහ වගකීම් සහගත වීම තහවුරු කිරීම රෙගුලාසි ක්‍රියාවට නංවන අතර, එය කරනු ලබන්නේ නිර්දේශපාලනිකව ය.**

ව්‍යවස්ථා සභාව විසින් ස්වාධීන මාධ්‍ය කොමිසමක් පත් කරනු ලැබේ. එහි කාර්යභාරය වන්නේ සාධාරණත්වයේ භාෂිතය (Fairness Doctrine) වැනි පිළිගත් ප්‍රමිතිවලට අනුකූලව සමබර වාර්තාකරණයක් තහවුරු කිරීමයි. කොමිසම විසින් ප්‍රධාන ධාරාවේ මාධ්‍යවල වෛරී ප්‍රකාශ සහ දුස් තොරතුරු පිටුදැකීම සඳහා හොඳම භාවිතාවන් අධ්‍යයනය කර ක්‍රියාත්මක කරනු ලැබේ.

**අපගේ ප්‍රජාතන්ත්‍රවාදය තුළ මාධ්‍යවල සක්‍රිය හා ස්වාධීන භූමිකාව පිළිගනිමින් ජනමාධ්‍යවේදීන්ට නිවාස 1,000ක් ඉදි කර පොලී රහිත සත්‍යපුර නිවාස යෝජනා ක්‍රමය යටතේ සපයනු ලැබේ.**

- නිරන්තරයෙන් මුහුණ දෙන දුෂ්කර සහ අනතුරුදායක සේවා තත්වයන් සැලකිල්ලට ගෙන සියලු වෘත්තීය ජනමාධ්‍යකරුවන්ට රු. මිලියන 10ක ජීවිත රක්ෂණයක් සැපයේ.
- විකාශන තරංග සංඛ්‍යාත පරාසය මහජන දේපළකි. එය පොදු අභිලාෂයන් වෙනුවෙන්, විනිවිද පෙනෙනසුළු හා වගවීමක් සහිත ස්වභාවයකින් භාවිතා කළ යුතු ය.
- තොරතුරු දැනගැනීමේ හිමිකම දැනටමත් පාර්ලිමේන්තු පනතකට ඇතුළත් කර තිබේ. එහි විනිවිදභාවය වර්ධනය කරමින් එය තවදුරටත් ශක්තිමත් කෙරේ. රාජ්‍ය ආයතන විසින් ප්‍රගාමී ලෙස තොරතුරු හෙළිදරව් කිරීම සහ තොරතුරු දැනගැනීමේ හිමිකම යටතේ කරනු ලබන තොරතුරු ඉල්ලීම්වලට පිළිතුරු සැපයීම ඉක්මන් කිරීමේ වැඩසටහනක් දියත් කෙරේ.
- ප්‍රකාශනයේ නිදහස, බහුත්වවාදය සහ විවිධත්වය හැමවිට ම ආරක්ෂා කරනු ලැබේ.

# මහජනයා සඳහා රාජ්‍ය සේවයක්

## බලසතු කළ, කෞශල්‍යතන්ත්‍රවාදී සහ කාර්යක්ෂම

එලදායී රාජ්‍ය සේවයක් නොමැතිව ශ්‍රී ලංකාවට සංවර්ධනය විය නොහැකි ය. අපගේ සෞභාග්‍යයේ යතුර තිබෙන්නේ බලසතු කරන ලද, සැලකිලිමත් සහ අභිප්‍රේරණය වූ රාජ්‍ය සේවයක් ඔස්සේ ය. නිදහස ලබන සමයේ ශ්‍රී ලංකාව ආසියාවේ හොඳම රාජ්‍ය සේවය තිබුණු රටයි. යෝග්‍ය ප්‍රතිසංස්කරණ ඔස්සේ සහ නවීකරණය ඔස්සේ අපට නැවත වතාවක් කලාපයේ ම ඊර්ෂ්‍යාවට හේතු වන රාජ්‍ය සේවයක් ස්ථාපනය කළ හැකි බව අපේ විශ්වාසයයි. කෞශල්‍යතන්ත්‍රවාදී සහ බලසතු කරන ලද, ස්වාධීන, එහෙත් වගවීමකින් ද යුතු රාජ්‍ය සේවාවක් අපි නැවත පිහිටුවන්නෙමු. දැක්මක් සහිත, ගැඹුරු ප්‍රතිපත්ති සංවර්ධනය කරනු ලබන අතර ඒවා කාලීනව කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය ඉක්මන් සහ විශ්වසනීය වනු ඇත.

රාජ්‍ය සේවය යනු ස්ථාවර ආණ්ඩුවකි. එය වෘත්තීය සේවාවක් වන අතර එහි ගරුත්වය ආරක්ෂා කළ යුතු ය. නිල ධාරිතාවකින් ගන්නා ලද ඔවුන්ගේ ක්‍රියාමාර්ග ආරක්ෂා කිරීම වෙනුවෙන් අපි පෙනී සිටින්නෙමු. අධිකරණ ක්‍රියාමාර්ගවලදී ඔවුන්ට නීතිමය, මුල්‍යමය සහාය පිරිනැමෙනු ඇත.

රාජ්‍ය ආයතන දේශපාලන ඇඟිලිගැසීම්වලින් නිදහස් වනු ඇත. එහෙත් ජනාධිපතිට, කැබිනට් මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට තම කාර්යසාධනය සම්බන්ධයෙන් වගවිය යුතු ය. ඔවුන් සේවය කරන මහජනතාවට ද ඔවුන් වගවිය යුතු ය. රාජ්‍ය සේවය සම්පූර්ණයෙන් ම ඩිජිටල්කරණය කරනු ලැබේ. බදු මුදල් භාවිතය පිළිබඳ තොරතුරු ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කිරීමේ මට්ටමේදී මහජනතාවට නොමිලේ ලබාගත හැකි වනු ඇත.

ඊට අමතරව, රාජ්‍ය සේවා වෙත මහජන ප්‍රවේශය නිවසේ සිට ම හෝ ව්‍යාපාරික ස්ථානයේ සිට ම කරගැනීමට හැකියාව ඩිජිටල්කරණ වැඩසටහන විසින් ලබාදෙයි. කිසිවෙකුට ලේඛනයක් ලබාගැනීමට හෝ අයදුම්පතක් භාරදීමට කොළඹ වැනි දුර ඈත ප්‍රදේශයකට යන්නට සිදුවන්නේ නැත. ඩිජිටල් අන්තර් ක්‍රියාකාරීත්වය සිදු කළ නොහැකි තැන්වල බොහෝ සේවා එක්දින සේවය මගින් ලබාගැනීමට පහසුකම් සපයනවා ඇත.

- ගමන් බලපත්‍ර, ජාතික හැඳුනුම්පත්, රියදුරු බලපත්‍ර, වාහන ලියාපදිංචිය දිනකින් ලබාගත හැකි ය.
- විදේශ අමාත්‍ය කොන්සල් කාර්යාල සේවා සහ ලේඛන සහතික කිරීම, විදේශ සේවා නියුක්ති කාර්යාංශය ද ඇතුළුව, එක් දිනකින් ලබාගත හැකි ය.
- ජනතාව කොළඹ ගොස් ලබාගත යුතු පොලිස් වාර්තා වැනි පොලිස් සේවා ද එක් දිනකින් ලබාගත හැකි ය.
- සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, විශ්‍රාම වැටුප් සහ වෙනත් අරමුදල් වෙතින් ද දිනකින් සේවා ලබාගත හැකි ය.
- විභාග දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේඛන සඳහා ද එම කාල රාමුව ම යොදාගනු ලැබේ.

# කෞශල්‍යතන්ත්‍රවාදය (meritocracy) හා කාර්යක්ෂමතාව

ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා අපගේ රාජ්‍ය සේවය සම්පූර්ණයෙන් ම පරිවර්තනයකට ලක්කළ යුතු ය. මෙම ක්‍රියාවලියේ මුල් පියවර අතරින් එකක් වන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත හඳුන්වාදීමයි. එහි අරමුණ වන්නේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි මෙන් ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ද නවීකරණය කිරීමයි. නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලය වැනි මෙම කාර්යයේදී වැදගත් නියෝජිතායතන නවීකරණය කර ශක්තිමත් කිරීමෙන් ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය වේගවත් කරනු ලැබේ. විශේෂයෙන් ම ඉඩම් හා ඉදිකිරීම් සම්බන්ධ මධ්‍යම පරිසර අධිකාරිය සහ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වැනි නියෝජිතායතන ඉලක්ක කර ඉහත දක්වන ලද පියවර හා සමාන ශක්තිමත් කිරීමක් හා නවීකරණයක් සිදු කරනු ඇත.

මෙම ප්‍රතිසංස්කරණවලට අමතරව, නිශ්චිත විෂය භාර එක් අමාත්‍යාංශයක සියලු දෙපාර්තමේන්තු සහ කාර්යයන් එක් තැනක ස්ථානගත කිරීම වැනි යටිතල පහසුකම්වල සෑජු භෞතික ප්‍රතිසංවිධානයන් මගින් කාර්යක්ෂමතාව විශාල වශයෙන් වර්ධනය කරනු ලැබේ.

අවසානයේ උසස්වීම් සිදුකිරීම, ජ්‍යේෂ්ඨත්වයට අමතරව, අපේක්ෂකයාගේ විද්‍යාත්මක කාර්යසාධන ඇගයීම මත පදනම් වන අතර එමගින් ගුණාත්මක සේවාවක් දිරිගන්වනු ලැබේ. දේශපාලන ඇඟිලිගැසීම්වලින් තොරව, විනිවිද පෙනෙනසුළු හා ස්වාධීන ලෙස උසස්වීම් සිදු වේ. වෙළඳපොළ පාදක වැටුප් ක්‍රම වෙත වෙනස් වීමේ ප්‍රතිපත්තිය යටතේ රාජ්‍ය අංශයේ වැටුප් සියයට 107කින් වැඩි කරන ලදී. මෙම ප්‍රතිපත්තිය දිගට ම පවත්වාගෙන යනු ලබන අතර රාජ්‍ය සේවයේ හා ආරක්ෂක හමුදාවල වැටුප් හා විශ්‍රාම වැටුප් විෂමතා ගැටලුව විසඳීමට කටයුතු කරනු ලැබේ. වර්තමානයේ සේවයේ යෙදී සිටින සියලු රජයේ සේවකයන් සහ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙන්නට පෙර අලුතෙන් බඳවා ගනු ලබන රජයේ සේවකයන් වෙනුවෙන් වර්තමාන ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ.

# ධාරිතාව සහ සවිබලගැන්වීම

ජාත්‍යන්තර හොඳම භාවිතාවන් අනුව යමින් රාජ්‍ය සේවය, ශ්‍රී ලංකා පරිපාලන සේවය සහ වෙනත් සේවාවන් පුළුල් කරනු ලැබේ. නව ශ්‍රී ලංකා ආර්ථික සේවාවක් සහ ශ්‍රී ලංකා ඩිජිටල් සේවාවක් රාජ්‍ය අංශයට එකතු කරනු ලැබේ. එමගින් වඩාත් කාර්යක්ෂම ලෙස ආර්ථික සහ ඩිජිටල් ප්‍රතිපත්ති නිර්මාණය කරනු ලැබේ. අප විසින් රාජ්‍ය අංශයේ මානව සම්පත් භාවිතය විධිමත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ හැකියාවන් සහ ධාරිතාවන් වර්ධනය කිරීම සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ රැකියාව කරන අතරතුර පුහුණුව රාජ්‍ය අංශයේ සේවකයන්ට ලබාදීම සඳහා ආයෝජනය කරනු ලැබේ. ඉහළ ලකුණු ලබාගන්නා අලුතෙන් බඳවාගනු ලබන්නන් වෙනුවෙන් ජාත්‍යන්තර නිරාවරණය ලබාදීම පිණිස පොදුරාජ්‍ය මණ්ඩල මහජන සේවා ශිෂ්‍යත්ව ආකාරයේ ශිෂ්‍යත්ව ව්‍යාපෘතියක් හඳුන්වා දෙනු ලැබේ.



සෑම අංශයක් වෙනුවෙන් ම ව්‍යාපාර කවුන්සිලයක් පිහිටුවනු ලැබේ. එහි කාර්ය මණ්ඩල සපයනු ලබන්නේ වානිජ මණ්ඩලය සහ අමාත්‍යාංශ ලේකම්වරුන් විසිනි. ඔවුන් මාස්පතා හමු වනු ඇත.

# අනාගතය ආරක්ෂා කිරීම

## සංරක්ෂණය හා තිරසරභාවය

ශ්‍රී ලංකාවේ අනාගතය සුරක්ෂිත කිරීම හා දේශගුණික විපර්යාස සහ පාරිසරික හානි සඳහා හේතු අවම කිරීම සඳහා සංරක්ෂණය උදෙසා වූ දුරදක්නා මූලෝපායක් සහ පාරිසරික ආරක්ෂාව අත්‍යවශ්‍ය ය. සාපේක්ෂ වශයෙන් පහත් මට්ටමින් පරිසරයට කාබන් එකතු කරන රටක් වන ශ්‍රී ලංකාව ගෝලීය දේශගුණික අර්බුදයෙන් දරුණු ලෙස බැටකයි. කෙසේ වෙතත්, අපගේ දේශය සංවර්ධනය හා නාගරීකරණය වෙමින් තිබේ. අලුතෙන් සම්පාදනය කරන ලද පාරිසරික ප්‍රඥප්තිය අනුව පාරිසරික ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමෙන්, ලෝක ප්‍රජාවේ සාමාජිකයකු ලෙස, පරිසරය මත අපගේ බලපෑම අවම කිරීම සඳහා අපි අපගේ කාර්යභාරය ඉටු කරන බව සහතික කරන්නෙමු.

දේශගුණික විපර්යාස අර්බුදයට මුහුණ දෙන ඉදිරිපෙළ රටක් ලෙස අප ජාත්‍යන්තර භාවිතාවන් වෙනස් කිරීම සඳහා සහ පැරිස් දේශගුණික සම්මුතියට එකඟව කටයුතු කිරීම සඳහා උද්දේශනය කරන්නෙමු. එය අපගේ විදේශ ප්‍රතිපත්තියේ වැදගත් මූලධර්මයකි. අවශ්‍ය විශේෂඥයන් සහිතව අපි මධ්‍යම පරිසර අධිකාරියේ ධාරිතාව පුළුල් කරන්නෙමු.



සියලු ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති විසින් මාස හතරක් තුළ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් සම්පාදනය කර මහජනයාට පරීක්ෂා කළ හැකි ලෙස ප්‍රසිද්ධ කළ යුතු ය.

වාතය සහ ජලය දූෂණය කිරීම ජාතික මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් ලෙස සැලකෙන අතර එය පිටුදැකීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සම්පාදනය කරනු ලැබේ.

අපි ගෝලීය කාබන් විමෝචන වෙළඳපොළට ඇතුළු වී වසර පහක කාලයක් තුළ ගස් මිලියන 30ක් සිටුවීමෙන් ජාතික කාබන් ණයවර ජනනය කරන්නෙමු.

වෙනත් වනජීවී සංරක්ෂණ ව්‍යාපෘති අතර, ප්‍රධාන සත්ත්ව ප්‍රභේද තුනක් වෙනුවෙන් දිගුකාලීන රැකවරණය අවධාරණය කරන්නෙමු. එම සත්ත්ව ප්‍රභේද තුන නම්, ශ්‍රී ලාංකික අලියා, ශ්‍රී ලාංකික කොටියා සහ නිල් තල්මසා ය.

වෙරළබඩ කඩොලාන වනාන්තර හා කොරල් පර සංරක්ෂණය කිරීම අරමුණු කරගත් අලුත් මුලපිරුම් අපි හඳුන්වා දෙන්නෙමු. යාන්ත්‍රික පතුල් ට්‍රෝලනය සහ වෙනත් තිරසර නොවන ධීවර තාක්ෂණයන් සම්බන්ධ තහනම පූර්ණව බලාත්මක කරනු ඇත.

# අලි මිනිස් ගැටුම

අලියා යනු සියවස් ගණනක සිට ශ්‍රී ලාංකික ඉතිහාසයේ සහ සංස්කෘතියේ කැපී පෙනෙන අංගයකි. වර්තමානයේදී ද අලියා වනසත්ත්ව හා සංස්කෘතික සංචාරක ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය අංගයකි. එම නිසා අලියා රැකගැනීම හැමවිට ම අපගේ සංරක්ෂණ ප්‍රමුඛතා ලැයිස්තුවේ ඉදිරියෙන් ම තිබේ. කෙසේ වෙතත්, ගම්බද ප්‍රදේශවල අලින් සහ පුරවැසියන් අතර ඇති ගැටුම පිළිබඳ හේතු හඳුනාගැනීම සහ තේරුම්ගැනීම වැදගත් ය. එමගින් අපට තවදුරටත් මරණ සිදුවීම වළක්වාගත හැකි ය.

- **ජාතික වනෝද්‍යානවවලට මායිම් වන ගම්මානවල අලි මිනිස් ගැටුම අරභයා, ප්‍රජාව විසින් නායකත්වය දෙන විසඳුම් සංවර්ධනය කිරීම සඳහා අපි ආයෝජනය කරන්නෙමු. එහිදී මෙම ගැමි ප්‍රජාවන්ගේ උපදෙස් විමසා එම යෝජනා ක්‍රියාත්මක කරන්නෙමු.**

- **අලින් විසින් සිදුකරනු ලබන මරණ හා දේපළවලට කරන හානි ආවරණය කිරීම සඳහා අපි විශේෂිත රක්ෂණයක් හඳුන්වා දෙන්නෙමු.**

දැඩි වන අලි ගහනයක් ජීවත් වන වනාන්තර හරහා දිවෙන උතුරු හා නැගෙනහිර දුම්රිය මාර්ගවලදී දුම්රියේ ගැටීමෙන් සෑම වසරකදී ම අලි 10 දෙනෙක් පමණ මිය යති.

- **මෙය අනාගතයේදී ද සිදුවීම වැළැක්වීමට අප විසින් නියාමන ව්‍යාපෘතියක් හඳුන්වා දෙනු ඇත. එහිදී වැදගත් අලි මංකඩ ඉහළින් සහ පහළින් පසුකළ හැකි ක්‍රමවේද හඳුන්වා දී එම බලපෑම අවම කරන්නෙමු.**

- **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් එක් සැලැස්මක් යටතේ කළමනාකරණය කරනු ලැබේ. එහිදී ප්‍රතිපත්ති සම්පාදනයේදී, සම්බන්ධීකරණය ප්‍රශස්ත කරගැනීමේදී, වගවීම වර්ධනය කිරීමේදී සහ නාස්තිය අවම කිරීමේදී ඒකාබද්ධතාව වර්ධනය කළ හැකි ය.**

- **අපි වහා ම සත්ත්ව සුබසාධන පනත සම්මත කර වන සතුන් හා ගෘහාශ්‍රිත සතුන් ආරක්ෂා කරන්නෙමු. එය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික වැඩසටහනක් දියත් කරන්නෙමු.**



# ආපදා අවදානම් අවම කිරීම හා ආපදා කළමනාකරණය

ස්වාභාවික ආපදා ප්‍රහාර රටවලට දරුණු ලෙස බලපායි. ගෝලීය දේශගුණික අර්බුදය සංකීර්ණ වන විට ශ්‍රී ලංකාව එහි අවදානමට ඉදිරි පෙළෙන් ම මුහුණ දෙන රටක් බවට පත්වෙයි. ශ්‍රී ලංකාව මෑත දශකවලදී වැඩියෙන් ම පීඩාවට පත් වූ රටවල් අතරින් එකකි. කලින් හඳුනාගෙන තිබුණු කාලගුණ රටා වෙනස් වී තිබේ. එමගින් කාලගුණ අන්තිකභාවයන් ඇති කර තිබේ. එහිදී නිරතුරුව නියඟ සහ ගංවතුර ඇති වේ. ඒවා සිදුවන නිරන්තරභාවය වැඩි වන අතර ඒවායේ තීව්‍රතාව ද වැඩි වේ. කුඩා ප්‍රදේශයකට ඇද වැටෙන තද වැසි හේතුවෙන් නායයාමේ අවදානම වැඩි වේ. එමගින් මිනිසුන් දැඩි පීඩාවකට ලක් වේ. ආපදා අවදානම අවම කිරීමට හා අපගේ ආපදා කළමනාකරණයේ වේගය හා ගුණාත්මකබව වැඩිකිරීම සඳහා අපි යෝග්‍ය පියවර ගන්නෙමු. අප විසින් ආපදා අවදානම අවම කිරීමේ අරමුදලක් ද නිර්මාණය කරනු ඇත.

## ගංවතුර කළමනාකරණය

ගංවතුර පාලනය කිරීම සහ නිරන්තර ගංවතුර කළමනාකරණය කිරීම සඳහා අප විසින් ප්‍රගාමී ක්‍රියාමාර්ග ගනු ලැබේ. අපගේ පළමු පියවර වන්නේ ගංගා ද්‍රෝණි සහ ජල පෝෂක ප්‍රදේශ අධිකාරියක් පිහිටුවීමයි. එයට සියලු ප්‍රධාන ගංගා ද්‍රෝණිවල වගකීම් දරණ නියෝජිතායතනවල නියෝජිතයන් ඇතුළත් වේ.

> සියලු නාගරික ඇළ මාර්ග, කැලණි, කළු, ගිං සහ නිල්වලා ගංගා ද්‍රෝණි හාරා පිරිසිදු කර දැඩි වර්ෂාව සහිත කාල පරිච්ඡේදවලට සූදානම් කරනු ලැබේ.

කැලණි ගඟේ ඉවුර ශක්තිමත් කර කඩුවෙල සහ මෝදර අතර බැම්මක් ඉදිකරනු ඇත. ජාතික වැසිජල අස්වනු නෙළාගැනීමේ ප්‍රතිපත්තිය යාවත්කාලීන කරනු ඇත. නාගරික අප ජලය අවම කරගැනීමට සහ නගර වීදි ගංවතුරට යටවීම එමගින් අවම කරනු ලැබේ. නාගරික ජලාපවහන පද්ධති උසස් තත්ත්වයට පත් කර මනා ලෙස නඩත්තු කිරීම තහවුරු කරනු ලැබේ.

## නායයාම් වැළැක්වීම

නායයාම් අවදානම සහිත ජලපෝෂක ප්‍රදේශවල ඉදිකිරීම් හා ගස් කැපීම දැඩිව පාලනය කරනු ලැබේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නියම කරනු ලබන අධි අවදානම් ප්‍රදේශවල රුක් රෝපණය කරනු ලැබේ. එම ප්‍රදේශවල ගස් කැපීම තහනම් කරනු ඇත.

## කසළ කළමනාකරණය

ශ්‍රී ලංකාව නිරතුරුව මුහුණ දෙන ස්වාභාවික ආපදාවන්ට අමතරව, කසළ ප්‍රමාණවත් පරිදි කළමනාකරණය කරගැනීමට අසමත් වීම හේතුවෙන් තවත් ආපදාවක් නිර්මාණය වෙමින් තිබේ. එය සිහි තබාගෙන අපි කසළ බලශක්ති මූලාශ්‍ර බවට පත් කරන ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජනය කරන්නෙමු. විශේෂයෙන් ම ගංගා ආශ්‍රිත ප්‍රදේශවල හා වෙරළබඩ ප්‍රදේශවල ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතුකිරීම හා බැහැර කිරීම අපි වඩා හොඳින් කළමනාකරණය කරන්නෙමු. සියලු පළාත් පාලන අධිකාරීන් විසින් කසළ මනා ලෙස වර්ග කිරීම තහවුරු කරන්නෙමු. දිවයින පුරා සෑම පළාත් පාලන ආයතන මට්ටමකදී ම කසළ අවම කිරීමේ, නැවත භාවිතා කිරීමේ, ප්‍රතිචක්‍රීයකරණයේ (Reduce-Reuse-Recycle) ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කරනු ලැබේ. ප්ලාස්ටික් එක් වරක් පමණක් භාවිතා කිරීම අවම කිරීම සඳහා නීති සම්පාදනය කරනු ලැබේ. එක් වරක් පමණක් පාවිච්චිය සඳහා කාබනික විකල්ප නිෂ්පාදනය හා බෙදාහැරීම දිරිගැන්වීම සඳහා දිරිදීමනා ලබාදෙනු ඇත. ප්ලාස්ටික් සහ වෙනත් නොදිරන කසළ ප්‍රජා මට්ටමේදී ප්‍රතිචක්‍රීයකරණය සඳහා දිරිදෙමින් එය ගෘහ කර්මාන්තයක් බවට පත් කරනු ඇත.

විශාල පහත් බිම් ගොඩකිරීම් සම්බන්ධයෙන් මතු වෙමින් තිබෙන ප්‍රශ්න පිළිබඳ විමර්ශනය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරනු ඇත. පුත්තලම ප්‍රදේශය ද ඒ අතර වේ. ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ තෘප්තියට ඉවහල් වන පාරිසරික වශයෙන් පිළිගත හැකි විසඳුම් පිරිනමනු ලැබේ.

# තරගකාරී ආර්ථිකයක්

## තරගකාරී ශ්‍රී ලංකාවකට තරගකාරී වෙළඳපොළක්

පෞද්ගලික අංශය වර්ධනයේ එන්ජිමයි. ශක්තිමත් සහ සෞභාග්‍යවත් දේශයක ධනය පුරවැසියන් සමග බෙදාගැනීම සඳහා පෞද්ගලික අංශය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක විය යුතු ය. කෙසේ වෙතත්, ආදිකල්පික නීති, සංවිධානමය සිරවීම් සහ රාජ්‍ය දූෂණ හේතුවෙන් පෞද්ගලික අංශයට විලංගු ලා තිබේ. එහෙයින් එයට සිය සත්‍ය හැකියාවන් අත්පත් කරගැනීමට බැරි වී තිබේ. අපි පෞද්ගලික අංශය ඉතා තරගකාරී, දැනුම මත පදනම් වූ, නවීන සහ තාක්ෂණය විසින් ධාවනය කරන අංශයක් බවට පත් කරන්නෙමු. අප මෙය සාක්ෂාත් කරගන්නේ ඉන්දීය සාගරයේ වෙළඳ හා නිෂ්පාදන මධ්‍යස්ථානයක් වීමේ අපගේ ඉපැරණි උරුමය කරා ආපසු යාමෙනි.

1977දී ආරම්භ කරන ලද ප්‍රතිසංස්කරණ අපි නැවත ආරම්භ කරන්නෙමු. වර්ධනය වේගවත් කළේ සහ ශ්‍රී ලංකාවේ දිළිඳුභාවය නැති කිරීමට කැපී පෙනෙන පරිදි ඉවහල් වූයේ එම ප්‍රතිසංස්කරණයි. රජයේ භූමිකාව වන්නේ, මූලිකව ම අධ්‍යාපනයේ සහ සෞඛ්‍යයේ ඵලදායිතාව ඇතිකිරීම සිදු කරන අතර, තරගකාරිත්වය සහතික කිරීම සඳහා බුද්ධිමත් හා දුර දක්නා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමයි. ස්ථාවර, විශ්වසනීය, තරගකාරී සහ වගවන ආයතන නඩත්තු කිරීම ඔස්සේ රජය විසින් පෞද්ගලික අංශයට උපකාර කරනු ඇත. අප විසින් මහේක්ෂ ආර්ථික පාලනය සහ ස්ථාවරභාවයට මූලිකත්වය දෙනු ඇත. කම්පනයන් සහ අවිනිශ්චිතතාවන් ඇති නොවන පරිදි අපි ප්‍රධාන ආර්ථික විචල්‍ය සහ උද්ධමනය, පොලී අනුපාතික සහ විනිමය අනුපාතික කළමනාකරණය කරන්නෙමු.

**රජය විසින් කරනු ලබන්නේ වඩාත් ම මූලෝපායික ව්‍යවසායන් පවත්වාගෙන යාම පමණි. එය ද වෘත්තිකභාවයෙන්, සුපිළිපන් සහ වගවීමෙන් යුතුව කරනු ඇත. දශක ගණනකට පසු පළමු වතාවට, බොහෝ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල අඩු වී තිබේ. එය සිදු වූයේ රජයේ ආර්ථික ස්ථායීකරණය, ආනයන අපනයන බදු යුක්තියුක්තකරණය, තරගකාරිත්වය වැඩිකිරීම සහ දූෂණ විරෝධී ව්‍යාපාර දියත් කිරීම හේතුවෙනි. අප මෙම වැඩසටහන් වේගවත් කරන විට, අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල තව දුරටත් අඩු වනු ඇත.**

ඵලදායිතාව වර්ධනය වන විට, සංවර්ධනය ද වේගවත් වේ. වේතන වැඩි වනු ඇත. නිර්මාණය වන සෞභාග්‍යය සියල්ලන් ඇතුළත් කරගනිමින් බෙදී යනු ඇති බව හා අවශ්‍ය තැන්වලදී නැවත බෙදී යනු ඇති බව අපි තහවුරු කරන්නෙමු. සියලු සහභාගිකයන්ගේ ගරුත්වය නගාසිටුවනු ලැබේ. වෙළඳපොළ ක්‍රියාත්මක වනු ඇත්තේ සාධාරණත්වයේ රාමුවක් තුළ ය. තරගකාරිත්වය සමාජ යුක්තියෙන් පදම් කරනු ඇත.

# ජාතික ප්‍රතිපත්ති

## ස්ථාවර සහ සංගත රාජ්‍ය පාලනය

අතීතයේදී රාජ්‍ය ප්‍රතිපත්ති සහ නියෝග සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමක අවිනිශ්චිතභාවයක් තිබිණි. ශ්‍රී ලාංකික දේශය උදෙසා වන සාමග්‍රිත, සියල්ල ඇතුළත් කරගන්නා මූලෝපායක් නොතිබිණි. නිරන්තරයෙන් උච්චාවචනය වන රාජ්‍ය විධිනියම විසින් ආර්ථිකයේ සහ සමාජයේ සෑම පැතිකඩක් සම්බන්ධයෙන් අස්ථාවරත්වයක් නිර්මාණය කරනු ලැබේ. එමගින් ආයෝජන අධෛර්යයට ලක් කරන අතර අභිලාෂයන් දුබල කරනු ලැබේ. රාජ්‍යයේ අවිනිශ්චිතභාවය නැති කිරීමට හා විශ්වාසය සහ ස්ථායීභාවය ඇති කිරීමට අපි අදහස් කරන්නෙමු. එමගින් ආර්ථික වර්ධනය හා සමාජ යහපැවැත්ම දිරිගැන්වෙනු ඇත.

- **පහත දැක්වෙන නීති පාදක ක්‍රමය නිර්මාණය කිරීමෙන් හා අනුගමනය කිරීමෙන් අපි ප්‍රතිපත්ති ස්ථාවරභාවය සහතික කරන්නෙමු. කෙටි දුර දකින දෘෂ්ටිවාදයන් හෝ දේශපාලන වාසි වෙනුවෙන් ඒවා වෙනස් කරන්නේ නැත.**
- **ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ භූමිකාව අපි ශක්තිමත් කරන්නෙමු. ජාතික ප්‍රතිපත්ති ලේඛන, පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ඇත.**
- **කලින් එකඟ වූ මූලෝපායන් සහ ප්‍රතිපත්ති කෙරෙහි බැඳීම හේතුවෙන් අමාත්‍යාංශවලට තනි තීරණ ගැනීමට තිබෙන හැකියාව සීමා කෙරෙනු ඇත.**
- **සෑම අමාත්‍යාංශයක ම පැවැත්ම සාධාරණීකරණය සඳහා නිල යුක්තියුක්තකරණයක් හඳුන්වා දෙනු ලැබේ.**
- **අවසාන වශයෙන් අප විසින් මූලික ප්‍රතිපත්ති පිළිබඳ ජාතික එකඟතාවක් ඇති කරගනු ලැබේ.**

උරුමකාරී :කැටීජභ* ව්‍යාපාර භාවිතාවන් හේතුවෙන් කුඩා ව්‍යාපාරවලට අවංක ලෙස තරග කිරීම දුෂ්කර වී තිබේ. ව්‍යාපාර අංශයට අපි යහපාලන භාවිතාවන් හඳුන්වා දෙන්නෙමු. ඒවා වඩා විනිවිද පෙනෙනසුළු, නියාමනය කරන ලද සහ වගවීමක් සහිත ඒවා ය.

බලසතු කරන ලද තරගකාරිත්ව කොමිසමක් අප විසින් හඳුන්වා දෙනු ඇත. එමගින් සියලු ව්‍යාපාර හා සංස්ථා අතර සම බිමේ තරගකාරිත්වය නිර්මාණය කරනු ලැබේ. අප විසින් නව විදුලි ප්‍රසම්පාදන ක්‍රමය පුළුල් කිරීමත් සමග රජයේ ප්‍රසම්පාදනයන් දූෂණ රහිත වනු ඇත.



**ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට සීමාවක් නැත**
එක්ව ගමන යමු.

# පර්යේෂණ හා සංවර්ධනය

අපගේ දේශය, එහි ජනයා සහ ඔවුන්ගේ ජීවනෝපායන් ශක්තිමත් සහ අනාගතයට ඔරොත්තු දෙන තත්ත්වයට පත් කිරීමට අපට අවශ්‍ය ය. ශ්‍රී ලංකාව අනාගතය වෙත යොමු කරන මාර්ගය මනා ලෙස සැකසීම හා සුරක්ෂිත කිරීම සඳහා අප විසින් නව පද්ධති, ක්‍රියාවලි සහ සේවා අධ්‍යයනය කර, අවබෝධ කරගෙන සංවර්ධනය කරනු ලැබේ.

මෙය අත්පත් කරගැනීම පිණිස අප විසින් ජාතික නවෝත්පාදන ආයෝජන අරමුදලක් (National Innovation Fund) පිහිටුවනු ලැබේ. එහි මූලික රාජ්‍ය ආයෝජනය රු. බිලියන 10කි. එමගින්, තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ සිට ජෛව සහ නැනෝ තාක්ෂණය දක්වා විවිධ ක්ෂේත්‍රවලට සහයෝගය ලබාදෙනු ඇත.

> අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය පෞද්ගලික අංශයේ වෘත්තිකයන්ගෙන් සමන්විත වනු ඇත. එයට අමතරව 2023 වන විට පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයෙන් 0.8 දක්වා වැඩි කීමට අප විසින් පියවර ගනු ඇත. විවිධ හවුල්කරුවන් සමග සහයෝගී පර්යේෂණ උදෙසා අප විසින් ජාතික ප්‍රමුඛ වැඩසටහනක් කෂයත් කරනු ඇත.

වානිජකරණ පර්යේෂණ වෙත අවධානය යොමු කරන විශ්වවිද්‍යාල පර්යේෂණ කණ්ඩායම්වලට සහයෝගය ලබාදීම සඳහා බීජෞෂණ (Incubation) මධ්‍යස්ථාන ඇතුළත් වන පරිදි හෝමාගම තාක්ෂණ නගරය පුළුල් කරනු ඇත. තරුණ නවෘකාරකයන්ට අනුප්‍රාණය සැපයීම පිණිස ජාතික විද්‍යා මධ්‍යස්ථානයකින් ද මෙම නගරය සමන්විත වනු ඇත. වර්ධනය සහ සංවර්ධනය දිගටම පවත්වාගෙන යාම සඳහා දැනුම් ආර්ථිකයක් නිර්මාණය කිරීමට අපි ඇපකැප වන්නෙමු.

අනාගතයේදී රජය පර්යේෂණ සහ සංවර්ධනය හසුරුවන ආකාරය හැඩගැස්වීම සඳහා අප විසින් මුලපිරුම් දෙකක් පිහිටුවනු ලැබේ. පර්යේෂණ හා සංවර්ධන සංවිධාන ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක වීම සීමා කිරීමට හේතු වන වර්තමාන ආයතනික සීමා සහ පරිපාලන සිරවීම් පිළිබඳ විවරණයක් සිදු කර නියමිත කාලසීමාව තුළ අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබේ. පවත්නා පොදු පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සහ නවෘකරණ ව්‍යවසාය සහායක වැඩසටහන් සහ ආයෝජන පිළිබඳ පොදු වියදම් විවරණයක් සිදු කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන ප්‍රතිසංස්කරණ සඳහා මූලෝපායක් සම්පාදනය කරනු ඇත.

# ඩිජිටල්කරණය සහ තොරතුරු තාක්ෂණය

පසුගිය දශක දෙක තුළ අප රටෙහි ඩිජිටල් සම්බන්ධිතභාවය විශාල පිම්මක් පැන්නේ ය. එයට බොහෝ දුරට නායකත්වය දෙනු ලැබුවේ පෞද්ගලික අංශය විසිනි. ශ්‍රී ලාංකික මහජනයා වැඩි වැඩියෙන් සමාජ මාධ්‍ය සහ අන්තර්ජාලය සමග සම්බන්ධ වන සමාජයක් බවට පත් කිරීම සඳහා පෞද්ගලික අංශය විසින් විශාල වශයෙන් ආයෝජනය කර තිබේ. එහෙත්, එසේ කිරීමට හැකි වූයේ රාජ්‍යය විසින් අනුග්‍රහය දක්වන ලද යටිතල පහසුකම් නිසා ය. පෞද්ගලික අංශය අන්තර්ජාල සම්බන්ධතාව නිසා විශාල වශයෙන් ඵල නෙළා ගත්තේ ය. බොහෝ අංශවල 'ඇප්' පාදක සේවා, විද්‍යුත් වානිජ්‍යය සහ අන්තර්ජාල ප්‍රවේශය ඔස්සේ පොදු ජනයාගේ ජීවිත වෙනස් කිරීමට ද පෞද්ගලික අංශය දායක විය. එහෙත්, මෙම ඩිජිටල් විප්ලවය සමග රජය අනුගත වූයේ ඉතා සෙමිනි. පූර්ණ වශයෙන් ඩිජිටල්කරණය වූ ලෝකයකට සූදානම් වීම

සහ අධ්‍යාපනය දීමත්, වඩා හොඳ සේවා සම්පාදනයත් සිදු වූයේ සෙමිනි. රජය දැන් ශ්‍රී ලංකාවේ ඩිජිටල්කරණයේ නායකත්වය ගත යුතු ය. මෙමගින් සියලු අංශවල වර්ධනය වේගවත් වනු ඇත. එමගින් පුරවැසියන්ට රාජ්‍ය සේවාවන්ට පහසු ප්‍රවේශය ද සලස්වනු ඇත. රජය ජනතාව සමීපයට ගෙන යනු ඇත. මෙම මුලපිරුමේ කොටසක් ලෙස වසර 2030 වන විට ශ්‍රී ලංකාව කාසි හා නෝට්ටු භාවිතා නොකරන රටක් බවට පත් වනු දැකීමට අපි කැමැත්තෙමු.

ශ්‍රී ලංකාව ඩිජිටල්කරණය කිරීමේ මාවතේ මෙකී දැවැන්ත ජයග්‍රහණ අත්පත් කරගැනීම අප පටන් ගන්නේ බිම් මට්ටමෙනි. අපි සෑම දිස්ත්‍රික්කයක ම තාක්ෂණික උද්‍යාන පටන් ගන්නෙමු. තාක්ෂණික සංගම් සමග එක්ව, අපි විශ්වවිද්‍යාල විෂයමාලාව වෙනස් කර තාක්ෂණික කර්මාන්ත අවශ්‍යතා සමග සම්බන්ධ කරන්නෙමු. ගෝලීය ප්‍රමිතිවලට අනුකූල මාර්ගගත අධ්‍යාපනික ආයතන විසින් තහවුරු කරන ලද අධ්‍යාපන සහතික සහ ලාංඡන රාජ්‍ය අංශය විසින් පිළිගනු ලැබේ. මෙම වැඩසටහන විවරණය කිරීමෙන් අනතුරුව වෙනත් පාඨමාලා දක්වා ද එය දීර්ඝ කරනු ලැබේ.

**විද්‍යාත්මක සහ ඉංජිනේරු නවෝත්පාදකයන් නිර්මාණයට හෝ නිෂ්පාදන, ද්‍රව්‍ය, විසඳීම් සහ ක්‍රියාවලි ප්‍රමාණවත් ලෙස වර්ධනය කිරීම සඳහා යෙදවෙන තාක්ෂණික සමාගම් සඳහා වන බද්ද අපි සියයට 5 දක්වා අපි අඩු කරන්නෙමු.**

# මිල අඩු දත්ත (data) සහ වේගවත් ගෙවීම්

තරගකාරිත්වය නිර්මාණ⊠ කිරීම සඳහා සහ ක්ෂේත්‍රයේ පහසු ප්‍රවේශය සඳහා අපි විනිවිද පෙනෙන ලෙස විදුලි සංදේශ සංඛ්‍යාත පරාසය වෙන්දේසි කරන්නෙමු. එහි අරමුණ වන්නේ පාරිභෝගික සේවාවන් සඳහා මිල අඩු කිරීම සහ බදු ගෙවන්නන්ට වැඩි වටිනාකමක් ලබාදීමයි. ප්‍රකාශ තන්තු තාක්ෂණය පාදක ගෘහස්ථ බ්‍රෝඩ්බෑන්ඩ් වෙළඳපොළ සඳහා අප විසින් සම බිමේ තරගකාරිත්වය ඇති කරනු ලැබේ. පාරිභෝගිකයන්ට අඩු මිලක් හා වඩා හොඳ නිෂ්පාදන හා සේවා ලබා දීම එහි අරමුණයි. ජාත්‍යන්තර ගෙවුම් මෙහෙයුම්කාර සමාගම් අඩු වශයෙන් දෙකක්වත් ශ්‍රී ලංකාවට ආකර්ශනය කරගනිමින් අප විසින් විදේශයන්හි සිට ගෙවීම් පහසු කරනු ඇත.

# විද්‍යුත් රාජ්‍ය පාලනය (e-governance)

ජාතික ඩිජිටල් ප්‍රතිපත්තියක් වෙනුවෙන් රජයේ සේවය තුළ ශ්‍රී ලංකා ඩිජිටල් සේවාවක් නිර්මාණය කරනු ලැබේ. සෑම අමාත්‍යාංශයක ම ව්‍යුහය තුළට ප්‍රධාන ඩිජිටල් නිලධාරීවරයකු පත් කරනු ලැබේ. එම අංශයේ ඩිජිටල් ප්‍රතිපත්තිය භාර වන්නේ එම නිලධාරීවරයාට ය. ජාතික අනන්‍යතා පත්‍රය වෙනුවට අපි ඩිජිටල් ජාතික හැඳුනුම්පතක් හඳුන්වාදෙන්නෙමු. අනන්‍යතා සොරකමට එරෙහිව අවශ්‍ය රැකවරණය වෙනුවෙන් දත්ත සහ පෞද්ගලිකත්ව ආරක්ෂණ පනතක් සම්මත කරන්නෙමු. සෑම ශ්‍රී ලාංකිකයෙකුට ම ජීවිත කාලය පුරා භාවිතා කළ හැකි ජංගම දුරකථන අංකයක් වෙන් කරන්නෙමු. එය විවිධ ටෙලිකොම් සේවා සපයන්නන් හරහා ක්‍රියාත්මක කරවාගත හැකි ය. රාජ්‍ය සේවය සඳහා සීමා රහිත අන්තර් ක්‍රියාකාරිත්ව වේදිකාවක් හඳුන්වා දෙනු ලැබේ. සියලු රාජ්‍ය සේවා විසින් 2025 වසර වන විට කඩදාසි රහිත විකල්ප හඳුන්වා දී ඒවා භාවිතය දිරිගන්වනු ඇත. සියලු නිදහස් වෙළඳාම්, කර්මාන්ත සහ විශේෂ ආර්ථික කලාප සම්පූර්ණයෙන් ම ඩිජිටල්කරණය කරනු ලැබේ.

# ව්‍යවසායකත්වය දිරිගැන්වීම

**නව ව්‍යාපාර සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වර්ධනයේ එන්ජිම ලෙස**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ව්‍යාපාරකරණය පහසු කිරීම පිණිස අප විසින් බදු සහන සපයනු ඇත. ඒ වෙනුවෙන් වටිනාකම එකතු කළ බද්ද (එකබ) අයකරන පහළ සීමාව වසරකට රු. මිලියන 12 සිට 50 දක්වා ඉහළ නංවනු ලැබේ. එකබ බද්ද ගෙවීම සඳහා මාසික ව්‍යාපාරික ආදායම රු. මිලියන හතරක් වීමේ අවශ්‍යතාව අහෝසි කරනු ලැබේ.

## අලුත් ව්‍යවසාය (startups)

තාක්ෂණික නව ව්‍යවසාය වෙනුවෙන් රුපියල් බිලියන 10ක ජාතික අවදානම් ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදලක් බිහිකරනු ලැබේ.

50 දෙනෙකුට වඩා රැකියාව කරන සමාගම්වල සමායතන බද්ද දැනටමත් සියයට 5 දක්වා අඩු කර තිබේ. මෙම අනුපාතිකය සියලු තාක්ෂණික නව ව්‍යවසායන්ට අදාළ වනු පිණිස අප විසින් අවම සේවා නියුක්තිය අඩු කරනු ඇත. බුද්ධිමය දේපල නිෂ්පාදනය කරන තාක්ෂණික සමාගම් වෙනුවෙන් ප්‍රතිලාභ බද්ද ඉවත් කරනු ලැබේ. දිස්ත්‍රික් මට්ටමේ ව්‍යවසායකත්ව, බීජෝෂණ (incubator) සහ වේගය වැඩි කරන මධ්‍යස්ථාන හඳුන්වා දී අවශ්‍ය පුහුණුව, මගපෙන්වීම, උපදේශකත්වය සහ ව්‍යාපාර උපදේශන සේවා සපයනු ලැබේ.

නව ව්‍යවසාය බොහෝ විට අධෛර්ය කරන දූෂණ නැති කරනු ලැබේ. අප විසින් නව ව්‍යවසාය සඳහා වන ක්‍රියාවලි විධිමත් කරනු ඇත. සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාල, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කම්කරු, රේගු දෙපාර්තමේන්තු සහ පාරිභෝගික ආරක්ෂණ අධිකාරියේ නව ව්‍යවසාය වෙනුවෙන් වෙන් වූ උපකාරක අංශ ආරම්භ කරනු ඇත. එම අංශවල ඒ වෙනුවෙන් ම වෙන් වූ නිලධාරියකු පුහුණු කර සේවයේ යොදවනු ලැබේ. එම නිලධාරියා නව ව්‍යවසායන් ආරම්භ කිරීමෙහිදී මතු වන ප්‍රශ්න, ඉල්ලීම් හා අවශ්‍යතා සම්බන්ධ උපදෙස් හා උපකාර සපයයි. විවිධ නියෝජිතායතන එකට එක් කර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරියක් බිහි කරනු ඇත. එමගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ටත් නව ව්‍යවසායන්ටත් ගැනුම්කරුවන්, වෙළඳපොළ සහ මූල්‍ය සේවා සමග සම්බන්ධ වීමට උපකාර කරනු ඇත.

නව ව්‍යවසායකයන්ට එකට වැඩ කිරීමේ සමාන පහසුකම් සහිත හෝ සුළු පරිමාණ සාමූහික වැඩ අවකාශ අඩු මිලට සැපයීම සඳහා පියවර ගනු ලැබේ.

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අපනයනකරුවන්ට සහාය සැපයීමත් සමග අප විසින් සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන් සහ නව ව්‍යවසායකයන් ද දිරිමත් කරනු ලැබේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙනුවෙන් එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා යටතේ ලබා දුන් ණයවල පොලී අනුපාතික තවදුරටත් අඩු කරනු ලැබේ. ණය ඇපකර වැඩසටහනක් ද හඳුන්වා දෙනු ඇත.

- සෑම අමාත්‍යාංශයකම සහ දෙපාර්තමේන්තුවක ම ප්‍රසම්පාදනවලදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙතින් කරන මිල දී ගැනීම් වෙනුවෙන් අයවැය ප්‍රතිපාදනයක් වෙන් කිරීමෙන් අපි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට උපකාර කරන්නෙමු. එහිදී ආරම්භයක් ලෙස, රාජ්‍ය ප්‍රසම්පාදනවල මේ වෙනුවෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදනය රු. බිලියන 60ක් වනු ඇත.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට හා නව ව්‍යවසායකයන්ට භාවිතා කළ හැකි, ගොඩනැගිලි, බලශක්තිය සහ ජලය, අන්තර්ජාල සම්බන්ධය සහ අපද්‍රව්‍ය කළමනාකරණය සහිත කලාපීය මධ්‍යස්ථාන නිර්මාණය කරනු ඇත.

- එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව සහ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සමග සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට උපකාර කිරීම පිණිස අවශ්‍ය නියාමන විධිවිධාන සංශෝධනය කරනු ඇත.

**අසාධාරණ වෙළඳ භාවිතාවන්ගෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ආරක්ෂා කරගැනීම සඳහා මෑතදී සම්මත කරන ලද නික්ෂේප විරෝධී නීති තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ.**

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක වීමෝල් වෙනුවෙන් අප විසින් දැනටමත් සම බිමේ තරගකාරී ක්ෂේත්‍රයක් නිර්මාණය කර තිබේ. අති සාර්ථක ශක්ති නියාමන වැඩසටහන අනුව යමින්, අවශ්‍ය විශ්ලේෂණ කිරීමෙන් පසු, වෙනත් භෝග හා කිරි ගොවිතැන වෙනුවෙන් ද අවශ්‍යතාව පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත. සමාජ ව්‍යවසායකයන් දිරිගැන්වීම සඳහා නව ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ඇත. පළමු වරට ව්‍යවසායකත්වයට පිවිසෙන කාන්තාවන්ට විශේෂ දිරිගැන්වීම් සැපයේ.

- කළු ගල්, මැටි, වැලි, රන් ආදිය ආශ්‍රිත සම්ප්‍රදායික කර්මාන්ත සුරක්ෂිත කිරීමට අපි සෑම ප්‍රයත්නයක් ම දරන්නෙමු. මෙම කර්මාන්ත මුහුණ දෙන අභියෝග හඳුනාගෙන එම කර්මාන්ත සමග සම්බන්ධ වෙමින් අවශ්‍ය විසඳුම් ලබාදෙනු ඇත. ඔවුන්ට කර්මාන්තයේ පාරිසරික තිරසරභාවය ඇති කරන ව්‍යාපාර භාවිතාවන් වෙත යොමුවීම සඳහා ද දිරිගන්වනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය සහාය, මාර්ගෝපදේශකත්වය සහ පුහුණුව ආදිය සපයනු ලැබේ.



# තිරසර රාජ්‍ය ව්‍යවසාය

රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසායන් අප විසින් ප්‍රතිව්‍යුහගත කරනු ඇත. එමගින් ඒවා ස්වයංව තිරසර වනු ඇත. ඒවා බදු ගෙවන්නන්ට බරක් වන්නන් හෝ ජාතික සම්පත් හිස් කරන්නන් හෝ නොවනු ඇත. ඒවාට වෘත්තිකමය ලෙස නායකත්වය ලැබෙන බවට, නිර්දේශපාලනික බවට සහ විනිවිද පෙනෙනසුළු බවට සහතිකයක් රජය විසින් සපයනු ලැබේ.

**මූලික වශයෙන් වානිජ පදනමකින් පවත්වාගෙන යන, රජයට හිමි ව්‍යවසාය වෘත්තිකමය ලෙස කළමනාකරණය කරනු ලබන භාරකාර සමාගමක් යටතට පත් කරනු ඇත. කොළඹ කොටස් වෙළඳපොළේ ලියාපදිංචි සමාගම් කරන පරිද්දෙන් ම රජයට අයත් සියලු ව්‍යවසාය විසින් ද සෑම කාර්තුවකට ම වරක් විගණනය කරන ලද ගිනුම් ප්‍රසිද්ධ කළ යුතු ය.**

සුපිළිපන්භාවය පිළිබඳ සුදුසුකම් සහිත වෘත්තිකයන් රජයට හිමි ව්‍යවසායන්ට නායකත්වය දීම සඳහා පත් කරනු ඇත. ස්වාධීන කොමිසමකින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරුන්ට පැහැදිලි නිර්ණායක ලබාදෙනු ඇත.

රජයට අයත් ව්‍යවසායවල සියලු අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් ස්වාධීන ව්‍යුහයක අනුමැතියට යටත් වනු ඇත. එමගින් පත්වන්නන් සුපිළිපන්භාවය සහිත, දක්ෂ පුද්ගලයන් වීමට වගබලාගනු ලැබේ. ඇමතිවරුන්ට තමන් යටතේ ඇති ආයතනවලට තම පවුලේ සාමාජිකයන් හා ඥාතීන් පත්කිරීමට ඉඩ දෙනු නොලැබේ. හිමිකරුවන්ගේ, මෙහෙයුම්කරුවන්ගේ සහ නියාමනය කරන්නන්ගේ භූමිකාවන් වෙන් කිරීම මගින් බැඳියාවන් සම්බන්ධ ගැටුම් විසඳනු ඇත.



# වෙළඳාම සහ ආයෝජන

## අපනයනය විසින් ඇති කරනු ලබන වර්ධනය

අප විසින් වහාම ජාතික අපනයන මූලෝපායක් ඇති කරනු ලැබේ. අපි ආනයන හා අපනයන බදු 1990 වසරේ තිබුණු මට්ටමට නැවත ගෙන යන්නෙමු. එමගින් ශ්‍රී ලංකාවේ අපනයන නැවත වරක් ලෝක වෙළඳපලේ තරගකාරී තත්ත්වයට පත් කරනු ලැබේ. සම්ප්‍රදායික අපනයන වන තේ හා ඇඟලුම්වලින් ඔබ්බට විවිධාංගීකරණය වීමට අපට හැකියාව ලැබෙනු ඇත. අපනයන ආදායමෙන් අය කරනු ලබන ආර්ථික සේවා ගාස්තුව ද අඩකින් අඩු කරනු ලැබේ.

ජපානය, චීනය, දකුණු කොරියාව සහ සිංගප්පූරුව ආදී ආසියාතික රටවල් දරිද්‍රතාව දුරු කර සංවර්ධිත දේශයන් බවට පරිවර්තනය වුණේ අපනයනය විසින් ඇති කරනු ලබන වර්ධනය ඔස්සේ ය. ශ්‍රී ලංකාවේ පවා දරිද්‍රතාව නැතිවීම සිදු වූයේ 1977දී ආරම්භ වූ විවෘත ආර්ථික ප්‍රතිසංස්කරණවල සෘජු ප්‍රතිඵලයක් ලෙස ය. අපගේ වත්මන් අපනයන අසාර්ථකත්වයට හේතුව 2005 සහ 2015 අතර කාලයේදී සිදු වූ ආපසු හැරීම විය හැකි ය. අප විසින් අපගේ අහිමි වූ උරුමය වන ඉන්දීය සාගරයේ වෙළඳ මධ්‍යස්ථානය නැවත බිහි කරනු ලැබේ. අපි ගෝලීය වෙළඳපොළ සමග සම්බන්ධ වන්නෙමු.

අලුත් වෙළඳපොළට නව නිෂ්පාදන අපනයනය කරනු ලැබේ. වර්තමානයේ වැඩියෙන් ම කරනු ලබන අපනයන වන්නේ තේ සහ රෙදිපිළි ය. අපගේ අපනයනවලින් අඩකට වඩා මිල දී ගන්නේ යුරෝපය සහ එක්සත් ජනපදය විසිනි. අඩු වැටුප් ගෙවන සරල නිෂ්පාදන විසින් ආධිපත්‍යය දරන අපනයන වෙළඳාමක සිට කර්මාන්ත සේවකයන්ට ඉහළ වැටුප් ගෙවන අපනයන කර්මාන්ත වෙත අපි පරිවර්තනය වන්නෙමු.

මෙම පරිවර්තනය සඳහා ඒකපාර්ශ්වීය, ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය වෙළඳ මුලපිරුම් අවශ්‍ය ය. අපගේ අපනයන විවිධාංගීකරණය වෙනුවෙන් සහ අපනයන සම්බන්ධ බදු නොවන බාධක සම්බන්ධයෙන් නිදහස් වෙළඳ ගිවිසුම් ඉතා වැදගත් ය. රෙදිපිළි හා ගම්මිරිස් වෙනුවෙන් ඉන්දියාවේ කෝටාව වැනි කරුණු බදු නොවන සම්බාධකයි. තායිලන්තය නිදහස් වෙළඳ ගිවිසුම් 14කට ද, මැලේසියාව සහ දකුණු කොරියාව 17 බැගින් ද, සිංගප්පූරුව 25ක් ද අත්සන් කර තිබේ. ශ්‍රී ලංකාවට නිදහස් වෙළඳ ගිවිසුම් ඇත්තේ හයක් පමණි. අපගේ 'පළමුව ශ්‍රී ලංකාව' විදේශ ප්‍රතිපත්තිය අනුව අප විසින් මෙම ප්‍රශ්නයට විසඳුම් දෙනු ඇත. ඉන්දීය සාගරයේ සහ ආසියාවේ අපගේ සමීපතම අසල්වැසියන් සමග නිදහස් වෙළඳ ගිවිසුම් ඇතිකරගනු ලැබේ. ජනාධිපතිවරයා විසින් සෑම ගිවිසුමක ම සමතුලිතබව සහ එහි ශ්‍රී ලංකාවට ඇති වටිනාකම පෞද්ගලිකව විවරණය කරනු ඇත. දිගුකාලීන ප්‍රතිපත්ති හා දැක්ම ඔස්සේ නිෂ්පාදනය පාදක ආර්ථිකයක් නිර්මාණය කිරීමට අපි ඇපකැප වන්නෙමු.

- **සුළු හා මධ්‍ය පරිමාණ අපනයන ව්‍යවසායකයන් කෙරෙහි අප විසින් ඉහළ ප්‍රමුඛතාවක් ලබාදෙනු ඇත.**
- **ව්‍යාපාර කිරීම අපහසු තත්ත්වයට පත් කරන අපගේ සංකීර්ණ සහ බොහෝ විට විනිවිද නොපෙනෙන ආනයන අපනයන රෙගුලාසි විනිවිද පෙනෙනසුළු තත්ත්වයට ගෙන ඒම හා ඩිජිටල්කරණය කරනු ලැබේ.**
- **රේගුව ඇතුළු ආනයනය හා අපනයනය සම්බන්ධ සියලු නියෝජිතායතන සම්පූර්ණයෙන් ම ඩිජිටල්කරණය කරනු ලැබේ. ජාතික ඒකීය කවුළු බිහිදොර පුළුල් කර ලේඛනගත කිරීම හා ප්‍රවේශය විධිමත් කරනු ලැබේ. සෑම දිස්ත්‍රික්කයකින් ම අලුත් අපනයනකරුවන් 100ක් සංවර්ධනය කිරීමට ඉලක්ක කරනු ඇත. මෙම අලුත් අපනයනකරුවන්ට ජාත්‍යන්තර වෙළඳපොළ අල්ලාගැනීමේදී මුහුණ දෙන්නට සිදු වන අභියෝග ජයගැනීම සඳහා සහාය ලබා දෙන්නෙමු.**

- **මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තවල වටිනාකම් එකතු කිරීම සඳහා රන් ආනයන බද්ද හා අපනයන බදු සහන නැවත විවරණය කිරීමෙන්, මැණික් කපන උපකරණ සදහා බදු අඩු කිරීමෙන්, හුවමාරු වෙළඳපොළක් (trading exchange) නිර්මාණය කිරීමෙන් සහ ක්ෂේත්‍රය සදහා එක තැනකින් සේවා ලබාගැනීමේ පහසුව ඇති කිරීමෙන් උපකාර කරනු ලැබේ.**
- **එසේ එක් තැනකින් ලබාගත හැකි සේවා අතර විද්‍යාගාර සහතික සහ පුහුණුව ද තිබේ. මෙම ක්‍රියාවලිය ධාවනය කරවීම සදහා ජනාධිපති කාර්යසාධන බලකායක් පත් කරනු ලැබේ. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ප්‍රතිව්‍යුහගත කරනු ලැබේ.**

# විශේෂ ආර්ථික කලාප

බොහෝ අපනයන නිෂ්පාදකයන්ට ඉඩම්, ගොඩනැගිලි, ජලය, විදුලිය සහ අපද්‍රව්‍ය බැහැරකිරීම සම්බන්ධයෙන් ද ප්‍රශ්න තිබේ. කලින් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු විසින් කටුනායක, බියගම සහ කොග්ගල නිදහස් වෙළඳ කලාප පිහිටුවන ලදී. දැන් ඒවා ප්‍රමාණවත් නැත. මෙම කලාප ඒවායේ තිබෙන ධාරිතාවෙන් ක්‍රියාත්මක වන නමුදු, 2002 සිට වර්තමාන රජය දක්වා ම කිසිවෙකු එවැනි කලාපයක් විවෘත කිරීමට සමත් වී නැත. ආර්ථික සංවර්ධනය සඳහා නව යටිතල පහසුකම් අවශ්‍යව තිබේ. අපි ඒවා සපයන්නෙමු.

**අප විසින් ජනතාව වෙනුවෙන් විශේෂ ආර්ථික කලාප පිහිටුවනු ඇත. සෑම පළාතකට ම විශේෂ ආර්ථික කලාපයක් බිහි වේ. පහසුකම් සහිත එම කලාප නිෂ්පාදකයන්ගේ යන්ත්‍ර සූත්‍ර භාරගැනීමට සූදානම් ය.**

මෙම සුවිසල් ඉදිරි පිම්ම සමග අපනයනකරුවන් සඳහා දැනට තිබෙන නිදහස් වෙළඳ කලාප දෙගුණ කිරීමට අපට හැකි වනු ඇත. හම්බන්තොට කර්මාන්ත කලාපය පුළුල් කිරීම ද වේගවත් කරනු ඇත.

අපගේ ග්‍රහලෝකයේ තිබෙන හොඳම මිනිරන් තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ය. අප ජාතික අපනයන මූලෝපායේ කොටසක් ලෙස මිනිරන් ඉතා වැදගත් අමුද්‍රව්‍යයක් ලෙස සලකා ඒවා තොග වශයෙන් අපනයනය නියාමනය කරනු ඇත. ග්‍රැෆීන්, ලිතියම් බැටරි, ඉන්ධන කෝෂ සහ සූර්ය සහ න්‍යෂ්ටික බලශක්ති උපකරණ වැනි ග්‍රැෆීන් පදනම් කරගත් සංකීර්ණ නිෂ්පාදන වෙනුවෙන් ආයෝජනය කරමින් අපි අප රටේ සිව්වන කාර්මික විප්ලවය ආරම්භ කරන්නෙමු.

ඇඟලුම් කර්මාන්ත අංශය රටේ ඉතා වැදගත් අංශයකි. සෑම පළාතක ම ඇඟලුම් ව්‍යාපාර උද්‍යාන බිහිකිරීමෙන් අපි එයට උපකාර කරන්නෙමු. පුනර්ජනනීය බලශක්ති තම නිෂ්පාදන පද්ධති තුළ භාවිතා කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදකයන්ට විශේෂ දිරිගැන්වීම් සපයනු ලැබේ.


# මූල්‍ය වෙළඳපොළ

ව්‍යාපෘති සඳහා දිගු කාලීන ණය මුදල් අවශ්‍ය වේ. අතීතයේ දී ශ්‍රී ලංකාව තුළ ජාතික සංවර්ධන බැංකුව සහ DFCC බැංකුව තිබූ අතර ඒවා කාලයත් සමග වානිජ බැංකු බවට පරිවර්තනය විය. මෙම පරතරය පියවා ගැනීම සඳහා අපි නව දේශීය සංවර්ධන බැංකුවක මෙහෙයුම් ආරම්භ කරන්නෙමු.

## කොළඹ අන්තර්ජාතික මූල්‍ය නගරය

අපගේ භූ මූලෝපායික පිහිටීම අනුව, ඉහළ වැටුප් සහිත රැකියා උත්පාදනය කිරීම සඳහා සංකීර්ණ භාණ්ඩ නිෂ්පාදනය කිරීම පමණක් නොව සංකීර්ණ සේවාවන් කෙරෙහි ද අපි අවධානය යොමු කරන්නෙමු. මූල්‍ය සේවා, මූල්‍ය හා තාක්ෂණික, තොරතුරු තාක්ෂණය, දැනුම පදනම් කරගත් සේවාවන් මෙන්ම කලාපීය මූලස්ථාන සහ ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපනය මෙයට ඇතුළත් වේ. කොළඹ වරාය නගරයේ හෙක්ටයාර් 269 ක නව ඉඩම් ගොඩකිරීම දැන් අවසන්ය.

කොළඹ වරාය නගර සීමාව ආවරණය වන පරිදි සේවාවන් සඳහා විශේෂ ආර්ථික කලාපයක් නිර්මාණය කිරීම සඳහා අපි කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර පනත සම්මත කරන්නෙමු. මෙමගින් කොළඹ අන්තර්ජාතික මූල්‍ය නගරය සහ වරාය නගරය වෙත ආයෝජන වේගවත් කිරීම වෙනුවෙන් ශක්තිමත් ප්‍රතිපත්තිමය, නෛතික හා පරිපාලන රාමුවක් සහ තරගකාරී බදු ක්‍රමයක් ද ක්‍රියාත්මක කරනු ඇත.



# ප්‍රාග්ධන වෙළඳපොළ

අපි ප්‍රාග්ධන වෙළඳපොළවල යහපාලනය ශක්තිමත් කරන්නෙමු. ප්‍රාග්ධන වෙළඳපොළවල් හොඳින් නියාමනය කෙරෙනු ඇති අතර සියලුම පාර්ශ්වකරුවන්ට කාර්යක්ෂමභාවය හා ආරක්ෂාව සැපයෙනු ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම, ධාරිතාවය ගොඩනැගීම සහ අවංක නායකත්වය සහතික කිරීම වෙනුවෙන් නව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කිරීම වේගවත් කරන්නෙමු. විනිවිදභාවය වැඩි කිරීම, සිල්ලර ආයෝජකයින්ට වැඩි ප්‍රවේශයක් ලබා දීම, රජයට වඩා හොඳ ප්‍රතිලාභ ලබා ගැනීම සහ වෙළඳපළ ද්‍රවශීලතාවය වැඩි දියුණු කිරීම සඳහා අපි කොළඹ කොටස් වෙළඳපොලේ රජයේ සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම වේගවත් කරන්නෙමු.

# ණය කළමනාකරණය

රාජ්‍ය ණය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අපි ස්වාධීන ණය කාර්යාලයක් පිහිටුවන්නෙමු. විදේශ ණය ගැනීම් නියාමනය කිරීමෙන් සහ අපගේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමෙන් අපි අපගේ ආර්ථික ස්වෛරීභාවය ආරක්ෂා කරන්නෙමු. මෙමගින් අප සැමවිටම ලාභ දායකම ප්‍රභවයන්ගෙන් ණය ලබා ගන්නා බව සහතික කරවනු ඇත.

# මූල්‍යකරණය වූ සමාජයක නිදහස

**ශ්‍රී ලංකාව මූල්‍යකරණය වූ සමාජයක් බවට පත්වෙත්ම, එයට සහාය පිණිස, 2019 නොවැම්බරයට පෙර, රුපියල් මිලියනයකට වඩා අඩු ගෙවීම් පැහැර හරින ලද සියලු දෙනාට ණය තොරතුරු කාර්යාංශයේ (CRIB) ලැයිස්තුවෙන් එක් අවුරුද්දකට ඉවත් කිරීමක සහනය ලබා දෙන්නෙමු.**

ශ්‍රී ලංකාව පුරා සමුපකාර යථා තත්ත්වයට පත් කිරීම සඳහා අප දැනටමත් සෘජු පියවර ගෙන ඇති අතර, ක්ෂුද්‍ර මූල්‍ය පනත සම්මත වීමත් සමග අපි සමුපකාර බැංකු පුනර්ජීවනය කිරීමට සහ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් නියාමනය කිරීමට කටයුතු කරන්නෙමු. මෙම පනත ග්‍රාමීය කාන්තාවන් ගිනි පොලීකරුවන් සහ කෘෘර ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් මත යැපීම තුරන් කිරීමේ මාර්ගයක් වනු ඇත.

# සාධාරණ හා යුක්ති සහගත බදුකරණය

අද වන විට රජය විසින් එකතු කරනු ලබන සෑම රුපියලකින්ම ශත 80 ක් ලැබෙන්නේ භාණ්ඩ හා සේවා වලිනි. මෙම වක්‍ර බදුකරණය අපගේ දුප්පත්ම පුරවැසියන්ට බලපාන අයුරින් භාණ්ඩ හා සේවා යන දෙකෙහිම මිල ඉහළ දමයි. එබැවින් අපි වක්‍ර බදු සියයට 60 දක්වා අඩු කරන්නෙමු.

- **ඒ වෙනුවට අපි ආදායම් බදු, දේපළ බදු සහ වෙනත් ප්‍රගතිශීලී බදු ක්‍රම හරහා සෘජු බදුකරණය ශක්තිමත් කරන්නෙමු.**

- **සෘජු බදුකරණය ශක්තිමත් කිරීම මඟින් ආදායම් බදු අනුපාත ඉහළ නැංවීම ජනතාවට බරක් නොවනු ඇති නමුත් එය ජාතික බදු රෙගුලාසිවලට අනුකූල වීම වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.**

- **මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස, අපි විදේශ මුදල් ගිණුම් වලින් පොලිය සඳහා වන බද්ද සහ දරුවන්ගේ ඉතිරි කිරීමේ ගිණුම් සඳහා වන බද්ද ඉවත් කර ඇත්තෙමු.**

- **රඳවා ගැනීමේ බද්ද සහ වෙනත් බදු අපි සම්පූර්ණයෙන්ම වෙනස් කර සරල කරන්නෙමු.**

- **ඔබ උපයන විට බදු ගෙවීම ආරම්භ කළ යුතු සීමාව මසකට රු. 100,000 සිට මසකට රු. 150,000 ආදායම දක්වා ඉහළ දමන්නෙමු. උපයන විට ගෙවීමේ බදු අදාළවන පරාසය පුළුල් වනු ඇත.**

- **බදු ප්‍රතිපත්තියේ නිශ්චිතභාවය ද අපි සහතික කරන්නෙමු. වැඩිදියුණු කළ අනුකූලතාවයෙන්, වසර දෙකක් තුළ වැට් බද්ද සියයට 15 සිට සියයට 12.5 දක්වා අඩු කිරීමට අපි බලාපොරොත්තු වෙමු.**

- **ප්‍රාග්ධන ක්ෂයවීම් දීමනාව අපි වහාම ක්‍රියාත්මක කරන්නෙමු. ඒ යටතේ ඩොලර් මිලියන 100 ක් දක්වා වූ සියලුම ආයෝජන සඳහා 100%ක ක්ෂය වීමට අමතරව අතිරේක 100%ක ප්‍රාග්ධන දීමනාවක් ලැබෙනු ඇත.**

- **ඩොලර් මිලියන 150 ට වැඩි ආයෝජන සඳහා 150%ක අතිරේක ප්‍රාග්ධන දීමනාවක් ලැබෙනු ඇත.**

# ශ්‍රම නම්‍යශීලීභාවය

## සුබසාධනය සහ නවීන ශ්‍රම බලකාය

වඩාත් නම්‍යශීලී ශ්‍රම බලකායක් සඳහා සේවා යෝජකයන්ගේ අවශ්‍යතා සපුරාලීමට එම අවශ්‍යතා කම්කරුවන්ගේ සුබසාධනය සහ ආරක්ෂාව සඳහා වන අවශ්‍යතා සමග ප්‍රතිසන්ධානය මගින් අපි පෞද්ගලික අංශයේ ශ්‍රම පද්ධතිය නවීකරණය කරන්නෙමු, සියලු පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර නව රැකියා උත්පාදනය කිරීම සහ අනාරක්ෂිත අවිධිමත් සේවකයින් සුරක්ෂිත විධිමත් අංශයට ගෙනයාම දිරිගැන්වීම සඳහා අපි නව හා පුළුල් කම්කරු නීතියක් සකස් කරමු.

**මෙම කම්කරු නීතිය මඟින් වෙළඳපළ තුළ ඇති වෙනස්කොට සැලකීම කිරීම ඉවත් කෙරෙනු ඇත. මිනිස්බල නියෝජිතායතන නියාමනය කරනු ඇත. ප්‍රතිචාර දැක්වීම වැඩි දියුණු කරනු ඇත.**

එමගින් සේවකයා ආරක්ෂා කරන අතරම ශ්‍රම වෙළඳපොළවල් වඩාත් නම්‍යශීලී වීමට ඉඩ සලසන විරැකියා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට ද අපට හැකි වේ. ශ්‍රම බලකායේ ආරක්ෂාව සහ සුබසාධනය ශක්තිමත් කිරීම සහ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ නම්‍යශීලීභාවය ඉහළ නැංවීම සඳහා, කොළඹ වැනි නාගරික මධ්‍යස්ථාන වෙත රැකියා සඳහා යන තරුණ කම්කරුවන් සඳහා ගුණාත්මක, සුවපහසු, ආරක්ෂිත, නේවාසිකාගාර වැනි අඩු වියදම් නිවාස ඉදිකිරීමට අපි පෞද්ගලික අංශය සමග එක්වී කටයුතු කරන්නෙමු. රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම විශ්‍රාම යන වයස අවුරුදු 3 කින් වැඩි කිරීමට අපි යෝජනා කරමු.



# බුද්ධි ගලනය (Brain Drain) ආපසු හැරවීම

ඈත පෙරදිග සිට මැදපෙරදිග හා යුරෝපය සහ උතුරු ඇමරිකාව දක්වා ලොව පුරා විසිරී සිටින හා විදේශගතව වැඩ කරන ශ්‍රී ලාංකිකයෝ විශාල සංඛ්‍යාවක් සිටිති. බොහෝ දෙනෙක් වසර ගණනාවක් තිස්සේ විදේශීයව ස්ථාපිත වී ඇති අතර, සැලකිය යුතු විදේශගත ශ්‍රී ලාංකීය ප්‍රජාවක් නිර්මාණය වී තිබේ. මෙම විදේශගත සහ සංක්‍රමණික අයගෙන් විශාල සංඛ්‍යාවක් ඉහළ සුදුසුකම් සහිත ආකර්ෂණීය කුසලතා එකතුවක් ලබා ඇති අය වේ. ශ්‍රී ලංකාව සංවර්ධනය වන විට හා නවීකරණය වන විට, අපට මෙහි සහ විදේශයන්හි සිටින සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ සහභාගීත්වය අවශ්‍ය වන අතර, විදේශගතව සිටින අය ශ්‍රී ලංකාවට නැවත පැමිණීම රට මුහුණ දෙන කුසලතා හිඟයන් පියවා ගැනීමට උපකාරී වනු ඇත.

විවිධ සමාජ-ආර්ථික ක්ෂේත්‍රයන්හි නව්‍යකරණ භාවිතයන් සඳහා දැනුම හුවමාරු කර ගැනීමේ සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විදේශයන්හි සහ රට තුළ වෙසෙන ශ්‍රී ලාංකික වෘත්තිකයන්ගේ ක්‍රියාකාරී ලේඛනයක් අපි ස්ථාපිත කරන්නෙමු. විධිමත් නව්‍යකරණ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සඳහා මෙම ලේඛනය භාවිතා කෙරෙනු ඇති අතර, ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සෘජුවම සම්බන්ධ පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම වෙනුවෙන් ලේඛනයේ ලියාපදිංචි වූවන් දිරිමත් කරනු ලැබේ. මෙම නව්‍යකාරකයින්ගේ සංසදය තරුණ තරුණියන් අතර සංවර්ධන වැඩසටහන් සහ ව්‍යවසායකත්වය දිරිගැන්වීමේ වේදිකාවක් ලෙස යොදා ගැනේ.

ද්විත්ව පුරවැසිභාවය සඳහා සරල කරන ලද මාර්ගගත අයදුම්පතක් හඳුන්වා දීමෙන් මෙම විසිරී සිටින ශ්‍රී ලාංකිකයන්ට නැවත සියරට පැමිණීම, මෙරට ජීවත්වීම, මෙරට වැඩ කිරීම සහ ඔවුන්ගේ මව්බිමෙහි ආයෝජනය කිරීම පහසු කරවන්නෙමු;

අතීතයේ මෙය බොහෝ විට අපැහැදිලි තත්ත්වයක් සහ සංකීර්ණ ක්‍රියාවලියක් විය. ශ්‍රී ලංකා උරුමය සහිත සෑම පුද්ගලයෙකුම, ඔවුන්ගේ වර්තමාන පදිංචි ස්ථානය සහ පුරවැසිභාවය නොසලකා, ශ්‍රී ලංකාවේ විදේශීය පුරවැසියෙකු ලෙස හිමිකම් සහතිකයකට සුදුසුකම් ලබයි.

විදේශීය ජාතිකයන් වන ශ්‍රී ලාංකිකයන්ගේ කලත්‍රයන් ද බොහෝ විට ඉහළ සුදුසුකම් ඇති සහ දක්ෂ අය වේ. එහෙත් බොහෝ විට පිරිමි සහ ගැහැණු කලත්‍රයන්ගේ අයිතිවාසිකම් අතර ඇති විෂමතාව සමග ශ්‍රී ලංකාවේ සේවය කිරීමට ඔවුන්ට ඇති නෛතික අයිතිය අපැහැදිලි ය. ශ්‍රී ලංකාවේ වසර තුනක පදිංචියකින් පසු ඔවුන්ට ද්විත්ව පුරවැසිභාවය ලබා දීමෙන් අපි මෙය නිවැරදි කරන්නෙමු.

## කුලී රථ හා ත්‍රී රෝද රථ

පොදු ප්‍රවාහන පද්ධතියේ හිඩැස් පියවීම සඳහා කුලී රථ සහ ත්‍රිරෝද රථ දැනට වැදගත් සේවාවක් සපයයි. අපගේ නාගරික යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කර නවීකරණය කර කාර්යක්ෂම මාර්ග හා දුම්රිය සේවා ජාලයක් සපයන විට, ගමනේ අවසාන සැතපුම් ප්‍රමාණය ගමන්කිරීමේදී කුලී රථ සහ ත්‍රිරෝද රථ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.

අපි වෙනත් වෘත්තීය නිපුණතා පුහුණුවක් ලබා ගැනීමට අපේක්ෂා කරන කුලී රථ හා ත්‍රිරෝද රථ රියදුරන්ට රු. 300,000ක ඇප රහිත ණය මුදලක් ලබා දෙන්නෙමු.

# නාගරික තදබදය විසඳීම

## වඩා හොඳ රථවාහන කළමනාකරණයක්

ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන පද්ධතිය යාවත්කාලීන වීම වඩාත්ම අවශ්‍ය පද්ධතීන්ගෙන් එකකි. පොදු ප්‍රවාහන ජාලයේ අසාර්ථකත්වයේ ප්‍රතිඵලය වී ඇත්තේ ශ්‍රී ලංකාවේ පුරවැසියන් කුලී රථ ස්වරූපයෙන් විකල්ප ප්‍රවාහන පහසුකම් සෙවීම හෝ ඔවුන්ට ලබා ගත හැකි ඕනෑම වාහනයක් මිල දී ගැනීමෙන් තමන්ගේම ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමයි. අඩු වියදම් කුලී රථ සහ පෞද්ගලික වාහනවල මෙම දැවැන්ත වැඩිවීම අපගේ නාගරික වීදි සහ මංතීරුවල ධාරිතාව ඉක්මවා යන අතර තවදුරටත් ප්‍රමාද වීමට හේතු වේ. රියදුරු බලපත්‍ර සඳහා ඉල්ලුම් කරන පුද්ගලයින්ගේ ශීඝ්‍ර වැඩිවීම හේතුවෙන්, මෝටර් වාහනයක් ධාවනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව හා සුදුසුකම් ලබා ගැනීමේදී කෙටිමං සෙවීම සහ දූෂණය ඇති කර තිබේ. නුසුදුසු රියදුරන් නිසා අනතුරු, මරණ, තුවාල හා තවදුරටත් ප්‍රමාදවීම් ඇති වේ.

නගර තුළ සහ ඒවා අතර ඇති දිගු ගමන් කාලය අපගේ දිවයිනේ සංයුක්ත භූගෝලය පිළිබිඹු නොකරයි. මෙම දීර්ඝ සංචාරක කාලවේලාවන් පෞද්ගලික හා පොදු ජීවිතය, ව්‍යාපාර සහ ආර්ථිකය, සංවර්ධනය, සැපයුම් සහ මහජන සෞඛ්‍යයට පවා අහිතකර ලෙස බලපායි.

- **මෙය විසඳීම සඳහා අපි විශේෂයෙන් නාගරික මධ්‍යස්ථානවල බස් හා දුම්රිය ප්‍රවාහන පද්ධති නවීකරණය කර රථවාහන කළමනාකරණය වැඩිදියුණු කරන්නෙමු. නගරවල තදබදය අවම කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශවල සංචලතාව වැඩි කිරීම සඳහා පොදු ප්‍රවාහන පද්ධතියට පුළුල් ප්‍රතිසංස්කරණ අපි දියත් කරන්නෙමු.**

- **අපි වඩාත් පරිසර හිතකාමී ප්‍රවාහන අංශයක් සංවර්ධනය කරන්නෙමු. කොළඹ සිට මහනුවර දක්වා සම්බන්ධ කරන මධ්‍යම අධිවේගී මාර්ගය සහ නව කැළණි පාලම වැනි තීරණාත්මක මහාමාර්ග යටිතල පහසුකම් මෙම ජනාධිපති ධුරයේ පළමු වසර තුළදී නිම කෙරෙනු ඇත.**

ක්ෂණික අවශ්‍යතා සඳහා විසඳුම් සංවර්ධනය කරන අතරම, පළාත්, වරාය සහ ගුවන්තොටුපල අතර ප්‍රවාහන සම්බන්ධතා ඇති කිරීම සඳහා වන අපගේ දිගුකාලීන ප්‍රධාන ව්‍යුහාත්මක ප්‍රවාහන සැලැස්ම හා ඒ හා සම්බන්ධ ඉඩම් පරිහරණ සැලැස්ම ද ක්‍රියාත්මක කිරීම අපි වේගවත් කරන්නෙමු. මෙය සිදු කිරීම සඳහා අධිවේගී මාර්ග පද්ධතිය පුළුල් කිරීම සහ දුර බැහැර ප්‍රජාවන්ට වඩා හොඳ ප්‍රවේශයක් ලබා දීම සඳහා ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම සිදුකරන්නෙමු. මෙම වැඩිදියුණු කිරීම් ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී, කාර්යක්ෂම ලෙස බලශක්ති භාවිතා කරන එම ස්ථානයන්ට ගැලපෙන ප්‍රවාහන සේවා අප විසින් ලබා දෙන නිසා කිසිදු ප්‍රජාවක් දුරස්ථව හුදෙකලා නොවනු ඇත.

- **අප දැනට කරගෙන යන ප්‍රවාහන හා සැපයුම් යටිතල පහසුකම් ව්‍යාපෘති සම්පූර්ණ කර නව ව්‍යාපෘති ආරම්භ කරන විට, ඩොලර් මිලියන 50 කට වඩා වටිනා සියලුම නව ව්‍යාපෘති ආයෝජන සඳහා ප්‍රමාණවත් ප්‍රතිලාභ ලබා දීමට හැකියාව ඇති බව සහතික කිරීම සඳහා රාජ්‍ය ආයෝජන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට අපි සහතික වෙමු. ප්‍රතිලාභ අනුපාතික සංඛ්‍යා හා ගණනය කිරීම් ප්‍රසිද්ධ කරනු ලැබේ.**

- හඳුනාගත් ආර්ථික කොරිඩෝ හතරක මාර්ග හා දුම්රිය සම්බන්ධතා අවධාරණය කරමින් අපි ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක කරන්නෙමු. එනම් කොළඹ - ත්‍රිකුණාමලය, දඹුල්ල - අම්පාර, අම්බලංගොඩ - අම්බලන්තොට සහ යාපනය-කිලිනොච්චි ය.

- සිව්වන ආර්ථික කොරිඩෝවක් වන ත්‍රිකුණාමලය - මැදවච්චිය - තලෙයිමන්නාරම සඳහා දිගුකාලීන සැලසුම් සකස් කරමින් සිටින අතර, එම නගර අතර මහාමාර්ග මංතීරු හතරකට උසස් කිරීමත් සමග එය ආරම්භ වේ.

---

# මහාමාර්ග හා දුම්රිය මාර්ග

ශ්‍රී ලංකාවේ ශීඝ්‍ර නාගරීකරණයත් සමග වැඩි වන පුරවැසියන් සංඛ්‍යාවක් නාගරික මධ්‍යස්ථාන වෙත පැමිණෙමින් සිටිති. නගර පුළුල් වෙමින් පවතින අතර නව නේවාසික අසල්වැසි වාසභූමි වඩා දුරබැහැර තදාසන්න ප්‍රදේශවල පවා දක්නට ලැබේ. නව පර්යන්ත නගර සහ නාගරික ප්‍රදේශ නිර්මාණය වෙමින් පවතී. මිනිසුන් ජීවත්වන හා වැඩ කරන ස්ථානවල වෙනස්කම් පිළිබිඹු කරමින් මෙම ස්ථාන කරා ළඟාවීම සඳහා නව බස් මාර්ග සකස් කරනු ලැබේ. අපගේ වර්ධනය වන වැඩිහිටි ජනගහනය සහ ශාරීරික ආබාධ සහිත පුද්ගලයින් සඳහා සුවපහසුව සහ ප්‍රවේශය වැඩි කරමින්. නවීන පහළ පාදම සහිත බස්රථ සෑම මාර්ගයක ම පොදු ප්‍රවාහන පහසුකම් සඳහා හඳුන්වා දෙනු ඇත.

'සහසර' සංකල්පය පුළුල් ලෙස ක්‍රියාත්මක වනු ඇත. මෙම ක්‍රමය යටතේ බස් ක්‍රියාකරුවෙකුගේ දෛනික ආදායම සහ එම බස් රථයේ ප්‍රවාහනය කරන මගීන් සංඛ්‍යාව අතර සම්බන්ධය ඉවත් කෙරේ. ඒ වෙනුවට, එක් එක් බස් රථයේ ගමන් වාර ගණන මත පදනම්ව, එක්තරා මාර්ගයක සේවය කරන සියලුම බස් රථ විසින් එකතු කරනු ලබන මුළු ආදායම සියලු බස් ක්‍රියාකරුවන් අතර බෙදී යනු ඇත. මෙය එක් මාර්ගයක මගීන් සඳහා තනි තනි බස් රථ අතර අනවශ්‍ය තරගයක් ඇතිවීම වළක්වනු ඇත. බස් ප්‍රමුඛතා මංතීරු වැඩිදියුණු කර පුළුල් කරනු ඇත. අගනාගරික ප්‍රදේශවල විශේෂිත වේගවත් බස් ධාවන (Bus Rapid Transit) පද්ධති හඳුන්වාදෙනු ඇත. ඒ සඳහා මූලික මාර්ග වනුයේ අංක 100, 120, 138 සහ 177 දරන බස් මාර්ග වේ. ඉහළ මගීන් සංඛ්‍යාවක් සහිත මාර්ගවල මාර්ග බලපත්‍ර ගණන වැඩි කරනු ඇති අතර, එහිදී මගීන්ට සහ බදු ගෙවන්නාට වඩා හොඳ වටිනාකමක් ලබා දෙන පරිදි බලපත්‍ර ලබාදීම විනිවිදභාවයකින් යුතුව ලබා දෙනු ඇත.

**වේගවත් හා නිරන්තර දුම්රිය සේවාවක් සහතික කිරීම සඳහා නගර දුම්රිය මාර්ග ද්විත්ව කිරීම හා විද්‍යුත්කරණය සිදු කෙරේ. පළමු විද්‍යුත් දුම්රිය මාර්ගය වේයන්ගොඩ සහ පානදුර අතර ඉදිවනු ඇත.**

- කැළණිවැලි දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් ලෙස වැඩිදියුණු කිරීම වහාම ආරම්භ වේ.

- දුම්රිය ස්ථාන නවීකරණය කර දුම්රිය සඳහා බලා සිටින මගීන් සඳහා ආවරණයන් ලබා දෙනු ඇත.

- ණය සහ හර කාඩ්පත් මගින් ගාස්තු ගෙවීමේ ක්‍රමයක් සියලුම පොදු ප්‍රවාහන සේවාවල ස්ථාපනය කෙරෙන අතර, බස් රථ සහ දුම්රිය පිළිබඳ කාලීන තොරතුරු සහිත පොදු ප්‍රවාහන 'ඇප්' එකක් ක්‍රියාත්මක කරනු ඇත.

- අප කොළඹ අගනගරයෙහි කිලෝමීටර් 75 ක සැහැල්ලු දුම්රිය මාර්ග හතරක් ඉදිකිරීම ආරම්භ කරන අතර පළමු මෙහෙයුම් මාර්ගය ඔස්සේ කොළඹ කොටුව සහ මාලබේ නගර සම්බන්ධ කරනු ඇත.

- තමාගේ වාහනය නවතා ගමන් කිරීමේ පහසුකම් සහිත බහුමාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථාන අපි පිහිටුවන්නෙමු. ඉහළට එසවුණ නව මාර්ග පද්ධතියක් වරාය නගරය සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ දක්වා විහිදෙනු ඇත.

- නව දුම්රිය මාර්ගයකින් කුරුණෑගල සහ හබරණ, දඹුල්ල හරහා සම්බන්ධ කරයි. දුර දුම්රිය සේවාවල වාර ගණන, වේගය සහ විශ්වසනීයත්වය වැඩි කිරීම සඳහා නව දුම්රිය මිලදී ගනු ලැබේ.

- රුවන්පුර අධිවේගී මාර්ගය මගින් දකුණු අධිවේගී මාර්ගය රත්නපුර හා සම්බන්ධ කරන විට, කොළඹ සිට මහනුවර දක්වා සම්බන්ධ වන මධ්‍යම අධිවේගී මාර්ගය ද නිම කෙරේ.


- පසුව මධ්‍යම අධිවේගී මාර්ගය දඹුල්ල හරහා ත්‍රිකුණාමලය දක්වාත් ගුවන්තොටුපල අධිවේගී මාර්ගය පුත්තලම දක්වාත් ව්‍යාප්ත කෙරේ. අපි උතුරු අධිවේගී මාර්ගය සඳහා ද සැලැස්මක් නිර්මාණය කරන්නෙමු.

- සංචාරක කාලය අඩු කිරීම සහ ගමනාගමනය වැඩි දියුණු කිරීම සඳහා කොළඹ සහ මහනුවර නගරවලට නව ස්වයංක්‍රීය රථවාහන කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙනු ඇත.

- නගර ප්‍රදේශයෙන් පිටතට ගමනාගමනය හරවා යවමින් කොළඹ නගරය වටා ඇති වටරවුම් අධිවේගී මාර්ගය නිම කෙරේ. පාසල් ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම සිදු කෙරෙන අතර පාසල් අවට ඇති තදබදය අවම කිරීම සඳහා නම් කරන ලද නංවා ගැනීමේ ප්‍රදේශ වෙන් කරනු ලැබේ.

- අපගේ නගර සහ ඒ අවට නිදහස් ගමනාගමනය සහතික කිරීම වෙනුවෙන් ප්‍රධාන මාර්ග මගහැර යාමේ අතුරු මාර්ග, වැඩිදියුණු කළ පදික පහසුකම් සහ පාපැදි මංතීරු ආදී සියල්ල එකතු කරනු ලැබේ.

**වාහන සඳහා කාබන් බද්ද ඉවත් කරනු ලබන අතර, ඉහළ යන ඉඩම් මිල මත අය කරනු ලබන බදු ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහනය නවීකරණය කිරීම සඳහා ආයෝජනය කිරීමට යොදාගනු ලැබේ.**



# ඉන්දියානු සාගර කේන්ද්‍රය නිර්මාණය කිරීම

## වරාය, ගුවන් සේවා සහ සැපයුම් (logistics)

ශ්‍රී ලංකාව ඉන්දියානු උප මහද්වීපයේ පිවිසුම් දොරටුව අසල ප්‍රධාන නැගෙනහිර-බටහිර මුහුදු මාර්ගයේ ප්‍රබල ලෙස ස්ථානගත වී තිබේ. මෙම ප්‍රමුඛ භූගෝලීය පිහිටීම අපට ඓතිහාසික වාසි රැසක් ලබා දී ඇති නමුත් ඉන්දියානු සාගරයේ සමුද්‍රීය, ගුවන් හා සැපයුම් කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ මෙම විශාල විභවය අප විසින් ප්‍රයෝජනයට ගෙන නැත. මේ අපගේ ඒ සඳහා වන කාලයයි.

ඉතා සාර්ථක කොළඹ දකුණු වරායේ සහ එලිසබෙත් රැජින ජැටියේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතිය අනුව යමින් අපි වහාම නැගෙනහිර සහ බටහිර බහාලුම් පර්යන්තයේ කටයුතු ද ආරම්භ කරන්නෙමු. මාස 18ක් තුළ කොළඹ වරාය පිවිසුම් මාර්ගය සම්පූර්ණ කරන්නෙමු.

ජාත්‍යන්තර හා දේශීය යන දෙඅංශයෙන්ම බහාලුම්, මගී විනෝද යාත්‍රා, යොට් යාත්‍රා සහ තොටුපල සේවාවන් හැසිරවීම සඳහා අපි කන්කසන්තුරය සහ තලෙයිමන්නාරම වරායන් වැඩි දියුණු කරන්නෙමු. ඔලුවිල් වරාය සඳහා ස්ථිර විසඳුමක් කඩිනමින් සොයාගනු ඇත.

කොළඹ වරාය හා සමාන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සහ රත්මලාන ගුවන්තොටුපළේ පුළුල් කිරීමේ ව්‍යාපෘති අපි ආරම්භ කරන්නෙමු. තවත් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් හරහා මඩකලපුව සහ ත්‍රිකුණාමල ගුවන්තොටුපළ දේශීය කේන්ද්‍රස්ථාන ලෙස නවීකරණය කිරීම සඳහා අපි ප්‍රමුඛ දේශීය ගුවන් සංවර්ධන මුලපිරීමක් වන 'රාවණා' ව්‍යාපෘතිය දියත් කරන්නෙමු. කටුනායක, යාපනය සහ මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් සමග එක්ව මෙම දේශීය ගුවන්තොටුපළ තුන දිවයින පුරා වැඩිදියුණු කළ සංචාරක හා සැපයුම් සම්බන්ධතා මධ්‍යස්ථාන හයක ජාලයක් සපයනු ඇති අතර එය සංචාරක කර්මාන්තයට ද දායක වේ. මෙම ව්‍යාප්තිය හා නවීකරණය සමග තරඟකාරී හා ආරක්ෂිත ආකර්ෂණීය ගුවන් සේවා අංශයක් නිර්මාණය කිරීම සඳහා අපි නව රෙගුලාසි හඳුන්වා දෙන්නෙමු. ඉහළ ආදායම් ලබන ගුවන් සේවාවල සාධාරණ තරගයක් සහිත ජාත්‍යන්තර මෙහෙයුම් කලාප සංවර්ධනය කරන්නෙමු.

සමුද්‍රීය යටිතල පහසුකම් ක්‍රියාත්මක වූ පසු, බහුජාතික සුසංවිධාන සමාගම් විසින් ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් ආරම්භ කිරීම සහතික කිරීම සඳහා ආකර්ෂණීය පසුබිමක් අප වෙනුවෙන් නිර්මාණය වනු ඇත. එමගින් රටවල් රැසක් අතර ස්ථාපිත වීමේ වාසිය ද අයත් වේ. දේශසීමා අතර කටයුතු හා සම්බන්ධ සියලු නියෝජිතායතන ඩිජිටල්කරණය කෙරෙන අතර ප්‍රවේශය සරල කිරීම සහ විධිමත් කිරීම සඳහා ජාතික තනි කවුළු ද්වාරය (National Single Window Portal) සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරනු ඇත.



# පුනර්ජනනීයත්වය (renewable) සහ ස්වයංපෝෂිතභාවය

## බලශක්ති ප්‍රතිපත්තියක්

ගෝලීය ප්‍රජාව දේශගුණික අර්බුදය සමග පොරබදමින් සිටින විට, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සඳහා මුළුමනින්ම කැපවී සිටින ජාතියක් බවට පත්වීමේ සදාචාරාත්මක වගකීම ශ්‍රී ලංකාව විසින් භාර ගනු ඇත.


2040 වන විට ශ්‍රී ලංකාව මුළුමනින්ම බලශක්තියෙන් ස්වයංපෝෂිත කිරීම සඳහා වන ගමන අපි ආරම්භ කරන්නෙමු. අපගේ සියලු ශක්තිය සූර්ය හා සුළං වැනි පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ලැබෙනු ඇත. අදාළ බදු ඉවත් කිරීම නිසා පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කිරීමට අවශ්‍ය උපකරණ වඩාත් ලාභදායී වනු ඇත. ඒ හා සමානව ම, ස්වයංක්‍රීය උපකරණවල විදුලි බැටරි මත පනවා ඇති බදු ද අවම කරනු ලැබේ.

ප්‍රමාණවත් විදුලිබල උත්පාදනය හෝ සම්ප්‍රේෂණ බාධක හේතුවෙන් තවදුරටත් විදුලි කප්පාදුවක් සිදු නොවන බවට සහතික වීම සඳහා අපි අපගේ දිගු කාලීන උත්පාදන සැලැස්ම සහ සම්ප්‍රේෂණ සැලැස්ම දැඩි කාල නියමයන්ට අනුව ක්‍රියාත්මක කරන්නෙමු. විදුලිබල පද්ධතිය වඩා හොඳින් කළමනාකරණය කිරීම සහ ප්‍රතිලාභ පාරිභෝගිකයාට පැවරීම සඳහා අපි වසර පහක් තුළ සුහුරු බලශක්ති ජාලය ස්ථාපිත කරන්නෙමු. විදුලිබල අංශය තුළ ඇති සියලුම ලබැඳියාවන් අතර ගැටුම්වලට විසඳුම් ලබා දෙන අතර පූර්ණ විනිවිදභාවය ප්‍රමිතිය බවට පත්වනු ඇත.

ජල විදුලිය සඳහා භාවිතා කරන සියලුම ජලාශවල ජලය රඳවා ගැනීමේ ධාරිතාව ප්‍රශස්ත කිරීම වෙනුවෙන් ප්‍රතිසංස්කරණය කෙරේ. පොම්ප කරන ලද ගබඩා ක්‍රමය (Pumped Storage) භාවිත කරමින් ජල විදුලි උත්පාදනය සුදුසු ස්ථානවල ක්‍රියාත්මක කෙරේ. රාජ්‍ය ආයතන පුරා සහ රාජ්‍ය හා පෞද්ගලික අංශවල දැනට යොදා ඇති **CFL** බල්බ වෙනුවට **LED** බල්බ වැනි බලශක්ති කාර්යක්ෂම උපකරණ භාවිතා කිරීමත් සමග බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා රටපුරා පියවර ක්‍රියාත්මක කෙරේ.

**ජලාශ මත පාවෙන, සහ වහල මත සවි කරන සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා විනිවිද පෙනෙන හා සාධාරණ යාන්ත්‍රණයන්ගෙන් 'සූර්ය බල සංග්‍රාමය' හෙවත් සූර්ය බලශක්තිය සඳහා වන සටන වේගවත් කරනු ඇත.**

සත්‍ය හදිසි අවස්ථාවකදී හැර, සෙසු අවස්ථාවලදී හදිසි විදුලිය මිලදී ගැනීමෙන් අපි වැළකී සිටිමු. සියලු මිලදී ගැනීම් පූර්ණයෙන්ම විනිවිදභාවයෙන් කෙරෙන අතර සුදුසු මාර්ගෝපදේශ හා අධීක්ෂණයට යටත් වේ.



# කෘෂිකාර්මික, කිරි නිෂ්පාදන හා ධීවර අංශ නවීකරණය කිරීම

## ඉඩම් සහ මුහුදේ විප්ලවයක්

නැගෙනහිර ආසියානු රටවල අසාමාන්‍ය සංවර්ධනයේ පළමු පියවර ඉබේ ඇති වූවක් නොවේ; එය විප්ලවීය විය. වරක් ග්‍රාමීය ජාතීන් වූ ඔවුන් විසින් කෘෂිකාර්මික විප්ලවයක් ඇති කළ අතර එය ඔවුන්ගේ ආර්ථිකයන් වේගවත් කළේය. ශ්‍රී ලංකාවට ද මෙම විප්ලවය අවශ්‍ය වේ. නවීකරණය හා නව්‍යකරණය තුළින් අපගේ කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු. අපගේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය නවීන, විද්‍යාත්මක හා සියල්ල ඇතුළත් කරගන්නා එකක් වනු ඇත. මිල දරාගත හැකි ආහාර නිෂ්පාදනය, තිරසාර ගොවිතැන සහ අගය එකතු කළ අපනයන නිෂ්පාදන කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු.

## ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය

කෘෂිකාර්මික විප්ලවය ආරම්භ විය යුත්තේ ගොවිජන සංවර්ධනය පිළිබඳ අපගේ උපායමාර්ගයේ සම්පූර්ණ ප්‍රතිසංස්කරණයකින් ය.

**නව තාක්ෂණය සැලකිල්ලට ගෙන කුරුඳු හා ගම්මිරිස් නිෂ්පාදනය සඳහා ඇති ඉඩම් වැඩි කිරීම සඳහා අපි බීජ පනත, ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සහ කුඹුරු පනත යාවත්කාලීන කරන්නෙමු.**

'පළමුව ශ්‍රී ලංකාව' විදේශ ප්‍රතිපත්තිය මඟින් අපගේ ගොවිජන නිෂ්පාදන සඳහා දොරටු විවර කිරීම සඳහා ප්‍රධාන වෙළඳපොළවල් සමග නිදහස් වෙළඳ ගිවිසුම් හා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් නිර්මාණය කරගනු ඇත. අපගේ ජීඑස්පී+ වාසිදායක වෙළඳ තත්ත්වය පවත්වා ගෙන යන අතර අපගේ කෘෂිකාර්මික නිෂ්පාදනවලට අගය එකතු කිරීම සඳහා ආයෝජනය කරන්නෙමු.

## සහල් සහ ගොවිපළ විප්ලවය

ශ්‍රී ලංකාව නවීන කෘෂිකාර්මික යුගයකට පිවිසීමට අපි අඩිතාලම දමන්නෙමු. ගොවිතැන තවදුරටත් නොනැසී පැවතීමේ මාර්ගයක් නොව ගොවි පවුල් සඳහා ඉහළ ආදායමක් ලබා ගත හැකි ව්‍යාපාරික කටයුත්තකි. නව මෙවලම් සහ තාක්ෂණය හඳුන්වා දීමෙන් අපි එය සිදු කරන්නෙමු.

- **ශ්‍රී ලංකාවේ නැනෝතාක්ෂණික ආයතනයේ ආකෘතියට අනුව නව ජෛව තාක්ෂණ පර්යේෂණ හා නව්‍යකරණ ආයතනයක් අපි ස්ථාපිත කරන්නෙමු. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර කොටස් සඳහා බදු අඩු කිරීමෙන් නව තාක්ෂණය හඳුන්වාදීමට අපි මංපෙත් විවර කරන්නෙමු.**

- මෙහෙයවීම් නවීකරණය කිරීම හා සරල කිරීම සඳහා අපි ජාතික ගබඩා ජාලයක් ස්ථාපිත කරන්නෙමු.

- පොහොර භාවිතය සියයට 20කින් අඩු කිරීම සඳහා අපි පාංශු කාඩ්පත් හඳුන්වා දෙන්නෙමු. කුඩා වතු හිමියන් සඳහා ගොවිපල යන්ත්‍රෝපකරණ කුලියට දීමේ 'ඇප්' පාදක වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා අපි තාක්ෂණික සමාගම් සමඟ හවුල් වන්නෙමු.

- ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සහ ආහාර ආනයනය අඩු කිරීම සඳහා අපි ආහාර නිෂ්පාදනය වැඩි කරන්නෙමු. මේ සඳහා අපි කුඩා කුඹුරු හිමියන්ට ඔවුන්ගේ ප්‍රදේශයේ සමුපකාර හරහා නොමිලේ බීජ වී ලබා දීමේ වැඩසටහනක් දියත් කරන්නෙමු.

- වී, එළවළු, පළතුරු, හේන්, අපනයන බෝග, පොල් සහ තේ ඇතුළු සියලුම වගාකරුවන් සඳහා නොමිලේ පොහොර ලබා දෙනු ඇත.

අපගේ ශ්‍රී ලංකාවේ ප්‍රවාහන හා ප්‍රවාහන යටිතල පහසුකම් පුළුල් කිරීම හා නවීකරණය කිරීම තුළින් පශ්චාත් අස්වනු නාස්තිය පිළිබඳ ගැටලුව විසඳනු ඇත. වඩා හොඳ ප්‍රවාහන ක්‍රමවේදයන් වෙත මාරුවීමෙන් හා පුළුල් සැපයුම් දාමයන්හි ආයෝජනය කිරීමෙන් දශක තුනක ප්‍රතිපත්ති අසාර්ථකත්වය ආපසු හරවනු ලැබේ.

මහජනතාවට ප්‍රවේශ විය හැකි උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද ගබඩාවක් පළමු වරට නිර්මාණය කළ 'ප්‍රභාශ්වර' වැඩසටහන, අධි අස්වැන්නෙන් පසු අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීම හා පසු අස්වනු හානිය අවම කිරීම සඳහා වූ ජාලයක් බවට අපි පුළුල් කරන්නෙමු. මෙය පළමුවෙන්ම දිස්ත්‍රික් මට්ටමින් ලබා ගත හැකි අතර පසුව ප්‍රාදේශීය මට්ටමින් ලබා ගත හැකිය.

- ගුණාත්මකභාවය තහවුරු කළ හැකි වටිනාකම් එකතු කරන ලද නිෂ්පාදන අපේක්ෂා කරන කලාපීය හා ගෝලීය වෙළඳපොළ සමඟ සම්බන්ධ වීමේ අරමුණ පෙරදැරි කරගෙන 'ප්‍රභාශ්වර' වැඩසටහන ඔස්සේ අපි මිල ස්ථාවර කරන්නෙමු.

- වඩා හොඳ, වඩා කාර්යක්ෂම හා ඉහළ ප්‍රතිචාර දැක්වෙන වෙළඳපලක් නිර්මාණය කිරීමට අපි 'ඇප්' මත පදනම් වූ තොරතුරු හුවමාරු පද්ධතියක් නිර්මාණය කරන්නෙමු.

- මෙම ජංගම ඇප් හරහා ගොවීන් හා ගැනුම්කරුවන් සම්බන්ධ වන අතර එම ඇප් එකට වෙළඳාම සහ පසුව සිදුවන බෙදාහැරීම ද සැලසුම් කෙරේ.

- අතුරු පියවරක් ලෙස අපි වී මිල කිලෝග්‍රෑමයක් සඳහා රු. 50 ක සහතික මිලක් පවත්වා ගන්නෙමු.

- අප විසින් ගොවීන්ගේ දායක විශ්‍රාම වැටුප් ක්‍රමය වැඩි දියුණු කර එහි පවතින අඩුපාඩු සපුරාලනු ඇත.

## අපගේ වැවිලි අංශය නගාසිටුවීම

- අපි ගෝලීය වශයෙන් තරඟකාරී, නවීන හා ලාභදායී වැවිලි අංශයක් ගොඩනඟන්නෙමු. විද්‍යාත්මක අධ්‍යයනයේ නව වර්ධනයන් හඳුන්වාදීමට සහ ශ්‍රී ලංකාවේ වතුකරයේ නවීන ක්‍රමවේදයන් භාවිතා කිරීම සඳහා පසුබිම සකස් කිරීම සඳහා අධ්‍යයන සිදු කිරීමට අපි සුප්‍රසිද්ධ විශ්ව විද්‍යාල සමඟ එක්ව පර්යේෂණ ප්‍රතිපාදන ලබා දෙන්නෙමු.

- 21වන සියවසේ වැවිලි අංශයකට ගැලපෙන පරිදි අපගේ ශ්‍රම බලකාය පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව හා කුසලතා ලබා දෙන පරිදි සියලුම වැවිලි දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික පාසල් විවෘත කරනු ලැබේ.

- වතු යාන්ත්‍රිකකරණය, නිෂ්පාදනය සරල කිරීම සහ නිෂ්පාදන සැකසීම සඳහා තාක්ෂණයන්ට අනුවර්තනය වීමට කැමති සමාගම් සඳහා අපි දිරිගැන්වීම් ලබා දෙන්නෙමු.

- අපි පොහොර භාවිතය නියාමනය කරන අතර නාස්තිය අවම කරන විද්‍යාත්මක හා පරිසර හිතකාමී පොහොර යෙදීමේ ක්‍රම දියුණු කරන්නෙමු.

- **සාම්ප්‍රදායික නොවන භෝග සඳහා ඵලදායී නොවන වතු ඉඩම් විවිධාංගීකරණය කිරීමට අපි ඉඩ ලබා දෙන්නෙමු.**

- **වතු ඉඩම් සඳහා දේශීය ආයෝජන අධෛර්යමත් නොකරන ක්‍රමානුකූල ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රතිපත්තියක් අපි හඳුන්වා දෙන්නෙමු.**

- **ශ්‍රී ලංකා කුළුබඩු ලෙස නැවත නම් කර ප්‍රති-අපනයනය කරන ගම්මිරිස් වැනි අඩු ගුණාත්මක කුළුබඩු ආනයනය කිරීම තහනම් කරමින් ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලාංකීය වෙළඳ නාමය ආරක්ෂා කිරීමට අපි නීතිමය පියවර ගන්නෙමු.**

- **ඒ හා සමානව, නීති විරෝධී ලෙස දියර රබර් ආනයනය කිරීම ද නවත්වනු ඇත.**

- **රබර් මිල කිලෝග්‍රෑමයකට රුපියල් 300 බැගින් පවත්වා ගැනීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් අපි නිර්මාණය කරන්නෙමු. කෙටිකාලීනව, කුඩා වතු හිමියන්ට ඔවුන්ගේ වතු සඳහා වැඩි ආයෝජනයක් කිරීමට දිරිගැන්වීම සහ රබර් වෙළඳපොලේ මිල උච්චාවචනයන් අවම කිරීමට අපි පියවර ගන්නෙමු.**

- **කුඩා තේ වතු හිමියන්ට අවම වශයෙන් තේ දළු කිලෝග්‍රෑමයකට රු. 90ක මිලක්, සහතික කරන අතර අපි තේ නැවත සිටුවීමේ වැඩසටහනක් දියත් කරන්නෙමු.**

## පොල් කර්මාන්ත ප්‍රතිසංස්කරණය

ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය අතිශයින්ම විසිරී ඇති අතර, බලධාරීන් සහ දෙපාර්තමේන්තු කිහිපයක් බොහෝ විට එකිනෙකා සමග තරගවදිති. එමගින් එම අංශය එහි පූර්ණ හැකියාවන් අත්පත් කරගැනීම වළක්වයි. ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම යන දෙකම සරල කිරීම සඳහා අපි පොල් සංවර්ධන අධිකාරිය පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා කිරීමේ අධිකාරිය සහ වෙනත් ආශ්‍රිත දෙපාර්තමේන්තු සමග ඒකාබද්ධ කරන්නෙමු.

පොල් තෙල් සහ පාම් තෙල් පැහැදිලිව ලේබල් කර දැඩි රෙගුලාසි වලට අනුකූලව අලෙවි කරනු ඇත. අපනයන අරමුණු සඳහා තාවකාලික ආනයන ක්‍රමය යටතේ ආනයනික ආහාරයට ගත හැකි තෙල් ප්‍රති අපනයනය තහවුරු කිරීම සඳහා බලයලත් අධීක්ෂණ ක්‍රමයක් අපි ස්ථාපිත කරන්නෙමු.

## කිරි නිෂ්පාදනය

නැවුම් කිරි සඳහා ඉල්ලුම ඉහළ යමින් පවතින අතර, අපි මෙය කිරි සංවර්ධන අරමුදල සමග තවදුරටත් ප්‍රවර්ධනය කර කිරි නිෂ්පාදනයේ ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීමට උත්සාහ කරන්නෙමු. ආනයනික කිරි නිෂ්පාදන සඳහා බදු ඉහළ මට්ටමක පවතින අතර දේශීය කිරි ගොවිපලවල් සඳහා වන ඉල්ලුම වැඩිවීමත් සමග ඒවා පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ. කිරි ගොවිතැන සඳහා මධ්‍යම කඳුකරයේ ඵලදායී නොවන තේ ඉඩම් මුදා හැරීමෙන් කිරි ගොවිපල පුළුල් කරන්නෙමු.

වතු අංශය යාන්ත්‍රිකකරණය හා නවීකරණය කිරීමත් සමගම, වතුකරයේ පදිංචිකරුවන්ට රැකියා ලබා දෙන, ගුණාත්මක ඉහළ අස්වැන්නක් සහිත කිරි ගොවිපලවල් ඇති කිරීම සඳහා අපි වැවිලි සමාගම්, කම්කරු සංගම් සහ කිරි නිෂ්පාදන සංවර්ධනය කරන්නන් අතර ත්‍රෛපාර්ශ්වීය ගිවිසුමක් ඇති කර ගන්නෙමු. මෙම ගොවිපළවලට උපකාර පිණිස අපි සත්ත්ව ආහාර සඳහා වන බදු අඩු කරන්නෙමු.

කිරි කර්මාන්තය සඳහා පශු සම්පත් ආනයනය කිරීමේදී දැඩි නිර්ණායකයන් අපි හඳුන්වා දෙන්නෙමු. ඇතැම් සත්ත්ව වර්ගවලට දේශීය දේශගුණික තත්ත්වයන්ට අනුවර්තනය වීමේ හැකියාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්නෙමු.

## ධීවර කර්මාන්තය ශක්තිමත් කිරීම

සමුද්‍රීය ජාතියක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ශක්තිය මුහුදෙන් පැමිණීම අත්‍යවශ්‍ය වේ. විශාල සාගරයක පිහිටි සාපේක්ෂව කුඩා දූපතක් වුවද, මුහුද සමග

අපගේ සාම්ප්‍රදායික සම්බන්ධතාවය සියවස් ගණනාවක් තිස්සේ අඩු වී තිබේ. මුහුදු ආහාර අපගේ ආහාරයේ ප්‍රධාන ආහාරයක් නොවන අතර අපගේ ගොවිජන හා පශු සම්පත් කර්මාන්ත සමග සමබර තිරසරබවක් පවත්වා ගැනීම සඳහා අප පරිභෝජනය කළ යුතු මත්ස්‍ය ප්‍රමාණයන් සැපයීමේ හැකියාව ධීවර කර්මාන්තය සතුව නොමැත.

අපගේ වෙරළ තීරයට දුරින් සහ සියලු කාලගුණික තත්ත්වයන් යටතේ මසුන් ඇල්ලීමේ හැකියාව වැඩි දියුණු කරනු ඇත. දිගු දුර ගමන් කළ හැකි හා අයහපත් කාලගුණය තුළ පවා ආරක්ෂිත වූ ද ශීත ගබඩා සහ වඩා හොඳ මත්ස්‍ය මෙහෙයුම් පහසුකම් ද සහිත විශාල ට්‍රෝලර් සහ බහු දින යාත්‍රා භාවිතා කිරීම සඳහා සහනාධාර ලබා දීමෙන් අපගේ ධීවර යාත්‍රාවල ධාරිතාව ඉහළ නැංවීම සිදුකරනු ඇත.

- **මුහුදේදී මසුන් ගබඩා කිරීම හා මෙහෙයවීම වැඩි දියුණු කිරීම වෙනුවෙන් බහු දින යාත්‍රාවල ශීත කළ මුහුදු ජල පද්ධති ස්ථාපනය කිරීම සඳහා ආයෝජනයෙන් 50% ක් රජය විසින් ලබා දෙනු ඇත.**

- **අපගේ ධීවර යාත්‍රා පරාසය පුළුල් කිරීම සඳහා අත්‍යවශ්‍ය නවීන යාත්‍රා අධීක්ෂණ උපකරණ සහ වෙනත් ආරක්ෂක පද්ධති ස්ථාපනය කිරීමේ පිරිවැයෙන් 50% ක් අප විසින් ආයෝජනය කරන්නෙමු.**

- **ධීවර කර්මාන්තය තරුණ තරුණියන් සඳහා යෝග්‍ය වෘත්තියක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අපි ජීවිත රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කර ධීවරයින් සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමය ශක්තිමත් කරන්නෙමු. ධීවර පවුල්වල කාන්තාවන්ට ද මෙම යෝජනා ක්‍රමවලින් ප්‍රතිලාභ ලැබේ.**

මත්ස්‍ය සම්පත්වල භූගෝලීය පිහිටීම සහ ප්‍රමාණය වැනි තොරතුරු ලබා දීම සඳහා ධීවර ප්‍රක්ෂේපණ පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් අපගේ ධීවර යාත්‍රාවල කාර්යක්ෂමතාව ශක්තිමත් කරනු ඇත. එමඟින් එලදායී ධීවර ප්‍රදේශ සොයා ගැනීම සඳහා කාලය හා ඉන්ධන නාස්ති නොවේ. කෙටිකාලීනව ධීවර යාත්‍රා වෙත වඩාත් නිවැරදි කාලගුණ අනාවැකි සහ තථ්‍ය කාලීන යාවත්කාලීන කිරීම් කෙටි පණිවිඩ හරහා ලබා දීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කෙරේ.

අපි මිරිදිය ධීවර හා ජලජීවී අපනයන සඳහා ආයෝජනය කර දිරිමත් කරන්නෙමු. බෝට්ටුවල පිටතින් සවි කරන එන්ජින් සඳහා වන බදු අඩු කිරීමෙන් වෙරළ සහ මිරිදිය ධීවරයින් සවිබල ගන්වන්නෙමු. සංසන්දනාත්මක බදු විරාම මගින් මිරිදිය මසුන් ඇල්ලීම සඳහා වන අනෙකුත් ආදාන පිරිවැය අඩු කරනු ඇත.

පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ශීතකරණ ට්‍රක් රථ සහ ශීත ගබඩා ඇතුළු මෙහෙයුම් උපකරණ සඳහා වන සියලුම පෙර බදු අපි ඉවත් කරන්නෙමු. ප්‍රධාන ධීවර වරායන්හි නිතිපතා එක්ස්පෝ වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීමෙන් අපි ධීවරයින් අපනයනකරුවන් සමග කෙලින්ම සම්බන්ධ කරන්නෙමු.

අපි මසුන් ඇල්ලීම තිරසාරව කළමනාකරණය කර, අපගේ සුවිශේෂී ආර්ථික කලාපය උපරිම ලෙස භාවිතා කිරීම සහතික කරමින් ධීවරයින් වගකීමෙන් යුතුව මසුන් ඇල්ලීමට උනන්දු කරන්නෙමු. පතුල් ට්‍රෝලනය, ඩයිනමයිට් යොදා මසුන් ඇල්ලීම සහ වෙනත් නාස්තිකාර හා තිරසර නොවන ධීවර ක්‍රම තහනම් කිරීමට අපි දැඩි ලෙස ක්‍රියා කරන්නෙමු. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය ව්‍යාප්ත කිරීමට සැලසුම් කර තිබේ. මෙම තහනම් ධීවර ක්‍රමවේදයන්හි නියැලී සිටින විදේශීය ට්‍රෝලර් යාත්‍රා වලින් අපේ භෞමික සයුර ආරක්ෂා කිරීමේ උත්සාහයන් ශක්තිමත් කරනු ඇත. ශ්‍රී ලංකාවේ ධීවරයින්ට ආරක්ෂිත ලෙස සයුර භාවිතා කිරීමට හැකිවන පරිදි සිලාවතුරෙයි ධීවර වරාය වැඩිදියුණු කරනු ඇත.

# යටිතල පහසුකම් සහ ග්‍රාමීය සංවර්ධනය

## ගම්පෙරළිය

ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන සම්බන්ධ කරන නාගරික සංවර්ධන හා යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අප විශාල වශයෙන් ආයෝජනය කරන බැවින්, ගම්මාන සහ කුඩා නගර අත නොහැරෙන ලෙස අපි නිශ්චිත ග්‍රාමීය ව්‍යාපෘතීන් ඉදිරියට ගෙන යන්නෙමු.

අපේ ගම්මාන පුනර්ජීවනය කරන ගම්පෙරළිය යෝජනා ක්‍රමය ග්‍රාමීය යටිතල පහසුකම්, රටේ මාර්ගවල සිට ජලාශ, පාසල්, පූජනීය ස්ථාන සහ ප්‍රජා මධ්‍යස්ථාන දක්වා විවිධ මට්ටම්වල සංවර්ධනයන් සිදු කර තිබේ. මෙම වැඩසටහන් නව ජවයකින් ඉදිරියට ගෙන යනු ඇත.

---

**ගම්පෙරළිය වැඩසටහනෙහි මුළු වටිනාකම වසරකට රුපියල් මිලියන 400 දක්වා ගෙන එමින් යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා අරමුදල් සැපයීම වෙනුවෙන් සෑම ඡන්ද කොට්ඨාසයකටම වසරකට රුපියල් මිලියන 100 ක් ලබා දෙනු ඇත**

---

රට පුරා ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම කෙරෙහි අවධානය යොමු කරන දිගුකාලීන වැඩපිළිවෙළක් ද අප සතුව තිබේ. එසේම, නව තාක්ෂණය හා ජාත්‍යන්තර සහයෝගීතාවය මත පදනම්ව රට පුරා කුඩා, මධ්‍යම හා විශාල වාරිමාර්ග ව්‍යාපෘති පිළිබඳව ද ජාතික ප්‍රතිපත්තියක් තිබේ. 'ඉසුරු පවුල' ජාතික මුලපිරීම යටතේ අපි සුළු අපනයන භෝග නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ග්‍රාමීය පවුල් ඒකකයේ ආර්ථිකය ශක්තිමත් කිරීම වෙනුවෙන් යැපුම් ගොවිතැන දිරිමත් කරන්නෙමු.

අපි කඳුරට බහු ආංශික ඒකාබද්ධ කලාපීය හා ග්‍රාම සංවර්ධන වැඩසටහන ආරම්භ කරන්නෙමු. මෙය ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනයේ අඩුපාඩුකම් සපුරාලීම සඳහා ය. මෙම වැඩසටහන මගින් කඳුකර භූමි ප්‍රදේශ වන මධ්‍යම, සබරගමුව, ඌව පළාත් සහ කළුතර, ගාල්ල, මාතර දිස්ත්‍රික්ක (සිංහරාජය) යටතේ සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශ ආවරණය කරයි. මෙම ප්‍රදේශ සඳහා සම්පත් වෙන් කිරීම කෙරෙහි නිසි අවධානයක් යොමු නොකර රටේ වෙරළබඩ කලාප, මහවැලි සංවර්ධන කලාපය සහ වියළි කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය කර ඇති අතර එමගින් සංවර්ධන ප්‍රතිඵල සහ සුබසාධනය සඳහා සාපේක්ෂ හා සැලකිය යුතු අසමතුලිතතාවයක් ඇති කර තිබේ. මෙම වැඩසටහන මගින් ගමකින් ගමකට සහ ගමේ සිට වෙළඳපළ දක්වා භෞතික සම්බන්ධතා, සනීපාරක්ෂක හා සෞඛ්‍ය සේවා, නිවාස, අධ්‍යාපනය සහ පුහුණුව, පානීය ජලය, වාරිමාර්ග, වෙළඳපළ සංවර්ධනය, දේශීය සංචරණය, කුඩා පරිමාණ කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය සහ ජීවනෝපාය සංවර්ධනය යන අංශ කෙරෙහි අවධානය යොමු කෙරේ.

# ඉදිකිරීම් කර්මාන්තය

ඉදිකිරීම් කර්මාන්තයේ ඇති වන ඇණහිටීම් වළක්වා ගැනීමට සහ එම විරාමයන් ක්‍රමානුකූලව ඉවත් කිරීම සඳහා රජයේ ඉදිකිරීම් ව්‍යාපෘති වෙනුවෙන් අපට සැලැස්මක් තිබේ. එවැනි සැලැස්මක් නොමැතිකම දූෂණවලට හේතු වී තිබේ. කර්මාන්තය ශක්තිමත් කිරීම වෙනුවෙන් ගෙවීම් ප්‍රමාද වීම සහ ව්‍යාපෘති ආරම්භ කිරීම පිළිබඳව ද අවධානය යොමු කෙරේ. කොළඹ මහ නගර සභා සීමාව තුළ ඉදිකිරීම් සඳහා බලපත්‍ර ලබාගැනීමේදී මාර්ගගත වේදිකාවක් හරහා අනුමත කිරීම් සහතික කිරීම සිදු කරනු ඇත. තවද, තාක්ෂණය හුවමාරු කිරීම සඳහා දේශීය හා විදේශීය කොන්ත්‍රාත්කරුවන් සමග හවුල් ව්‍යාපාර සැකසීම ද අපි දිරිමත් කරන්නෙමු. අධිවේගී මාර්ග සහ උස් ගොඩනැගිලි වැනි අනාගත යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා දේශීය කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

**ඉදිකිරීම් අංශයේ අතුරුබදු අයකිරීම් ඉවත් කිරීම ජීවන වියදම අඩු කිරීම සඳහා පමණක් නොව කර්මාන්තය පවත්වා ගැනීම සඳහා ද වන අවශ්‍යතාවයකි. ඉදිකිරීම් පිරිවැය අඩු කිරීම සඳහා, තෝරාගත් ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා යොදන තීරුබදු ගාස්තු අඩු කරනු ලැබේ. ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රධාන කොන්ත්‍රාත්කරු ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරනු ලබන අතර සහාධිපත්‍ය නිවාස ඒකකවල ඒකකයක මිලෙහි වැට් බදු රහිත සීමාව ඒකකයකට රු. මිලියන 15 සිට රු. මිලියන 25 දක්වා සංශෝධනය කරනු ඇත. මිලියන 25 කට වැඩි එවා සඳහා වැට් බද්ද සියයට 6 ක් අදාළ වේ.**



ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට සීමාවක් නැත
එක්ව ගමන යමු.

# කැමතිම ගමනාන්තය

## සංචාරක කර්මාන්තය දිරිගැන්වීම



ඓතිහාසිකව ගත් කල, ශ්‍රී ලංකාව අමුත්තන් සාදරයෙන් පිළිගන්නා හා ආගන්තුක සත්කාරයට ලැදි රටකි. ශ්‍රී ලංකාවට පැමිණි අමුත්තන්, මාකෝ පෝලෝ වැනි ගවේෂකයන් වේවා, රොබට් නොක්ස් වැනි යුද සිරකරුවන් වේවා, සින්බාද් වැනි පුරාවෘත්ත අමුත්තන් වේවා, මෙරටින් ගෙන ගියේ ප්‍රීතිමත් මතකයන් පමණි. ආගන්තුකයන්ට දක්වන මෙම මිත්‍රත්වය හා කරුණාව පිළිබඳ සංස්කෘතික සම්ප්‍රදාය පොදුවේ ශ්‍රී ලාංකිකයින් තුළ මුල් බැස ඇති අතර, ගෝලීය සංචාරයන් ප්‍රායෝගික හැකියාවක් වීමට බොහෝ කලකට පෙරදී ද ශ්‍රී ලංකාව සුන්දර ගමනාන්තයක් ලෙස ප්‍රචලිත විය. අවාසනාවකට මෙන්, වසර තිහක යුද්ධය නිසා අප රට සංචාරය කිරීමට ආකර්ශනීය ස්ථානයක් ලෙස තිබූ පිළිගැනීමට හානි වී තිබේ. අපගේ ළඟම අසල්වැසි තායිලන්තය, මැලේසියාව, සිංගප්පූරුව සහ මාලදිවයින යන රටවල් සමෘද්ධිමත් වන විට දී අපගේ සංචාරක අංශය වියැකී ගියේය. දශකයකට පෙර යුද්ධය අවසන් වීමත් සමග, පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාව වේගයෙන් ඉහළ යාමත් සමග ශ්‍රී ලංකාවේ සංචාරක අංශයට විශාල ශක්තියක් ලැබුණි. අනාගතය දීප්තිමත් ලෙස පෙනුණි. කෙසේ වෙතත්, සංචාරකයින්ගේ සංඛ්‍යාව වැඩි වෙමින් තිබියදීත්, එකල ශ්‍රී ලංකා රජය එම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමට අසමත් විය.

- **අපගේ සංචාරක ප්‍රතිපත්තිය යටතේ කර්මාන්තයේ ව්‍යාප්තිය ඉහළ නැංවීම සඳහා නිර්මාණය කර ඇති සංචාරක සහන පැකේජය යටතේ හඳුන්වා දී ඇති බදු සහන සහ ණය සහන සමග අපි ඉදිරියට යන්නෙමු. මෙම අංශයේ ආයතන සඳහා අපනයන තත්ත්වය ද ලබා දෙන්නෙමු. කාමර පහකට වැඩි හා ඩිජිටල් වේදිකා භාවිතා කරන සියලුම කුඩා හා මධ්‍යම පරිමාණ හෝටල් සහ ගෙස්ට් හවුස් කර්මාන්ත නියාමනයට යටත් වේ.**

- සංචාරක සංවර්ධන බද්දෙන් ලැබෙන අරමුදල් කළමනාකරණය කිරීම සඳහා අපි රජය සහ පෞද්ගලික අංශය අතර රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ඇති කර, සංචාරක අංශ නියාමන ආයතන සේවා එක් තැනකින් ලබාගැනීමේ හැකියාව ඇති කරන්නෙමු.

- මෙම සංචාරක කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකාව කලාපීය කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සඳහා විනෝදාස්වාදය / තේමා උද්‍යාන (entertainment and theme park), ත්‍රාසජනක සංචාරක (adventure tourism) අත්දැකීම් සහ MICE සංචාරක කටයුතු සඳහා විශේෂ දිරිගැන්වීම් ලබා දෙන්නෙමු. ශ්‍රී ලංකාව මෙම සංචාරක කටයුතු සඳහා මධ්‍යස්ථානයක් බවට පත් කරනු ඇත.

- ඉන්දියාව, චීනය සහ අග්නිදිග ආසියාව වැනි ප්‍රධාන සංචාරක ප්‍රභව වෙළඳපොලවල් තුළ අපි ගමනාන්ත අලෙවිකරණ ව්‍යාපාරවලට ප්‍රමුඛතාවක් ලබා දෙන්නෙමු. සාම්ප්‍රදායික ගමනාන්ත වෙළඳ දැන්වීම්වලට අමතරව, ආයුර්වේදය වැනි සාම්ප්‍රදායික පිරිනැමීම්වල සිට අංගම්පොර වැනි ශිල්ප සහ භාවනා, නැගී එන ආකර්ශනයන් ලෙස ව්‍යාප්ත කරමින් ශ්‍රී ලංකාව සුවදායී හා අධ්‍යාත්මික සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රසිද්ධ කිරීමේ උපාය මාර්ගයක් අපි සකස් කරන්නෙමු.

- සංචාරක අංශය පුරා අපි දේශීය ගුවන් සේවා ජාල ප්‍රවර්ධනය කරන්නෙමු. අපි කොළඹ, ගාල්ල, මහනුවර, හම්බන්තොට සහ තවත් සංචාරක කලාප හයක සංචාරක කේන්ද්‍රස්ථාන නිර්මාණය කරන්නෙමු.

- මෙම සංචාරක කේන්ද්‍රස්ථානවල සංචාරක පොලිස් කොට්ඨාස ශක්තිමත් කිරීම සහ පොලිස් නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව අවධාරණය කිරීම ද අපි සිදුකරන්නෙමු. තිරසර පරිසර සංචාරක ව්‍යාපාරය ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා පාරිසරික හා වනජීවී සංරක්ෂණ වැඩසටහන් සංවර්ධනය කරවනු ඇත.

- ජනප්‍රිය සංචාරක ගමනාන්තයන් සහිත සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම වැඩිහිටියන් සඳහා අපි විදේශ භාෂා පුහුණුව ලබා දෙන්නෙමු.

- ලොව පුරා ශ්‍රී ලංකා සන්නාමය ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා ටුවරිස්ම්, ශ්‍රී ලංකා ගුවන් සේවය සහ සිලෝන් තේ සමග සහයෝගයෙන් සිදු කෙරේ.





# සාධාරණ සමාජයක් ගොඩනැගීම

## නවීන ලෝකයක් සඳහා නවීන අධ්‍යාපනය

අනාගතවාදී හා පරිපූර්ණ අධ්‍යාපන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම වේගවත් ජාතික සංවර්ධනයක් සඳහා පූර්ව අවශ්‍යතාවයකි.

අපගේ ඉලක්කය වන්නේ:

- රාජ්‍ය, මිශ්‍ර හා වෙළඳපළ ආකෘති භාවිතා කරමින් සමස්ත, නිදහස් පෙර පාසල් අධ්‍යාපනය සහතික කිරීම සඳහා දශක ගණනාවකට පසු පළමු වරට නිදහස් අධ්‍යාපන ක්‍රමය පුළුල් කිරීම.
- නිසි ජාත්‍යන්තර මිනුම් දඬු මත පදනම්ව ඉංග්‍රීසි හා ගණිතය ඉගැන්වීමේ ජාතික වැඩසටහනක් මගින් සාමාන්‍ය පෙළ මට්ටමේදී ගණිතයේ 30% කට වඩා අසමත් වීමේ අනුපාතය සහ සාමාන්‍ය පෙළ මට්ටමේ දී ඉංග්‍රීසි භාෂාවෙන් 50% කට වඩා අසමත් වීමේ අනුපාතය ඉවත් කිරීමට උත්සාහ කිරීම.
- සියලුම උසස් පෙළ පාසල්වලට විද්‍යා හා තාක්ෂණ විෂය ධාරාවන් ලබා දෙන බවට සහතික වීම.
- සමස්ත උසස් අධ්‍යාපනය සහතික කිරීම සහ උසස් අධ්‍යාපනය රැකියා සඳහා යොමු කිරීම සහතික කිරීම.

**දිවයින පුරා ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම වෙනුවෙන් මුල් ළමාවිය අධ්‍යාපනය අධ්‍යාපන අමාත්‍යාංශයට යටතට ගෙනෙනු ඇත. පෙර පාසල්වල ගුරුවරුන්ට හා සහායකයින්ට රැකියා සුරක්ෂිතතාවය සහ වේතනය සහතික කෙරෙනු ඇත. ප්‍රජාවේ සහයෝගයෙන් පෙර පාසල් යන සියලුම දරුවන්ට දිවා ආහාරය ලබා දෙනු ඇත.**

අ.පො.ස. සාමාන්‍ය පෙළ මට්ටමේ ජාත්‍යන්තර මිනුම් දඬුවලට අනුකූලව සිසුන් පෙනී සිටින විෂයයන් සංඛ්‍යාව 6 දක්වා අඩු කෙරේ. 12 සහ 13 යන වසරවල දී විශ්ව විද්‍යාලයට ඇතුළුවීමට අකමැති අයට වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය සඳහා වන මිනුම් දඬුවලට අනුකූලව වෘත්තීය පුහුණු සහතිකයක් ලබා දීම සඳහා වෘත්තීය ධාරාවක් ඇතුළත් කරනු ඇත. විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය **(STEM)** අධ්‍යාපනය අප ශක්තිමත් කරන අතරම, සමස්ත පෞරුෂ සංවර්ධනය සඳහා සෞන්දර්යාත්මක අධ්‍යයනය සහ ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීමෙන් සමබර පාසල් අධ්‍යාපනයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාතික මට්ටමේ ගුරු පුහුණුවේ විෂමතා ඉවත් කරමින් **(STEM)** අධ්‍යාපනය සඳහා මානව හා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය දිවයින පුරා ශක්තිමත් කිරීමට අපි සහතික වන්නෙමු. මෑත කාලීන උපාධිධාරීන් සහ ගුරුවරුන් සඳහා විශේෂ පුහුණු හා දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් මගින්, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල පවතින ගුරුවරුන්ගේ හිඩැස් නිරාකරණය කිරීමෙන් ග්‍රාමීය පාසල්වල ඉංග්‍රීසි හා ගණිතය ඉගැන්වීමේ ප්‍රමිතිය වැඩිදියුණු කරනු ඇත. තත්ත්ව සහතික කිරීමේ නිර්ණායකයන්ට අනුකූලව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ උපාධි ප්‍රදානය කරන ආයතන දක්වා උසස් කරනු ලැබේ. ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි සඳහා නව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ තුනක් ද අපි ස්ථාපිත කරන්නෙමු. **(STEM)** ඉගැන්වීමේ ප්‍රමිතිය වැඩි දියුණු කිරීම සඳහා, ශක්‍යතා තක්සේරුවක් සමත් එම විෂයයන්හි ගුරුවරුන් දිරිමත් කරනු ලැබේ. ගුරු වෘත්තියේ බඳවා ගැනීම සහ තත්ත්ව සහතික කිරීම සඳහා වෛෂයික නිර්ණායක අපි ස්ථාපිත කරන්නෙමු.

# පාසැල්

පාසල්වලට ඇතුළත් කිරීමේ ක්‍රමය සියලුම දෙනාට විනිවිද පෙනෙන බව සහ එහි සාධාරණ හා අපක්ෂපාතී බව අපි සහතික කරමු. ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය හැකි මාර්ගගත ද්වාරයක් ඔස්සේ රටපුරා පාසල් පුරප්පාඩු නිරන්තරයෙන් යාවත්කාලීන වෙනු ඇත. මානව හා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ පහසුකම් නවීකරණය කිරීමට හදිසි පියවර ගත යුතු අතර එමගින් පළාත් නවයේ අධ්‍යාපන කළමනාකරණය සඳහා උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කිරීමට හැකි වේ.

**රජයේ අධ්‍යාපන ආයතනවල දෙමළ භාෂා කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ඌනතාවය නිවැරදි කරනු ඇත. දෙමළ බසින් උගන්වන ප්‍රධාන ගුරුවරුන් සඳහා පුහුණු අවස්ථා පුළුල් කෙරේ.**

පළාත් නවය සඳහා නිසි මානව හා භෞතික යටිතල පහසුකම් සහිත ජාතික පාසල් ස්ථාපිත කරන්නෙමු. හෝමාගම, මහරගම, කඩුවෙල, කෝට්ටේ, කොලොන්නාව, කැස්බෑව, මොරටුව, පිලියන්දල, මාලබේ, පන්නිපිටිය, අවිස්සාවේල්ල, පානදුර, කලුතර, වත්තල, ජා-ඇල, කටාන සහ මීගමුව ආදී තදාසන්න ප්‍රදේශවල ගුණාත්මක අධ්‍යාපනය සඳහා වන ඉල්ලුම සමග සාර්ථකව කටයුතු කිරීම වෙනුවෙන් අපි නව ජාතික පාසල් 30 ක් ස්ථාපිත කරන්නෙමු.

මූල්‍යමය දුෂ්කරතා හේතුවෙන් පාසල් හැරයාම අවම කිරීම සඳහා පාසල් නිල ඇඳුම් දෙකක්, සපත්තු යුගලයක් සහ නොමිලේ පෝෂ්‍යදායී දිවා ආහාරයක් අපි සිසුන්ට ලබා දෙන්නෙමු.

# උසස් අධ්‍යාපනය

ගෝලීය වශයෙන් තරගකාරී විශ්ව විද්‍යාල පද්ධතියක් ගොඩනැගීම අපගේ ඉලක්කයයි. තමන්ගේම තීරණ ගැනීමට සහ ඔවුන්ගේම දැක්ම සහ අනන්‍යතාව තීරණය කිරීමට විශ්ව විද්‍යාලවලට වැඩි ස්වාධීනත්වයක් ලැබෙනු ඇත. එසේ කිරීමෙන්, රජය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තනි විශ්ව විද්‍යාල අතර කාර්යභාරයන් සහ වගකීම් අපි නැවත අර්ථ දක්වන්නෙමු. 21 වන සියවසේ අවශ්‍යතා පිළිබිඹු වන පරිදි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ශක්තිමත් වන අතර එහි වරම පුළුල් වනු ඇත.

විශ්ව විද්‍යාල සහ ඔවුන් ඇතුළත්වන විෂයයන් තෝරා ගැනීමේදී සිසුන්ට තෝරාගැනීමේ අවස්ථා වැඩි ප්‍රමාණයක් ලැබෙනු ඇත. ශ්‍රී ලංකාව විදේශීය සිසුන් ආකර්ෂණය කර ගත හැකි කලාපයේ ජාත්‍යන්තර අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් කරන්නෙමු.

සැමට උසස් අධ්‍යාපනය සහතික කිරීම සහ සිසුන්ට තේරීමේ අවස්ථා වැඩි කිරීම සඳහා, අපි වැඩි උසස් අධ්‍යාපන ආයතන ගණනක් ආවරණය වන පරිදි 'මගේ අනාගතය' පොලී රහිත උසස් අධ්‍යාපන ණය යෝජනා ක්‍රමය පුළුල් කර එහි ණය සීමාව රු. 800,000 සිට රු. මිලියන 1.6 දක්වා දෙගුණයක් කෙරෙනු ඇත.

විභාග ප්‍රතිඵල නිකුත් වූ වහාම සිසුන්ට බඳවා ගැනීමේ පටිපාටියට අයදුම් කිරීමට හැකිවන පරිදි අපි ණය අයදුම් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කරන්නෙමු.

අධ්‍යාපනවේදී උපාධිය සඳහා සිසුන් 5,000 ක් දක්වා වාර්ෂික බඳවා ගැනීම පුළුල් කරන අතර එය පාසල් පද්ධතියේ ගුරුවරුන්ගේ හිඟය පියවා ගැනීමට ද උපකාරී වනු ඇත.

උසස් පෙළ විභාගයෙන් විශිෂ්ටත්වයට පත්වන සිසුන්ට විදේශ අධ්‍යාපනය ලබා දීම අරමුණු කරගත් අධ්‍යාපන විශිෂ්ටත්වය සඳහා සැලසුම් කරන ලද ශිෂ්‍යත්වය කඩිනමින් ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් ඔවුන්ට රට සංවර්ධනය කිරීම සඳහා ආපසු රටට පැමිණීමට හැකි වේ.

සෑම පළාතකම නව ලාභ නොලබන තාක්ෂණික විශ්ව විද්‍යාල හෝ විශ්ව විද්‍යාල පිහිටුවීම දිරිමත් කරන්නෙමු.



# නිදහස් සෞඛ්‍ය සේවය ක්‍රියාත්මක කිරීම

**ප්‍රීතිමත්, සෞඛ්‍ය සම්පන්න පුද්ගලයින් සඳහා පරිපූර්ණ සෞඛ්‍යාරක්ෂාව**

සියලුම පුරවැසියන්ට නොමිලයේ සෞඛ්‍යාරක්ෂක පහසුකම් පිළිබඳ ආකෘතිය ඓතිහාසිකව සාර්ථක වී තිබේ. කෙසේ වෙතත් නාගරික රෝහල්වලට වෙනස්ව ග්‍රාමීය රෝහල්වල සෞඛ්‍ය සේවා මට්ටමේ විෂමතා පවතී. මහජන සෞඛ්‍ය අංශයේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ පුහුණුව අප දෙගුණයක් කර ඇතත්, නගරවලින් දුරස්ථව සිටින විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟයක් තවමත් පවතී. මීට අමතරව, තාක්ෂණය සහ රෝග විනිශ්චය කිරීමේ උපකරණ පුළුල් ලෙස ලබා ගත නොහැකිය.

රෝගීන්ට සහ තුවාල ලැබූවන්ට ඔවුන්ගේ ප්‍රදේශවලම නවීන පහසුකම් සැපයීම සඳහා මෙම ගැටලුවලට විසඳුම් සෙවීම වෙනුවෙන් අප විසින් සියලුම දිස්ත්‍රික් රෝහල්, මූලික රෝහල් සහ ග්‍රාමීය රෝහල් වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම සිදුකරන්නෙමු. අපගේ ඉලක්කය වන්නේ පැය 24 ක බාහිර රෝගී සේවාවක් කරා යාමයි. එහි පළමු පියවර ලෙස අපි බාහිර රෝගී සේවාව සවස 4 සිට රාත්‍රී 10 දක්වා දීර්ඝකර ඇත්තෙමු.

සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාශයකම පවුල් සායන විවෘත කර රෝගීන්ගේ විද්‍යුත් වාර්තා හඳුන්වා දීමෙන් අපි පවුල් වෛද්‍ය සංකල්පය නැවත ස්ථාපිත කරන්නෙමු.

ශ්‍රී ලංකාවේ ජනගහනය වැඩිවන වැඩිහිටි පුරවැසියන් සඳහා වෛද්‍ය සේවා සැපයීම වෙනුවෙන් සෑම රෝහලකටම විශේෂ වයෝවෘද්ධ සත්කාර ඒකක එකතු කරනු ලැබේ.

ඒ හා සමානව, රෝහල් වාට්ටුවල බර අඩු කර ගැනීම සඳහාත්, ආබාධ සහිත පුද්ගලයන්, අසාධ්‍ය රෝගීන් සහ වැඩිහිටියන්ගේ අවශ්‍යතා සඳහා වඩා හොඳ රැකවරණයක් ලබා ගැනීම සඳහාත්, නිවාස වෙත යන සහ නිවාස පදනම් කරගත් සත්කාර මහජන සෞඛ්‍ය පද්ධතියට හඳුන්වා දෙනු ඇත.

**රටේ වෛද්‍යවරුන්ගේ හිඟය පියවීම සඳහා සිසුන් රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම 1,300 සිට 2,000 දක්වා අප විසින් වැඩි කර තිබේ.**

වෛද්‍ය ප්‍රතිකාරවල වෙනස්වන තත්ත්වයන් සපුරාලීම සඳහා නව කාණ්ඩයේ කාර්ය මණ්ඩලයන් හඳුන්වා දීම සහ පරිපූරක වෘත්තීන් ද ඇතුළුව සියලුම සෞඛ්‍ය අංශ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා බඳවා ගැනීම ද අප විසින් වේගවත් කරනු ඇත. මනෝ සමාජීය සහයෝගය වැනි සායනික නොවන සේවාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත. පුහුණු උපදේශකයින් සමග උපදේශන සේවාවක් ද අපි නිර්මාණය කරන්නෙමු.

තවත් හදිසි අවස්ථා වාහන සහ පුහුණු පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩලයේ වැඩි කිරීමත් සමග සුවසැරිය ගිලන්රථ සේවාව තවදුරටත් පුළුල් කෙරේ. විශාල ප්‍රදේශ ආවරණය වන පරිදි සුවසැරිය ඒකක ක්‍රියාත්මක වන දිවයින පුරා උපපොළ ජාලයක් ඉදිකිරීම ද අපි විසින් ආරම්භ කරන්නෙමු.

නිදන්ගත වකුගඩු රෝග, දියවැඩියාව, තරබාරුකම සහ හෘද රෝග වැනි බෝ නොවන රෝගවලට එරෙහිව සටන් කිරීම සඳහා අපි වැඩි වැඩියෙන් ආයෝජනය කරන්නෙමු.

**වයස අවුරුදු 35 ට වැඩි සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුටම නොමිලේ වාර්ෂික වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීම අයිතියක් වනු ඇත.**

එවැනි පූර්වභංග පරීක්ෂණ රෝග කල්තියා හඳුනා ගැනීමට උපකාරී වේ. මෙම ක්‍රමයට අමතරව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම රුධිර පීඩනය සහ රුධිරයේ සීනි පරීක්ෂා කිරීමේ කුටි ස්ථාපනය කෙරේ.

පාසල් ආහාර වැඩසටහන හරහා අපි කුඩා දරුවන් සඳහා ආවරණය පුළුල් කිරීම සහ පෝෂණ සේවාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සිදු කරන්නෙමු. ළමා රෝග පිළිබඳ මෑත කාලීන විද්‍යාත්මක සොයාගැනීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් දරු ප්‍රසූතියට පෙර සහ පශ්චාත් මව්වරුන්ට පෝෂණය වැඩි දියුණු කරන්නෙමු.

## ගර්භනී කාන්තාවන් සඳහා වන රජයේ දීමනාව මසකට රුපියල් 20,000 සිට රුපියල් 30,000 දක්වා වැඩි කෙරේ.

ශ්‍රී ලංකාවේ සහ ගෝලීය වශයෙන් දේශීය වෛද්‍ය විද්‍යාව ප්‍රවර්ධනය කිරීම සඳහා අපි නව වැඩපිළිවෙළක් දියත් කරන්නෙමු. ආයුර්වේදයේ අනෙකුත් කලාප සහ වෙනත් විකල්ප ඖෂධ තවදුරටත් සංවර්ධනය කරන්නෙමු. මේ තුළින් පිළිගත් සෞඛ්‍ය අංශ සේවකයින් ලෙස විකල්ප වෛද්‍ය වෘත්තිකයින්ට විධිමත් තත්ත්වය ලබා දෙනු ඇත.



# සැමට නිවහනක්

**2025 වන විට නිවාස හිමි සමාජයක් නිර්මාණය කිරීම**

නිවසක් හිමි කර ගැනීම සියලු පවුල්වල සිහිනයයි. කෙසේ වෙතත්, නාගරික මධ්‍යස්ථානවල නිවාස මධ්‍යම හා කම්කරු පංතියට දැරිය නොහැකි වන අතර, දිනෙන් දින ව්‍යාප්ත වන නගරවල මායිම්වල තවදුරටත් ජීවත් වීමට ඔවුන්ට බල කෙරී තිබේ. අපි සියලුම ශ්‍රී ලාංකිකයන් නිවාස හිමියන් බවට පත් කරන්නෙමු.

"සැමට නිවහනක්'' පිළිබඳ දැක්ම යටතේ, අපි මධ්‍යම ආදායම්ලාභී සහ අඩු ආදායම්ලාභී අයට නිවාස සඳහා ප්‍රවේශය පුළුල් කරන්නෙමු. ගම්උදාව නිවාස යෝජනා ක්‍රමය අප ග්‍රාමීය ප්‍රදේශවලට ව්‍යාප්ත කරන්නෙමු. නූතන යුගයේ අවශ්‍යතා පිළිබිඹු වන පරිදි පශ්චාත් සුනාමි නිවාස යෝජනා ක්‍රම ඇතුළු දැනට පවතින නිවාස යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කෙරේ. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් තුළින් නාගරික ප්‍රදේශවල මධ්‍යම ආදායම් ලබන නිවාස අපි ක්‍රමිකව පුළුල් කරන්නෙමු. හරිත නිවාස පිළිබඳ සංකල්පය මෙම නාගරික යෝජනා ක්‍රම තුළ දී දිරිමත් කරනු ඇත.

2025 වන විට සියලු නිවාස සඳහා ආරක්ෂිත පානීය ජලය ලබා දෙන අතර, විශේෂයෙන් වැවිලි අංශයේ නිසි සනීපාරක්ෂක පද්ධති සඳහා ප්‍රවේශය සහතික කරන්නෙමු. අපගේ නාගරික හා ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘති නිවාස ඉදිවීමේ වේගවත් වැඩිවීමත් සමග පුළුල් වන අතර, සියලු පුරවැසියන් බස්, දුම්රිය හා විදුලි සංදේශ හරහා ආරක්ෂිතව සම්බන්ධ වී ඇති බව සහතික කරනු ඇත.

## නිදහස් ඉඩම

බලපත්‍රලාභී ඉඩම් අත්පත් කර ගන්නා පුරවැසියන් එම ඉඩම ස්ථිර ලෙස අත්පත් කරගෙන සිටිය ද, ආයෝජනය කිරීම, ණය ගැනීම හෝ සංවර්ධනය කිරීම සඳහා තම ඉඩම සම්පූර්ණයෙන්ම භාවිතා කිරීම බලපත්‍ර ක්‍රමය විසින් සීමා කරනු ලැබේ. අපි ඔවුන්ට සින්නක්කර ඔප්පු ඉඩම් හිමිකම ලබා දෙන්නෙමු.

## ඉඩම් ලියාපදිංචි කිරීම

වර්තමානයේ දී, අඩුවෙන් පරිහරණය කරන ලද හෝ භාවිතයට නොගත් රජයේ ඉඩම් හඳුනා ගැනීමට ක්‍රමවේදයක් රජයට නොමැත. ඩිජිටල්කරණය කරන ලද ඉඩම් ලියාපදිංචි කිරීමක් අපි සකස් කරන්නෙමු. එය වඩාත් ඵලදායී ඉඩම් භාවිතයක් තීරණය කරනු ඇති අතර රජය බදු දී ඇති ඉඩම්වලින් ද උපරිම කුලිය ලබා ගනු ඇත. මෙම පහසු සහ ප්‍රවේශ විය හැකි ලැයිස්තුව මගින් පුරවැසියන්ට ලියාපදිංචි තොරතුරු පරීක්ෂා කිරීමට සහ ලේඛනවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට ඉඩ සැලසේ. මෙම ප්‍රතිසංස්කරණ මගින් ව්‍යාපාර කටයුතු සඳහා වන විවෘතභාවයට අනුව රටවල් ශ්‍රේණිගත කරන ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකයේ ශ්‍රී ලංකාවේ ස්ථාවරත්වය වැඩිදියුණු කරනු ඇත.



**ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට සීමාවක් නැත**
එක්ව ගමන යමු.



# ජාතික ඒකීයභාවය සහ සමානාත්මතාවය

**එක් මවකගේ දරුවන්**

## භාෂා ප්‍රතිපත්තිය

අපගේ භාෂා ප්‍රතිපත්තිය පදනම් වන්නේ සැබැවින්ම ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් මත වන අතර එහිදී සෑම කෙනෙකුටම මව් බසෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පොලීසිය සහ වෙනත් රජයේ ආයතන ඇතුළු රජය හා එහි නියෝජිතයන් සමග සම්බන්ධ විය හැකි ය. මෙය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා රජයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු හා බඳවා ගැනීමේ ප්‍රතිපත්ති යාවත්කාලීන කෙරේ. සියලුම රජයේ ලියකියවිලි, පෝරම සහ සන්නිවේදන අංග, සියලුම සංඥා පුවරු සහ දැන්වීම් භාෂා තුනෙන්ම හෝ විකල්ප භාෂාවලින් ලබා ගත හැකිය. මෙම ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම සඳහාත්, පරිවර්තන නිවැරදි බවට සහතික වීමටත්, කිසිවකුට වරදක් නොකිරීමටත්, අපේ මව් භාෂාවල ගෞරවය ආරක්ෂා කිරීමටත් අපි ශ්‍රී ලංකා පරිවර්තන සේවාවක් නිර්මාණය කරන්නෙමු.

සබැඳි භාෂා ඉගැන්වීම වැඩිදියුණු කරනු ඇති අතර විෂය නිර්දේශය සංශෝධනය මගින් අප සැබවින්ම ත්‍රිභාෂා ජාතියක් බවට පත්වනු ඇත. දෙපාර්තමේන්තු සහ ආයතනවල රජයේ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජනවාර්ගික විවිධත්වය පිළිබිඹු කරනු ඇත.

අන්තර් වාර්ගික අවබෝධය සහ සංවාදය ශක්තිමත් කිරීම වෙනුවෙන් සිංහල සාහිත්‍ය පොත් දෙමළ භාෂාවටත් දෙමළ සාහිත්‍ය පොත් සිංහල භාෂාවටත් පරිවර්තනය කෙරේ.

## ප්‍රතිසන්ධානය සහ ප්‍රතිසංස්කරණය

ප්‍රජා මට්ටමින් ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා අපි සියලු මට්ටම්වල පාලන තන්ත්‍රයන්ට අදාළ වන 2017 ප්‍රතිසන්ධානය සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කර යාවත්කාලීන කරන්නෙමු. විවිධත්වයේ සාරධර්ම ප්‍රවර්ධනය කිරීම, ආතතීන් කළමනාකරණය කිරීම, අනාගත ප්‍රචණ්ඩ ගැටුම් අවදානම අවම කිරීම, සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම, ඉදිරි දැක්ම සහිත ප්‍රතිසන්ධාන කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ බහුත්වවාදී සහ සියල්ලන් ඇතුළත් සමාජයක් ගොඩනැගීම සඳහා අපි දැනටමත් පිහිටුවා ඇති දිස්ත්‍රික් ප්‍රතිසන්ධාන කමිටු භාවිතා කරන්නෙමු. තීරණ ගත යුත්තේ සේවය ලබා දෙන පුරවැසියන් අතර ජීවත්වන සහ වැඩ කරන අය විසින්ම බව අපි තරයේම විශ්වාස කරන්නෙමු.

උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා ජනාධිපති කාර්ය සාධක බලකා දෙකක් විශේෂයෙන් පත් කරනු ලැබේ. ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශවලින් ඇතිවිය හැකි ඉඩම් ආරවුල් වසරක් ඇතුළත විසඳීම සඳහා සැලැස්මක් සහිතව අපි ජනාධිපති කොමිසමක් පත් කරන්නෙමු. මහවැලි, වන සංරක්ෂණ හා වනජීවී දෙපාර්තමේන්තු වැනි අදාළ දෙපාර්තමේන්තු විසින් යුද්ධයට පෙර ජනතාව විසින් අත්පත් කරගෙන සිටි ඉඩම් ඔවුන් නැවත පදිංචි කරවීම සඳහා නිදහස් කරනු ඇත.

## නිවාස හා ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සහ අවශ්‍ය අනෙකුත් ආධාර ඇතුළුව දීර්ඝ කාලීනව අවතැන් වීමෙන් පීඩා විඳින අය නැවත පදිංචි කරවීම අපි සම්පූර්ණ කරන්නෙමු.

සියලුම සරණාගතයින් සහ දිග්ගැස්සුණු අවතැන්වීම්වලින් පීඩා විඳින අය නැවත පැමිණීමට ධෛර්යමත් කර එයට සහය වනු ඇති අතර, එම ක්‍රියාවලියට පහසුකම් සැලසීමට අවශ්‍ය සහය ලබා දෙන්නෙමු. මන්නාරමෙහි නවීන තාක්ෂණික අධ්‍යාපන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමත් සමග ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශවල තාක්ෂණික අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ. ආයෝජන සඳහා දැනට පවත්නා සහනවලට අමතරව, ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශවල නැවත ගොඩනැඟීම සහ නව සංවර්ධනය සඳහා තවදුරටත් නිශ්චිත සහන ලබා දෙනු ඇත.

## කිසිදු චෝදනාවකින් තොරව දීර්ඝ කාලයක් රඳවාගෙන සිටින පුද්ගලයින් නිදහස් කරනු ලැබේ.

අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය, උතුරේ සහ දකුණේ අතුරුදහන් වූවන් සොයා ගැනීමට දරන උත්සාහයට අපි පූර්ණ සහාය ලබා දෙන්නෙමු. යුද්ධයෙන් පීඩාවට පත් වූවන්ගේ ගැටලු විසඳීමට සහ සුදුසු අවස්ථාවලදී වන්දි ගෙවීමට අපි හානිපූරණ කාර්යාලයට උපදෙස් දෙන්නෙමු. ආරක්ෂාව සහ ආරක්ෂක අරමුණු සඳහා අවශ්‍ය නොවන සියලුම ඉඩම් ප්‍රමාදයකින් තොරව අයිතිකරුවන්ට හෝ සිවිල් බලධාරීන්ට ආපසු ලබා දෙනු ලැබේ.

අනාගතයේදී ජනවාර්ගික ප්‍රජාවන් අතර සමගිය හා ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා, පාසල් විෂය මාලාව, විශේෂයෙන් ඉතිහාසය විෂයය, සමාලෝචනය කරනු ඇත. එසේ කරනු ලබන්නේ එය විවිධ ප්‍රජාවන්ගේ සැබෑ ඉතිහාසය පිළිබිඹු කරන බව සහතික කිරීම සඳහා ය. අවශ්‍ය අවස්ථාවන්හිදී, අපගේ සාමූහික ඉතිහාසයේ පුද්ගලයන්, කණ්ඩායම්, පාර්ශ්ව සහ වෙනත් ආයතනවල දැක්ම සිසුන්ට අවබෝධ කර ගත හැකි වන පරිදි විෂය මාලාව සංශෝධනය කෙරේ. ඉදිරියට යන විට, විවිධත්වයෙන් එක්සත් වී ඇති අපගේ බහු සංස්කෘතික, බහු-ආගමික හා බහු වාර්ගික සමාජය සහ සමානාත්මතාව සහ යුක්තිය සඳහා වූ කැපවීම නව පාසල් විසින් පිළිබිඹු කරනු ඇත.

# ශ්‍රී ලංකාවේ අධ්‍යාත්මය

## අපගේ අධ්‍යාත්මික යහපැවැත්ම සහ සංස්කෘතිය ආරක්ෂා කිරීම

අධ්‍යාත්මික ජාතියක් යනු සාමකාමී ජාතියකි. ශ්‍රී ලංකාව බොහෝ සාමකාමී ආගම්වලින් ආශිර්වාද ලද්දකි. අප විසින් ගොඩනගනු ලබන නව ශ්‍රී ලංකාව විසින් සෑම ආගමකම යහපත් ගුණාංග අගය කරන අතර අපගේ අන්තර් ආගමික හා අන්තර් සංස්කෘතික සම්බන්ධතා වර්ධනය කර ගනිමින් සෙසු පුරවැසියන් අවබෝධ කර ගැනීම හා ඇගයීම කරනු ඇත. බුද්ධාගමට ප්‍රමුඛස්ථානය හිමි වන අතර, සියලු ආගම් සහ විශ්වාසයන් එක හා සමානව සලකනු ලැබේ. සියලුම ආගම් සහ විශ්වාසයන් ව්‍යවස්ථානුකූලව සමාන අයිතිවාසිකම් සහිත වන අතර වෙනස් කොට සැලකීමෙන් නිදහස් වනු ඇත.

පූජනීය ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව පිළිබඳ රටපුරා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමෙන් ඉවසීම සහ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා ආගමික ආයතන තවදුරටත් ශක්තිමත් කිරීම හා පෝෂණය කිරීම සහතික කරවනු ඇත. අතීතයේ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූ සියලුම ආගමික ආයතන හා පූජනීය ස්ථාන අලුත්වැඩියා කර නැවත විවෘත කරන්නෙමු. මධ්‍යස්ථ ආගමික කතිකාවේ පුනර්ජීවනය සඳහා අපි අවකාශයන් නිර්මාණය කරන්නෙමු. අන්තර් ආගමික අධ්‍යාපනය පාසල් විෂය මාලාවේ විෂයක් බව අපි තරයේ කියා සිටිමු. පාසැල්වල පවතින ආගමික ගුරුවරුන්ගේ හිඟය විසඳනු ඇත.

මහා සංඝරත්නයේ උපදෙස් පරිදි බුද්ධාගම පුනර්ජීවනය කිරීම සඳහා ධර්ම සංගායනාවක් සඳහා අවශ්‍ය සියලු පහසුකම් අපි ලබා දෙන්නෙමු. ජාතික බෞද්ධ අධ්‍යයන ආයතනයක් සහ ථේරවාද බෞද්ධ ලේඛනාගාරයක් සහ පුස්තකාලයක් ස්ථාපිත කෙරේ. සංඝයා වහන්සේ සඳහා බුදු පුත් සුරක්ෂා සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත කර කාන්තා පූජ්‍ය පක්ෂයට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම වලක්වන ගැටලු වහාම විසඳන්නෙමු.

## කලාවන්ට සහය වීම

වීදි කලාවන් හා නාට්‍ය, ඡායාරූපකරණය, සංගීතය සහ සංස්කෘතික උත්සව සැමරීම සඳහා පුරවැසියන් හට අති නවීන ගැලරි සහ පොදු අවකාශයන් අප විසින් නිර්මාණය කරන්නෙමු. අපි කලාකරුවන්ගේ බුද්ධිමය දේපල අයිතිවාසිකම් ආරක්ෂා කරන අතර ඔවුන්ට සහාය දැක්වීම සඳහා නිසි හිමිකම් ක්‍රමයක් ඇති බව සහතික කරන්නෙමු. දායක විශ්‍රාම වැටුප් ක්‍රමයකට සම්බන්ධ වීමට කලාකරුවන්ට සුදුසුකම් ලැබේ.

අන්තර්ජාතික හා කලාපීය සිනමා උළෙලවල් සඳහා චිත්‍රපට නිෂ්පාදකයින්ට තම නිර්මාණ ඉදිරිපත් කිරීමට සහ කලා උළෙලවල් සඳහා කලාකරුවන්ට සහාය වීමට අපි අරමුදලක් පිහිටුවන්නෙමු.

විවිධ සංස්කෘතීන් හා සාරධර්ම පිළිබඳ සංවාද හුවමාරු කර ගැනීමටත්, ඉවසිලිවන්ත හා සියල්ලන් ඇතුළත් සමාජයක් සඳහා ඔවුන්ගේ දර්ශනයන් සාක්ෂාත් කර ගැනීමටත් සමාජයේ අවකාශයන් නිර්මාණය කිරීම සඳහා නාට්‍ය හා රංග කලාව තුළින් චිත්තවේගාත්මක බුද්ධිය හා සන්නිවේදන කුසලතා වර්ධනය කිරීමට තරුණ නායකයින්ට සහාය වනු ඇත.

ශ්‍රී ලාංකික පොත් සඳහා ඇති අයිතිය මිලට ගෙන, දැනුම ප්‍රජාතන්ත්‍රීයකරණයට සහ කලාකරුවන්ට සහය වන නිදහස් ජාතික ඩිජිටල් පුස්තකාලයක් අපි නිර්මාණය කරන්නෙමු. සිංහල හා දෙමළ භාෂාවෙන් පුළුල් දැනුමක් ඇති කිරීම සඳහා අපි විදේශීය භාෂා පොත් සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කරන්නෙමු. ශ්‍රී ලංකා චිත්‍රපට ඩිජිටල් ආකාරයෙන් ජාතික චිත්‍රපට ලේඛනාගාරයක සංරක්ෂණය කිරීමට අපි පියවර ගන්නෙමු.

# පනස් දෙකේ ප්‍රතිශතය

## ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අභිමානය සහ සමාන අවස්ථා

අපගේ ඉතිහාසය, ආර්ථිකය, සංස්කෘතිය සහ සමාජය සඳහා ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ දායකත්වය අතිමහත්ය. එහෙත්, ශ්‍රී ලංකාවේ කාන්තාවෝ අදටත් සමාන පුරවැසියන් ලෙස සැලකීම වෙනුවෙන් සටන් කරති. අපගේ කාන්තා පුරවැසියන් ගෞරවාන්විතව, බියෙන් තොරව හා දේශපාලන හා ආර්ථික සවිබල ගැන්වීමෙන් යුතුව ජීවත් වන බවට අපි සහතික වන්නෙමු. එම ගමනේ කාන්තාවන් සමාන හවුල්කරුවන් ලෙස සිටීම හැර ශ්‍රී ලංකාවට අනාගතයක් තිබිය නොහැකිය. ඒ සඳහා අපි කාන්තා ප්‍රඥප්තිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්නෙමු. ඊට අමතරව, අපේ තරුණ තරුණියන් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා තරුණ කොමිසම පත් කළ ආකාරයටම, අපේ රටේ කාන්තාවන් මුහුණ දෙන ගැටලු බොහොමයක් හඳුනාගෙන විසඳීමට කාන්තා කොමිසමක් පත් කරන්නෙමු.

## ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය

- **ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට ආරක්ෂිත පරිසරයක් ලබා දීම සඳහා, ස්ත්‍රී දූෂණ හා ලිංගික අපයෝජන සම්බන්ධයෙන් ඉක්මන් දඬුවම් ලබා දීම සහතික කරන අතර නැවත වැරදි සිදුකරන වැරදිකරුවන්ට වඩාත් දැඩි දඬුවම් ලබා දෙන්නෙමු.**

- **අපි වෛවාහක දූෂණය අපරාධ වරදක් බවට පත්කර එම ගැටලුව පිළිබඳ දැනුවත්භාවය ඇති කරන්නෙමු.**

- **කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට සිදුවන වීදි හිංසනයන්ට එරෙහිව නඩු පැවරීම සඳහා ලිංගික හිරිහැර පිළිබඳ නීතිමය අර්ථ දැක්වීම අපි පැහැදිලි කරන්නෙමු.**

- **පොදු ප්‍රවාහනයන් තුළ දී සිදුවන ලිංගික අපයෝජන ඇතුළු ලිංගික හිරිහැරයන් පිළිබඳව පමණක් විමර්ශනය කිරීම හා වැළැක්වීම සඳහා අපි කැපවූ ජාතික පොලිස් ඒකකයක් පිහිටුවන්නෙමු.**

- **කාන්තාවන්ගේ උපකාරක දුරකථනය සඳහා වෙන් කර ඇති සම්පත් දිනකට පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම මගින්, අපයෝජන හා හිරිහැරයන්ට ගොදුරු වූවන්ට වහාම ප්‍රතිචාර දැක්වීම සඳහා පොලිස් නිලධාරීන් සම්බන්ධ කිරීමටත් හැකි වනු ඇත.**

- **1938 දුරකථන උපකාරක මාර්ගය ප්‍රසිද්ධ කිරීම සඳහා අපි අරමුදල් ආයෝජනය කරන්නෙමු.**

- **එවිට රට පුරා සිටින කාන්තාවන් ඒ පිළිබඳව දැනුවත් වේ. අපයෝජනයට ලක්වූ කාන්තාවන් සඳහා නවාතැන් හා ආරක්ෂිත නිවාස ජාලය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම මගින් නීති ආධාර, වෛද්‍ය පහසුකම් සහ මනෝ සමාජීය උපදේශන සමග ඒකාබද්ධ අර්බුද මධ්‍යස්ථාන බවට ඒවා පත් කරන්නෙමු.**

- **ජනමාධ්‍ය තුළ කාන්තාවන් ධනාත්මක ලෙස නිරූපණය කිරීමට සහය වීම සඳහා අපි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කරන්නෙමු. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය මාධ්‍ය විසින් වාර්තා කරන ආකාරය ද මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වේ.**

## සහභාගීත්වය බලාත්මක කිරීම

**පළාත් පාලන ආයතනවල කාන්තාවන් සඳහා 25%ක අනිවාර්ය කෝටාවක් වෙන් කළ ආකාරයට ම, අපි ජාතික ලැයිස්තුවේ ද ඒ හා සමාන 25% කෝටාවක් වෙන් කරන්නෙමු. ඉන්පසු අපි පළාත් සභාවල හා සමස්ත පාර්ලිමේන්තුවේ ද කාන්තාවන් සඳහා 25% ක කෝටාවක් වෙන් කරන්නෙමු.**

කාන්තාවන් ආර්ථිකයට පූර්ණ ලෙස සහභාගි වීම වළක්වන නීතිවලින් පටන් ගෙන සියලු වෙනස් කොට සැලකීමේ නීති අපි සංශෝධනය කරන්නෙමු. සමාන වැඩ සඳහා සමාන වැටුප් නීති සම්පාදනය කෙරේ.

කාන්තා මූලික පවුල් සඳහා අපි විශේෂ සහය ලබා දෙන අතර කාන්තාවන් අතර, විශේෂයෙන් යුද වැන්දඹුවන් අතර ඉහළ ණයගැතිභාවයේ ගැටලුව විසඳනු ඇත. අතුරු සහන පියවරක් ලෙස, සූරාකෑමේ පොලී අනුපාත යටතේ කාන්තාවන්ට ලබා දෙන ක්ෂුද්‍ර මූල්‍ය ණය කපා හරිනු ලැබේ.

## මව්වරුන් සහ ඔවුන්ගේ දරුවන්

ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණය අවසන් කිරීමේ අරමුණින් අපි ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවන්නෙමු. මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්, පෝෂණ ඌනතාවයෙන් පෙළෙන ගර්භනී කාන්තාවන් සහ මව්කිරි දෙන මව්වරුන්ට ත්‍රිපෝෂ අතිරේක ආහාරය නොමිලේ ලැබෙනු ඇත.

වැඩ කරන මව්වරුන් සඳහා අපි රජයේ ආයතනවල ළමා ආරක්ෂණ ඒකක පිහිටුවනු ඇති අතර, කාර්යාල හා කර්මාන්තශාලාවලද එසේ කිරීමට පෞද්ගලික අංශය දිරිමත් කරන්නෙමු. 2019 අයවැයෙන් දක්වා ඇති පරිදි මාතෘ නිවාඩු ආවරණය කිරීම සඳහා කාන්තා කාර්ය මණ්ඩලයට ස්ථාවර සම-වැටුප් යෝජනා ක්‍රම ලබා දීමට පෞද්ගලික අංශය දිරිමත් කරනු ඇත.



# කෘතඥතාවයෙන් පිරි සමාජයක් හා සමාජ සුරක්ෂාව

## සාකල්‍ය අභිමානය සුරැකීම

## රණ විරුවන් ගේ අභිමානය සඳහා ප්‍රඥප්තියක්

රණවිරු නම් නාම පදය දේශපාලන මෙවලමක් බවට පත්ව ඇත. එය සියලුම සේවාමුක්ත ගැහැණු හා පිරිමි සෙබළුන්, ඔවුන් සෘජුව අපගේ මවුබිම වෙනුවෙන් මෙහෙයුම් වලට සහභාගිවී කැපකිරීම් කිරීම හෝ යුධයෙන් පසුව සේවාවට එකතු වීම නොතකා පුළුල්ව හා ලිහිල්ව යෙදේ. මේ යෙදුම සැබවින්ම මෙහෙයුම් වලට කැපකිරීම් කර ඒ නිසා දැනට කායික හා මානසික පීඩාවට පත්ව සිටින අයට අරුත් ගැන්වෙන්නේ සුළුවෙනි. ඔවුන්ගේ කැපකිරීම ඉමහත්ය. අප රණවිරුවන්ගේ සේවාව අගය කළ යුතු යැයි පුළුල්ව පැතිරුණු පිළිගැනීමක් ඇතත් එය හමුදා සෙබළුන් හා ඔවුන්ගේ පවුල් වලට අවශ්‍ය සත්‍ය පිළිගැනීම හා සාධාරණ සැලකීම ලෙස අරුත් ගන්වා ගැනීමට සමත්ව නැත. අපි ශ්‍රී ලංකාවේ මහජනයා, ආණ්ඩුව, හමුදා සේවයේ නියුතු හා නියුතුව සිටි සියලු දෙනාද ඔවුන්ගේ පවුල්ද අතරේ ප්‍රඥප්තියක් කෙටුම්පත් කරන්නෙමු.

**රණවිරු කටයුතු දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට ජාතික අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කෙරෙනු ඇත. එම දෙපාර්තමේන්තුව සියලුම රණවිරුවන් හා ඔවුන්ගේ පවුල් වලට, සේවාස්ථයා අතුරුදහන් වූ, ආබාධිත හෝ මියගිය බවට සීමා නොවී සියලු දෙනාට සේවා සපයනු ඇත. රණවිරු කටයුතු දෙපාර්තමේන්තුව රණවිරුවන්ට හා ඔවුන්ගේ පවුල් වලට යුධ බිමේ කායික හානි සඳහා පමණක් නොව මානසික බලපෑම් සඳහා ද මනෝ සමාජ සත්කාර සපයයි.**

## වෙනස්-හැකියා ඇති (differently-abled) ජන කොටස්

ආබාධිත ජන කොටස් අන්තර්ග්‍රහණය කර ඔවුන් සඳහා සංවර්ධන සැලසුමක් සකස් කර දියත් කිරීම හා අධීක්ෂණය සඳහා ජාතික ආබාධිත අන්තර්ග්‍රහණ කොමිසමක් ස්ථාපනය කෙරෙනු ඇත. ඒ කොමිසම වෙනස් හැකියා සහිත පුද්ගලයින්ට ඇති රැකියා අවස්ථා වර්ධනය පිණිස, මාසික මූල්‍ය ප්‍රතිපාදන සැපයීම, ආධාරක තාක්ෂණ සේවාවන්, විශේෂ වෘත්තීය පුහුණු මගින් ඔවුන්ව බලසතු කරයි. රාජ්‍ය සේවයේ 3% රැකියා කෝටාවක් ඔවුන්ට වෙන් කෙරෙන අතර පුද්ගලික අංශයට ඒ ප්‍රතිපත්තියේ ක්‍රියාත්මක කිරීම සඳහා සහය සැපයෙනු ඇත.

අපි වෙනස් හැකියා ඇති දරුවන්ට ඔවුන් කැමති පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව උදාකරන අයිතිවාසිකම් නීතිගත කරන්නෙමු. අපි එලෙසම වඩා අවබෝධයෙන් යුතු සමාජයක් ඇති කරනු පිණිස ගුරුවරුන් හා සිසුන් සඳහා, ඔවුන් සංවේදී පුද්ගලයන් බවට පත් කරන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නෙමු.

මාධ්‍ය පරිභෝජනය වඩාත් අන්තර්ග්‍රාහී වීම සඳහා රූපවාහිනී නාලිකාවන්ට සංඥා භාෂාවන් හා උප සිරැසි වැනි ක්‍රමවේද භාවිතා කිරීමට අවශ්‍ය වෙනු ඇත.

## දුගී බව තුරන් කිරීම

අපි සමෘද්ධි හා ජනසවිය වැඩසටහන් දෙකෙහි යහපත්ම මූලිකාංග, සමෘද්ධි දීමනා අගයත්, ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාවත් වැඩි කරමින් ඒකාබද්ධ කරන්නෙමු. මේ යෝජනාක්‍රමය දැඩි නීති වලට යටත් කෙරෙන්නේ සත්‍ය ලෙස ඒ ප්‍රතිපාදන අවශ්‍ය අයට පමණක් ලැබෙන බව තහවුරු කිරීම සඳහාය. ප්‍රතිලාභීන් ගේ බැංකු ගිණුම් වලට පමණක් ඒවා සෘජුව යොමු කරන්නේ දූෂණය හා නාස්තිය වළක්වා ගැනීම පිණිසයි.

# ජනගහන වෙනස්කම් හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පහසුකම්, පෝෂණය හා සාමාන්‍ය ජීවන තත්ත්වය දියුණු වීම නිසා අපගේ පුරවැසියන් දීර්ඝායු ලබා ඇති අතර, එනිසාම වියපත් වන ජනගහනය විශේෂයෙන් රැකබලා ගැනීමේ හා සුභසාධනයේ අවශ්‍යතා ඇතිවේ.

**අපි ගොවිතැන, ධීවර, සිප්කැමි-කර්මාන්ත සේවකයින්, ගෘහ සේවකයින්, සංක්‍රමණික සේවකයින්, හා කලාකරුවන් වැනි අවිධිමත් ක්ෂේත්‍රයන් හි රැකියා නියුක්තිකයින් සඳහා දායකත්ව විශ්‍රාම වැටුපක් හඳුන්වා දෙන්නෙමු.**

අප ජ්‍යෙෂ්ඨ පුරවැසි කටයුතු දෙපාර්තමේන්තුවක් ස්ථාපනය කරන්නේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මූල්‍ය ආයතන හා සෞඛ්‍ය උපස්ථාන කටයුතු කර ගැනීමේදී ඇතිවන විශේෂ ගැටලු විසඳා ගැනීම සඳහාය. වැඩිහිටියන්ට ඇතිවන හුදෙකලා බව හා පාළුවට දෙපාර්තමේන්තුව සමාජමය සහාය ලබා දෙනු ඇත. එලෙසම ඔවුන්ට තම ස්වාධීනත්වය පවත්වාගෙන යාමට හා අංකිත උපකරණ හා තාක්ෂණය හසුරුවා ගැනීමට අවශ්‍ය පුහුණුව ලබා දෙනු ඇත. අපි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත සාධාරණ මිලට සේවාවන් හා උපස්ථානය සැපයීමට පුද්ගලික අංශයට අනුග්‍රහය දක්වන්නෙමු. අපි වෘද්ධ උපස්ථානයට විශේෂඥ හැකියාව ඇතිවන පරිදි හෙදියන් රජයේ සෞඛ්‍ය සේවයට බඳවාගෙන පුහුණු කරන්නෙමු.

**ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව රුපියල් 2000 සිට රුපියල් 3000 දක්වා වැඩි කෙරෙනු ඇත.**

**අපි පොදු ප්‍රවාහන සේවාවන්ගේ කාඩ් ගෙවුම්පත් ක්‍රමය ස්ථාපනය කළ පසුව, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශේෂ අඩු මිල ගාස්තු ක්‍රම හඳුන්වාදෙන්නෙමු. අපි ප්‍රධාන වෘත්තික ආයතන සඳහා උපදේශකයින්, පුහුණුකරුවන්, කථිකාචාර්යවරුන් ලෙස වැඩ කරන විශ්‍රාමික වෘත්තිකයන්ගේ බලකායක් නිර්මාණය කරන්නෙමු.**



# සංක්‍රමික ශ්‍රමිකයන්

ශ්‍රී ලංකාවේ සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයෝ, පසුගිය දශක කීපයේ ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණ නොකෙරුණු බැරෑරුම් ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙමින් විදේශයන්හි සේවය කරති. සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයන් අති බහුතරයක් තවමත් මැද පෙරදිග අඩු නිපුණතා රැකියා ප්‍රවර්ගයන්හි සේවයේ නියුක්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන, අඩු වැටුප්, අඩු දීමනා හා ඔවුන්ගේ ආරක්ෂක අවශ්‍යතාවන් ඇතුළු විසඳිය යුතු ගැටලු රැසක් ඇත.

එම ප්‍රශ්න සමහරක් විසඳීමට අපි සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ ගැටලු ඇති සෑම තානාපති හෝ කොන්සියුලර් කාර්යාලයකටම නීති උපදේශකයකු පත් කිරීමට වගබලා ගන්නෙමු. අපි සංක්‍රමණික කාන්තාවන් සඳහා පැය 24 පුරා ඇමතිය හැකි හදිසි ඇමතුම් අංකයක් ස්ථාපනය කරන්නෙමු.

අපි විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා නවීන, විනිවිදභාවයෙන් යුතු ඇගයුම් ලකුණු ක්‍රමයක් හා යාමන ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමු.

අපි අනේවාසික විදේශ මුදල් ගිණුම් වලින් සියලු ආදායම් බදු ඉවත් කරන්නෙමු.

විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි සියලු සංක්‍රමණික ශ්‍රමිකයෝ සිහින මාළිගා ණය ක්‍රමය යටතේ 75% පොලී සහනාධාරයක් ඇතිව නිවාස ණය ලබා ගැනීමට සුදුසුකම් ලබති.

අපි සංක්‍රමණික ශ්‍රමිකයින්ට දායකත්ව විශ්‍රාම වැටුපක් හඳුන්වා දී, ඔවුන්ගේ රේගු බදු සහන තීරුව වැඩිකර ඔවුන්ට පිට රටක සිට ඡන්දය ප්‍රකාශ කිරීමට ඉඩ සලස්වන්නෙමු.



# කඳුරට ජනතාව

කඳුරට දෙමළ ජනතාව ශ්‍රී ලංකා ජනප්‍රජාවේ අඛණ්ඩ කොටසක් බව අනුයාත රජයයන් විසින් නිලවශයෙන් පිළිගෙන ඇතත්, ඔවුන්ට ඇති පහසුකම්, අවකාශ, හා අවස්ථා සම්බන්ධයෙන් ඔවුන් තවමත් සිටින්නේ පසුපසිනි. අපි ඔවුන්ගේ ගෞරවය, සංවර්ධනය, සමානාත්මතාවය හා ආර්ථික සුරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය විශේෂ පියවර ගන්නෙමු. අපි ඔවුන්ගේ ඉඩම් හා නිවාස ගැටලුව විසඳන්නෙමු. එලෙසම අප කඳුකර දෙමළ ජනයාගේ අධ්‍යාපන හා සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගන්නේ ඔවුනට කර්මාන්ත හා සේවා අංශයන්ගේ නවීන රැකියාවන් වෙත සංක්‍රමණය වීමට අවශ්‍ය සහයෝගය ලබා දෙමිනි.

කඳුරට ජනයා නගා සිටුවීම සඳහා වන ජනාධිපති කාර්යය සාධක බලකායක් වහාම සථාපිත කෙරෙනු ඇත.

අපි කඳුරට දෙමළ ජනයාගේ පවුලකට පර්චස් හතක පූර්ණ බලය සහිත ඉඩම් කොටසක් හා නිවසක් ලැබෙන වැඩ පිළිවෙලක් දියත් කරන්නෙමු. ඒ ක්‍රියාවලිය සඳහා ඇති පරිපාලනමය බාධාවන් ඉවත් කෙරෙනු ඇත. තමන්ගේම ඉඩමක, නිවසක් අහිමි අයට හිසට සෙවණක් ඉදිකෙරෙනු ඇත.

කඳුරට ගොවි ජනයාට නිශ්චිත ආදායම් මාර්ගයක් සහතික කිරීම සඳහා අපි පුද්ගලික හා රාජ්‍ය ව්‍යවසායයන්, බාහිර ගොවියන් (out grower) සමග ඇති කරගන්නා හවුල්කාරී වැඩසටහන් මගින් ගොවි නිෂ්පාදන නිතිපතා මිල දී ගන්නා වැඩපිළිවෙලක් සකස් කරන්නෙමු. අපි වතු කම්කරුවන් සඳහා රුපියල් 1500ක ආදායමක් ලබා දීම වෙත ළඟා විය යුතු වන්නෙමු.

අපි කඳුරට ප්‍රජාවන් වෙත රටේ අනෙකුත් ප්‍රදේශවල ඇති මහජන සෞඛ්‍ය සේවාවන් හා සමාන සේවා ලැබෙන බව තහවුරු කරන්නෙමු. අපි වතුකරයේ ජාතික පාසල් දහයක් ස්ථාපනය කරන්නෙමු,

එමෙන්ම උසස් අධ්‍යාපනය සඳහා කඳුරට විශ්ව විද්‍යාලයයක් ද ආරම්භ කරන්නෙමු. කඳුරට දෙමළ ජනයාට රටේ සෑම තැනකම ඇති අධ්‍යාපන හා පුහුණු ආයතන වල සාධාරණ අවස්ථා වැඩිවෙන අන්දමට අවධාරණ ක්‍රියාමාර්ගයක් (affirmative action) සකස්කොට ක්‍රියාත්මක කෙරෙනු ඇත. අපි එහි යෞවන-යෞවනියන් උදෙසා කර්මාන්ත පුර හා ඒවාට ඈඳුනු වෘත්තීය පුහුණු ආයතන නිර්මාණය කරන්නෙමු.

# තාරුණ්‍යයේ පරිවර්තනයක්

අපි ශ්‍රී ලංකාවේ තරුණ පුරවැසියන් හැකි ඉක්මණින් රාජ්‍ය පාලනය සඳහා සහභාගි කරවා ගැනීමට කැපවී සිටින්නෙමු. එනිසා අපි තේමාත්මක හා විසඳුම් මත පදනම් වුනු තරුණ කණ්ඩායම් සඳහා පළාත් වශයෙන් තරුණ සභාවන් ආයතනගත කරන්නෙමු. ඒවා සෘජුව පාර්ලිමේන්තුව හා පාර්ලිමේන්තු කමිටු හා සම්බන්ධ කෙරෙනු ඇත. අපි අධ්‍යාපන, රැකියා, ප්‍රතිසංධානය හා පාරිසරික රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා විවිධත්වයෙන් යුතු තරුණ උපදේශනය තහවුරු කෙරෙන නියෝජන ක්‍රමයක් ආණ්ඩුවේ සියලු මට්ටම් වල ආයතනගත කරන්නෙමු. තරුණ ප්‍රඥප්තියේ ඇති සියලුම නිර්දේශ ක්‍රියාත්මක කරන්නෙමු.

අපි අපගේ රටේ තරුණ පෙළ සතුව ඉල්ලුමට සරිලන ඩිජිටල් නවෘකරණයන් මෙහෙයවීමට ඇති වගකීම පිළිගන්නෙමු. අපි ඒ ඉල්ලුමට ගැලපෙන ලෙස සැපයීමට සැලසුම් කරන්නෙමු, එවිට ශ්‍රී ලංකාවේ ඩිජිටල්කරණය නිත්‍ය සංවර්ධනයකට යොමුවෙනු ඇත.

**ඩිජිටල් යටිතල පහසුකම් හා වැඩි වශයෙන් සම්බන්ධ වීමට, පොදුවේ අන්තර්ජාලය භාවිතයට, අපි ජංගම දත්ත හා ජංගම බ්‍රෝඩ් බෑන්ඩ් වියදම 10%කින් පහත හෙලන්නෙමු.**

වත්මන් ආණ්ඩුවේ රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා සැපයීමේ වැඩපිළිවෙල නොකඩවා කරගෙන යනු ඇත. යෞවන-යෞවනියන් ගේ රැකියා අවස්ථා පුළුල් වන අන්දමට සන්නිවේදන කුසලතා, භාෂා කුසලතා, තාක්ෂණික කුසලතා හා ජීවන (මෘදු) කුසලතා පුහුණු පවත්වන විශිෂ්ටත්වයේ මධ්‍යස්ථාන රටේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් පාසාම ඉදිකෙරෙනු ඇත. අපි රැකියා විරහිත උපාධිධාරීන්ට තොරතුරු තාක්ෂණ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය හා දැනුම් ක්‍රියාවලි බාහිර-ප්‍රභව ගත කිරීම (outsourcing) සඳහා ඔවුනට නැවත පුහුණු වීමේ අවස්ථා උදාකිරීමේ ආධුනිකත්ව වැඩසටහනක් ආරම්භ කරන්නෙමු. ඒ උදෙසා රාජ්‍ය-පුද්ගලික හවුල්කාරීත්ව මාදිලියක් නිර්මාණය කෙරේ. අපි විශ්ව විද්‍යාල හා වෘත්තීය අධ්‍යාපන විෂය මාලාවන්ට ව්‍යවසායකත්ව විෂයය හඳුන්වා දෙන්නෙමු.

ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන, බෝට්ටු තැනීම, සුව-සංචාරක හා සුළු අපනයන භෝග සඳහා අගය එකතු කිරීම කේන්ද්‍රීය කරගත් අපනයන අංශයේ රැකියා 100,000ක් ඇතිකිරීමට රුපියල් බිලියන 15ක අරමුදලක් ස්ථාපනය කරන්නෙමු. එම යෝජනාක්‍රමය කාන්තාවන් ආර්ථික කටයුතු කෙරේ උනන්දු කිරීම සඳහා ද යොදා ගනු ඇත.

ශ්‍රී ලංකාවේ වාර්ගික විවිධත්වය සලකමින් පොලිසියේ හා ත්‍රිවිධ හමුදාවේ වාර්ගික අසමතුළිතතා විසඳීම පිණිස බඳවා ගැනීමේ මෙහෙයුමක් දියත් කෙරෙනු ඇත. සුළු ජාතික කණ්ඩායම් වලින් පොලිසියේ හා ත්‍රිවිධ හමුදාවන්ගේ රැකියාවන් වෙත ඇදී ඒම දිරිමත් කරනු පිණිස විශේෂ බඳවා ගැනීමේ වැඩසටහන් රටපුරා ක්‍රියාත්මක කෙරෙනු ඇත. රටේ විවිධ තැන් වල සිටින තරුණ තරුණියන්ට නගර හා ගම් අතරේ ද ප්‍රජාවන් අතරේ ද ඇති විවිධත්වය හඳුනාගැනීම හා එකිනෙකා

අවබෝධ කරගැනීම පහසු කෙරෙන නිවාසවල නැවතීමේ තරුණ හුවමාරු වැඩසටහනක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

අපි නගර මධ්‍යස්ථාන වෙත රැකියා සඳහා පැමිණෙන යෞවන-යෞවනියන් ගේ ආරක්ෂාව හා යහ පැවැත්ම තහවුරු කිරීමට පුද්ගලික අංශය හා එකතුව, ගමනාගමනය පහසු ස්ථානයන් හි සුවපහසු, ආරක්ෂිත, අඩු වියදම් නේවාසිකාගාර ඉදි කරන්නෙමු. එලෙසම අපි අධ්‍යාපන ආයතනයන්හි සියලු ආකාරයේ නවකවධ හා හිරිහැර කිරීම් (bullying) නිමා කරන්නෙමු.

අපි විද්‍යාත්මක හා ඉන්ජිනේරු නව්‍යකරණයන් ව්‍යවහාරයට ගන්නා නව තාක්ෂණික ව්‍යාපාර සඳහා බලපවත්වන බදු 5% දක්වා පහත හෙලන්නෙමු. එමගින් යෞවන-යෞවනියන් අප රටේ සංවර්ධනය ඉදිරි පිම්මක් වෙත යොමු කෙරෙන නිෂ්පාදන හා සේවාවන් නිර්මාණය කිරීමට දිරිමත් කෙරෙනු ඇත.

තමාගේම ව්‍යාපාර හා ව්‍යවසායන් ඇරඹීමට අපේක්ෂා කරන යොවුන් ජනයාට ඇති ආයතනික බාධාවන් තුරන් කරන අන්දමින් ඒ ක්‍රියාවලියන් මූල ප්‍රවාහ ගත කිරීමට අපි පියවර ගන්නෙමු. ප්‍රධාන රාජ්‍ය ආයතන වල නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා සේවා කවුන්ටරයක් (Startup Desk) බැගින් ස්ථාපනය කර, තරුණ පෙළ මතුකරන ප්‍රශ්න, ගැටලු, ඉල්ලීම් හා අවශ්‍යතා ආමන්ත්‍රණය සඳහා කැපවුණු හා පුහුණුව ලත් නිලධාරීන් පත් කෙරෙනු ඇත. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායක අධිකාරියක් පිහිටුවා, ගැනුම්කරුවන්, වෙළඳපල හා මූල්‍ය කටයුතු හා තරුණ අය සම්බන්ධ කෙරෙන සියලු සේවා සම්පාදන නියෝජිතායතන ඒ වටා සංවිධානය කරනු ඇත.



# ශ්‍රී ලංකා ක්‍රීඩා සන්නාමය

අපි විසි වසරක් සඳහා වන ක්‍රීඩා ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන්නෙමු, ස්වාධීන ක්‍රීඩා කොමිසමක් පත් කිරීමෙන් සමස්ත ක්‍රීඩා ක්ෂේත්‍රය ම වෘත්තියමය තත්ත්වයකට ගෙන එන්නෙමු.

අපි එක් එක් දිස්ත්‍රික්කයක් සඳහා වෙන වෙනම සම්පත් යොදවන සාධාරණ ක්‍රියාවලියක් ඇති කරන්නෙමු. එවිට ක්‍රීඩාවේ සංවර්ධනයට සෑහෙන තරම් සම්පත් ලැබෙනු ඇත. අපි ජාතික ක්‍රීඩා ආයතනයේ පළාත් ශාඛා ආරම්භ කරන්නෙමු. එමෙන්ම අපි ක්‍රීඩා උපකරණ වල මිල අඩු කිරීමට පියවර ගන්නෙමු.

විශේෂ අධ්‍යයනයක් මගින් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය ළඟා කරගත හැකි වැඩිම විභවය සහිත ප්‍රධාන ක්‍රීඩාවන් අප විසින් හඳුනා ගැනෙනු ඇත. ඒ සියල්ලට ජාත්‍යන්තර ක්‍රීඩාවේ ශූරයන් වීම දක්වා අවශ්‍ය වන සියලු පහසුකම්, සම්පත් හා පිටුබලය ලබා දෙනු ඇත. අපි පුහුණුව, මනෝ තත්ත්වාරෝපණය (mental conditioning), පෝෂණය හා පුහුණුකරුවන් ජාත්‍යන්තර ප්‍රමිතිය දක්වා ගෙන වීම ගැන විශේෂ අවධානය යොමු කරන්නෙමු. ක්‍රීඩා ශූරියන්ට හා ශූරයන්ට ජාත්‍යන්තර ක්‍රීඩා උළෙල සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට අවශ්‍ය වියදම් රජය විසින් දරනු ඇත.





# ක්‍රියාත්මක කිරීම
## බලගැන්වීම හා අධීක්ෂණය

ජාතික සංවර්ධනය පිළිබඳ නව ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටවනු ඇත. එමගින් සියලු අමාත්‍යාංශ සඳහා ඇති කාර්යසාධක දර්ශක සකස් කර ඒ ඒ අමාත්‍යාංශයේ කාර්යය සාධනය සුපරීක්ෂණයට ලක් කෙරේ. රටේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල එම දර්ශක වලට අනුකූලව වාර්තා කිරීම මගින් ජනාධිපති හා රටේ පරිපාලන ඒකක අතර මහජන සේවා සම්පාදනය හා ජාතික සංවර්ධනය සඳහා සෘජු සම්බන්ධයක් ඇති කෙරේ.

සමහර රජයේ ආයතන, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී විශේෂ කාර්යභාරයක් උසුලයි. ඒ ආයතන නිසි කාර්යමණ්ඩල සහිත වීම හා නවීකරණයත්, එලෙසම ප්‍රමාදයකින් තොරව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සහතික කළ යුතුය.

අපි නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, අමාත්‍ය මණ්ඩල කාර්යාලයය හා පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටු වෙත විශේෂ අවධානය යොමු කරන්නෙමු. තවද අපි ප්‍රධාන නියාමන ආයතන කෙරේ වැඩි බරක් තබා කටයුතු කරන්නෙමු. මධ්‍යම පරිසර අධිකාරිය, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව එයින් දෙකකි.

# ක්‍රියාත්මක කිරීම

## බලගැන්වීම හා අධීක්ෂණය

1. කෞශල්‍යතාන්ත්‍රික හා කාර්යක්ෂම මහජන සේවයක් තහවුරු කිරීමේදී, සමහර රාජ්‍යපාලන ක්‍රියාවලීන් හා සමහර මානව සම්පත් කළමනාකරණ නියෝජිතායතන ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය වේ.

2. අපි අනෙකුත් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල යහ පරිචයන් මත පදනම්ව, පරිපාලන හා මූල්‍ය රෙගුලාසි මෙන්ම ආයතන සංග්‍රහයත් නවීකරණය කිරීමෙන් එය අරඹන්නෙමු.

3. අපි නව පොදු මුදල් කළමනාකරණ පනතක් ගෙන එන්නෙමු.

4. අපි රාජ්‍ය සේවා කොමිසම, ජාතික ප්‍රසම්පාදන කොමිසම, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම, විභාග දෙපාර්තමේන්තුව නවීකරණය කර බලසතුකර, ඒවාට ඉහළ හැකියාවෙන් යුතු පුද්ගලයින් පත් කරන්නෙමු.

5. සෑම ඇමතිවරයෙකුම හා අමාත්‍යංශ ලේකම් වරයෙකුම සඳහා වාර්ෂිකව ප්‍රමාණාත්මක හා ගුණාත්මක කාර්ය සාධක දර්ශක සැකසේ.

6. අපි රජයේ සේවාවන්ගේ තීරණ ගැනීම පහසු කිරීම හා මූලප්‍රවාහකරණය සඳහා උපදේශන සේවාවන් ලබා ගන්නෙමු.

7. අපි අමාත්‍ය මණ්ඩල වාර්තා සකස් කිරීමේදී ඇතුළත් විය යුතු හා ඇතුළත් නොවිය යුතු කරුණු පැහැදිලි කිරීම පිණිස මාර්ගෝපදේශන සකස් කරන්නෙමු.

8. අපි ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති, ජාතික ආරක්ෂාව හා විදේශ කටයුතු පිළිබඳ ස්ථාවර අමාත්‍ය මණ්ඩල අනුකමිටු පත් කරන්නෙමු.

9. සෑම සතියකම අමාත්‍යාංශ ලේකම්වරුන් හා අදාළ අනුකමිටු අතර රැස්වීම් පැවැත්වෙනු ඇත.

10. එලෙසම අපි අමාත්‍ය මණ්ඩල කාර්යාලයයේ, ජනාධිපතිවරයාට වාර්තා කරන, අධීක්ෂණ හා ඇගයුම් ඒකකයක් ස්ථාපනය කරන්නෙමු. එය රාජ්‍ය සේවකයින්ගෙන් හා පුද්ගලික අංශයේ වෘත්තිකයින්ගෙන් සමන්විත වනු ඇත.

නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
புதிய ஜனநாயக முன்னணி
NEW DEMOCRATIC FRONT